CHRIST'S METHOD ALONE

INTEGRATED EVANGELISM LIFESTYLE

''අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය''
නමැති මෙම පොත් පිංච

කාන්තා මෙහෙයට සියවසක් පිරීම
නිමිත්තෙන් ඔබට ඉදිරිපත් කරන තිළිණයකි.

Reaching families for Jesus

Years 1919-2019

Adventist Family Ministries

# ''අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය''



# අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය

## පටුන


හැඳින්වීම ..... v

යාච්ඤා පොත ..... 1

ප්‍රීතිමත් පවුලක රහස ..... 4

දෙවියන්වහන්සේ යහපත්කම පිළිබිඹු කරන පවුල් ..... 6

ඒදන් උයන, පළමු නිවස ..... 8

ආබ්‍රහම් දේව අණට කීකරු විය ..... 10

දුෂ්කර කාලයේදී ජීවත් වූ දිරිමත් කාන්තාවෝ ..... 12

ඔබගේ විවාහය වර්ධනය කරගන්නේ කෙසේද? ..... 14

දෙමවුපියන්ට ගෞරව කිරීම වෙනුවෙන් පොරොන්දු වූ දීර්ඝායු ..... 16

ප්‍රීතිමත් පවුලකට යේසුස්වහන්සේගේ වට්ටෝරුව ..... 18

රෙබෙකා - දේව දිව්‍යමය තේරීම ..... 20

යෝබ් ඔහුගේ දරුවන් වෙනුවෙන් පූජා ඔප්පු කළේය ..... 22

නිවසේ ප්‍රේමය ..... 24

දරුවන්ට අධ්‍යාපනය ලබා දීම ..... 26

නිවසේ දේවස්ථානය ..... 28

විවාහ අසාර්ථක වන්නේ ඇයි? ..... 30

පවුලේ යාච්ඤාව නොසලකා හරිනු එපා ..... 32

වින්දාවූ වැරදි ක්‍රියා ගැන ප්‍රේමය නොතැවෙයි ..... 34

නිවසෙහි සාමකාමී බව ..... 36

නිවසෙහි කතා බහ (සාකච්ඡා) ..... 38

අතරමං වූ දරුවෝ හෝ අතරමං වූ දෙමවුපියෝ ..... 40

ඔවුන් ඔබගේ නිවසේදී දුටුවේ කුමක්ද? ..... 42

දරුවන් වෙනුවෙන් කාලය වෙන් කිරීම ..... 44

ප්‍රේමයේ ගීතය ..... 46

ප්‍රේමයෙන් පිරි ස්ථානය - නිවස ..... 48

දෙවියන්වහන්සේගේ නිවස ..... 50

කිතුනු පවුලක බලපෑම ..... 52

පවුල්වලට දේව වචනය වන්නේ බයිබලයයි ..... 54

ස්වර්ගයේ මහෝත්තමයාණන් තුළ රැඳී සිටීම ..... 56

අදේව දෘෂ්ටිකයන්ට ප්‍රතික්ෂේප නොකළ හැකි තර්කයක් ..... 58

හදවත් එක්සත් කළහැක්කේ කෙසේද? ..... 60

ප්‍රීතිමත් පවුලක ප්‍රතිපත්ති ..... 62

ප්‍රේම කිරීම - කුමන අවස්ථාවේදීද, කෙසේද ..... 64

# අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය

## හැඳින්වීම

ජීවිතයේ පොර බැදීම් සහ සිත් වේදනා වලට මුහුණ දීමට අවශ්‍ය ධනාත්මක, දිරි ගන්වන වාතාවරණයක් පවුල මගින් ඉතා මැනවින් සපයනු ලැබේ. එමගින් අපට ක්‍රිස්තුස්වහන්සේ සමග සබඳතාවය තුළ ප්‍රීතිමත් සහ පරිපූර්ණ ජීවිතයක් ගත කිරීමට උපකාරී වන සහනදායී ඇගයීම් ක්‍රමයක්ද සපයනු ලැබේ.

කෙසේවෙතත්, සත්‍යතාවය වන්නේ ධනාත්මක, ඇදහිලිවන්ත අත්දැකීමක් සෑම පවුලක් තුළින්ම නොලැබෙන බවයි. අද පවුල සෑම පැත්තකින්ම අභියෝගවලට මුහුණ දෙයි. දෛනික ජීවිතයේදී ඇතිවන මානසික පීඩාව, ලොව පුරා වර්ධනය වෙමින් පවතින හිංසාව. මාධ්‍ය වල බලපෑම සහ සාම්ප්‍රදායික වටිනාකම් අතහැර දැමීම වැනි කරුණු ඒ අතර වේ. අතීතයේදී පවුලේ සාමාජිකයින්ගේ සහ සමාජයේ මධ්‍යස්ථානය වූයේ පවුලයි. අද බොහෝ පවුල් එම සම්බන්ධතාවය ගොඩ නැගීමට පොර බදිමින් සිටිති.

එබැවින් පවුලක් කිතුනු පවුලක් විසින් ධනාත්මක ජීවන රටාවක් හැඩ ගැස්වීම සහ ඉගැන්වීම් හේතුකොටගෙන ඔවුන් වටා සිටින අයගේ ජීවිත මහත් වූ පෝෂණයක් ලබනු ඇත. ක්‍රියාශීලී, සැලකිලිමත් කිතුනු පවුලක් විසින් ඇති කළ හැකි ශ්‍රේෂ්ඨ සාර්ථකත්වය එලන් වයිට් මහත්මිය පහත සඳහන් ආකාරයට විස්තර කරයි.

''යහපත් ක්‍රමානුකූල ක්‍රිස්තියානි පවුලක් ක්‍රිස්තියානි ආගම පිළිබඳ බලවත් තර්කයකි. එනම් මිථ්‍යා දෘෂ්ටිකයින්ට සහ අදේව දෘෂ්ටිකයින්ට ප්‍රතික්ෂේප කළ නොහැකි තර්කයකි. දරුවන් කෙරෙහි සාර්ථක බලපෑමක් ඇති කරන පවුලකට බලපාන යම් බලයක් ඇති බවත්, ආබ්‍රහම්ගේ දෙවියන්වහන්සේ ඔවුන් සමග සිටින බවත් සියළුදෙනාටම දැකිය හැකිය. උගත් කිතුනු පවුලක් තුළ නිවැරදි ආගමික මිශ්‍රණයක් තිබුණේ නම් ඔවුන් යහපත උදෙසා මහත් වූ බලපෑමක් ඇති කරනු ඇත. ඔවුහු ඇත්තෙන්ම 'ලෝකයේ ආලෝකය වන්නෝය' (The Adventist Home, p. 36).

'අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය,' සකස් කරන ලද්දේ සෙවන්ත්-ඩේ ඇඩ්වෙන්ටිස්ට් මහා සභාව මගිනි.

මෙය එවැන්ජලිස්ත ජීවන රටාව ගැබ් වූ සාරාංශයකි. පුද්ගලික ආත්ම පිබිදීමේ ක්‍රියාවලියකි. යාච්ඤා පොත සහ දිනපතා නමස්කාර මගින් ඔබගේ දැනටමත් පවත්වමින් තිබෙන නමස්කාරයට නව පණක් ලබාදීම හෝ අළුතින්ම ආරම්භ කරන නමස්කාරයට උපකාරී වනු ඇත.

# අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය

1. යාච්ඤා පොතෙහි ඔබගේ මිතුරන්, අසල්වැසියන් සහ ඇඩ්වෙන්ටිස්ට් නොවන පවුල් සඳහා යාච්ඤා කිරීමට එම නම් සඳහන් කිරීම සඳහා ලැයිස්තුවක් සකස් කර ඇත.

2. මෙම දිනපතා නමස්කාරය දවස් 31ක් පුරා පවතින අතර, උගත් දෙය මෙනෙහි කිරීමටත්, ප්‍රධාන කරුණු ඉදිරිපත් කිරීම සහ සාකච්ඡාවට මගපෙන්වීම සඳහා ප්‍රශ්නද සකස් කර ඇත. මින් බලාපොරොත්තු වන්නේ දින 31ක් අවසානයේදී ඔබගේ පවුල එක්ව දිනපතා ඒවා සතුටින් භුක්ති විඳීම සහ ඉන් පසු, ඔබ දිනපතා බයිබල් පාඩම් සහ යාච්ඤාව සඳහා එක්රැස්වේය යන්නයි.

**සැ: යු: -** ඔබගේ පවුලත් සමග මෙම පාඩම් ඉගෙනීමෙන් පසු ඔබට ඒවා සතිපතා කණ්ඩායම් සමග බෙදාගත හැකිය.

# අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය

## යාච්ඤා පොත

මෙම පොතෙහි ඔබ යාච්ඤා කිරීමට බලාපොරොත්තු වන අසල් වැසියන්ගේ, මිතුරන්ගේ සහ ඥාතීන්ගේ නම් සඳහන් කරන මෙන් අපි ඔබව දිරිගන්වමු. දරුවන්ගේ නම්ද ඇතුළත් කරන්න. ඔවුන් එකිනෙකා ගැන නම් වශයෙන් යාච්ඤා කරන්න. ඔබගේ අසල්වැසියන් දෙතුන් දෙනෙකුගෙන් ආරම්භ කොට පසුව තව නම් අඩංගු කළ හැකිය.

ඔබගේ අසල්වැසියන් සමග ආලෝකය බෙදා ගැනීමට ඔබගේ පවුලට මග පෙන්වන මෙන් දෙවියන් වහන්සේගෙන් ඉල්ලන්න. ස්වාමීන්වහන්සේ කැමති ආකාරයෙන් ඔබව පවුලක් හෝ පවුල් වෙත යොමු කරන මෙන් ඉල්ලන්න. මේ අය හමුවීමේදී ධෛර්යය සහ යටහත් පහත් බව ඔබ තුළ ඇති කරන මෙන් ඉල්ලන්න. යම් අවස්ථාවකදී ලැයිස්තුවේ සඳහන් යම් යම් පුද්ගලයින් වෙත ගොස් ඔවුන් මුහුණ දෙන යම් ගැටළුවක් සඳහා යාච්ඤා කරන මෙන් ඔබට ආරාධනා ලැබෙනු ඇත. සෑම පවුලකටම ප්‍රේම කරන ස්වාමීන්වහන්සේ වෙත එම පවුල් ඔසවා තබන්න.

''කිසිම දෙයක් ගැන කරදර නොවන්න. එහෙත් සියල්ල කිරීමේදී ස්තුති දීම සමග යාච්ඤාවෙන්ද කන්නලව්වෙන්ද නුඹලාගේ ඉල්ලීම් දෙවියන්වහන්සේට දන්වාපල්ලා. එවිට කිසි නුවණකින් දැනගත නොහැකි වූ දෙවියන්වහන්සේගේ සමාදානය ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ නුඹලාගේ සිත්ද සිතිවිලිද ආරක්ෂා කරනවා ඇත (පිලිප්පි 4:6,7).

''ඉල්ලාපල්ලා. එවිට නුඹලාට දෙනු ලැබේ. සොයාපල්ලා. එවිට නුඹලාට සම්බවේ. තට්ටු කරපල්ලා. එවිට නුඹලාට දොර හරිනු ලැබේ. මක්නිසාද ඉල්ලන්නාවූ සියල්ලන්ට ලැබේ. සොයන්නාට සම්බ වේ. තට්ටු කරන්නාට දොර හරිනු ලැබේ'' (මතෙව් 7:7,8).

| ඉල්ලූ දිනය | යාච්ඤා ඉල්ලීම | පිළිතුරු ලැබුණු දිනය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

# අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය

| ඉල්ලූ දිනය | යාච්ඤා ඉල්ලීම | පිළිතුරු ලැබුණු දිනය |
|---|---|---|
| | | |

# අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය

| ඉල්ලූ දිනය | යාච්ඤා ඉල්ලීම | පිළිතුරු ලැබුණු දිනය |
|---|---|---|

# අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය

## 1 ප්‍රීතිමත් නිවසක රහස

''යේසුස්වහන්සේත් උන්වහන්සේගේ ගෝලයෝත් සරණ මංගල්‍යයට කැඳවනු ලැබුවෝය.'' (යොහන් 2:2).

සෑම මනුෂ්‍යයෙකුගේම සිහිනය වන්නේ ශක්තිමත්, ප්‍රීතිමත් නිවසක්ය. සමහරු ශක්තිමත් විවාහයක් ගොඩනැගීමට මහත් සේ වෙහෙස වෙති. අපගේ ජීවිතයේ විශේෂ අවස්ථා භුක්ති විඳිය හැකි නියම පුද්ගලයා යයි සිතන අයෙකු අපි තෝරා ගනිමු. අපි සැලසුම් කළ ආකාරයෙන්ම සිදුවිය යුතු යයි අපි සිතමු. මක්නිසාද අපගේ ප්‍රීතිය අවදානම් සහිත බැවිනි. එහෙත් ක්‍රම ක්‍රමයෙන් බොහෝ විවාහක අය ඔවුන්ගේ මාලිගා බිඳ වැටෙනු දැක ඇත. සිහිනයක් ලෙස දුටු ඒ අවස්ථා ඉක්මණින්ම අසත්‍යයක් බවට පත්වෙන අතර, එමගින් ඔවුන් විනාශ කරන අතර ඔවුන්ට රිදවා, කිසිදිනක සුව නොකළ හැකි තුවාල බවට පත්වෙයි.

ගලීලයේ කානා දේශයේදී පැවති විවාහ මංගල්‍යය තුළින් අපට සාර්ථක විවාහයක රහස් තුනක් සොයාගත හැකිය. පළමු රහස දෙවැනි පාඨයේ ඉතා පැහැදිලිය. එහි මෙසේ සඳහන්වේ. ''යේසුස්වහන්සේත් ...... සරණ මංගල්‍යයට කැඳවනු ලැබුවෝය. බොහෝ යුවලවල් විවාහ මංගල්‍යයේ සියළුම කරුණු ගැන අනවශ්‍ය ලෙස කරදර වන අතර ඔවුන්ට මූලික කරුණු අමතක වේ. එනම් ඔවුන්ගේ සරණ මංගල්‍යයේ කොටස්කරුවෙකු වීමට යේසුස්වහන්සේට ආරාධනා කිරීමයි. ලෝකයේ ඉතාම හොඳ ඥාති සම්බන්ධතාවලදී තිදෙනෙක් සම්බන්ධ විය යුතුය. දෙවියන්වහන්සේ, ස්වාමි පුරුෂයා සහ භාර්යාවය. අපගේ විවාහ මංගල්‍යයේදී යේසුස්වහන්සේගේ වැඩසිටීම අපට කිසිම ගැටළුවක් කිසිදිනක ඇති නොවේය යන සහතිකය නොවේ. එහෙත් අපට අපගේ නිවස කළමනාකරණය කිරීමට බලය ඇති බව ඉන් තහවුරු කෙරේ. යොහන් 2:5 පාඨයෙන් අපට දෙවෙනි රහස සම්බ වේ. ''නුඹලාට කියන කොයි දෙය නුමුත් කරපල්ලා.'' අපි අපගේම කැමැත්ත අතහැර, යේසුස්වහන්සේගේ කැමැත්තට යටත්වුවහොත් අපි අපගේ හදවතේ කැමැත්ත සතුටු කිරීමට දේවල් කිරීමට කිසිසේත් නොසිතන්නෙමු. එහෙත් දෙවියන් වහන්සේගේ හදවත සතුටු කරන දේවල්ම කරමු. ''දෙවියන්වහන්සේ මගෙන් කුමක් බලාපොරොත්තු වන්නේද?'' සිතුවහොත් අපට එයට පිළිතුරු දේව වචනය තුළින් සම්බ වේ. ස්වාමි පුරුෂයින්ට බයිබලය මෙසේ පවසයි. ''පුරුෂයෙනි, ක්‍රිස්තුස්වහන්සේ සභාවට ප්‍රේමකොට ඈ උදෙසා තමන්ම පාවා දුන්නාක් මෙන්ම නුඹලාත් නුඹලාගේ භාර්යාවන්ට ප්‍රේම කරපල්ලා'' (එපීස 5:25). භාර්යාවන්ට දෙවියන්වහන්සේ මෙසේ පවසන සේක. ''භාර්යාවෙනි, ස්වාමීන්වහන්සේට මෙන් නුඹලාගේ ස්වාමි පුරුෂයන්ට යටත්ව සිටපල්ලා'' (එපීස 5:22). ස්ත්‍රිය පුරුෂයාට යටත්වී ඇගේ ප්‍රේමය, කරුණාව, ආදරය ඔහුට පෙන්වන්නීය. දෙමවුපියන්ට යේසුස්වහන්සේ මෙසේ පවසන සේක, ''පියවරුනි, නුඹලාගේ දරුවන්ට කෝප නූපදවා....'' (එපීස 6:4) අවසානයේදී දරුවන්ට මෙවැනි අවවාදයක් දෙන සේක. ''දරුවෙනි, නුඹලාගේ දෙමවුපියන්ට ස්වාමීන්වහන්සේ තුළ කීකරු වෙයල්ලා'' (එපීස 6:1).

# අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය

තුන්වෙනි රහස වන්නේ ජීවමාන සහ ක්‍රියාශීලී සම්බන්ධතාවයක් වර්ධනය කරගැනීමය. යොහන් 2:6,7 පාඨවලින් කියැවෙන දෙය බලන්න. ''යුදෙව්වරුන්ගේ පවිත්‍රවීමේ ප්‍රකාරයට එක එකේ මෙත්‍රෙ දෙකක්, තුනක් පමණ වතුර අල්ලන්නාවූ ගල් භාජන හයක් එහි තබා තිබුණේය. භාජනවල වතුර පුරවාපල්ලායි යේසුස්වහන්සේ ඔවුන්ට කීසේක. ඔවුහු ඒවා කට දක්වා පිරෙවුවෝය'' (යොහන් 2:6,7). මෙම භාජනවල නිතරම වතුර පුරවා තිබිය යුතුය. එනම් නිවස පවිත්‍ර කිරීම සඳහාය. භාජන හිස්ව තිබූ අයුරින් පෙන්වන්නේ නිවසේ ආගම වගාකර නැති බවය.

අවාසනාවකට මෙන්, බොහෝ උගත් කිතුනු නිවෙස්වල මෙම රහස් තුන නොකඩවා අනුගමනය නොකරන බව අපට පිළිගැනීමට සිදුවේ. ඒවායේ ප්‍රතිඵල වන්නේ, විසිරී ගිය පවුල්, නොසලකා හරිනු ලැබූ දරුවන්, අමනාපය සහ ශෝකය යන දේවල්ය. යේසුස්වහන්සේ කානාහි සරණ මංගල්‍යයේ සිටි ආකාරයෙන්ම ඔබගේ නිවසේද සිටීමට කැමති වන සේක. ඔබ උන්වහන්සේට නිවස තුළට ආරාධනය කරන්නේද?

## මෙනෙහි කිරීම

ප්‍රධාන අදහස

**කානාහි සරණ මංගල්‍යයෙන් සාර්ථක විවාහයක තිබිය යුතු රහස් තුනක් අපි දකිමු.**

1. යේසුස්වහන්සේට ආරාධනය කරන්න.
2. යේසුස්වහන්සේ පවසන දෙයම කරන්න.
3. උන්වහන්සේ සමග ජීවමාන සහ ක්‍රියාශීලී සබඳතාවක් වර්ධනය කරගන්න.

**සාකච්ඡාව සඳහා මග පෙන්වන ප්‍රශ්න :**

1. අපගේ නිවසට යේසුස්වහන්සේට ආරාධනා කිරීමේ ක්‍රම කිහිපයක් මොනවාද?
2. යාච්ඤාවකට පිළිතුරු වශයෙන් හාස්කමක් සිදුවූ අවස්ථාවක් ගැන පවසන්න. ඔබගේ හෝ ඔබ දන්නා වෙනත් පවුලක් දුටු අත්දැකීමක්.
3. ඔබට (නිවසේදී, පාසැලේදී, කාර්යාලයේදී) කුමන දුෂ්කර කාර්යයක් කරන මෙන් දෙවියන්වහන්සේ ඉල්ලන සේක්ද?

# අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය

## 2 දෙවියන්වහන්සේගේ යහපත්කම පිළිබිඹු කරන පවුල්

''පියෙක් තම දරුවන්ට අනුකම්පා කරන්නාක් මෙන් ස්වාමීන්වහන්සේ තමන් කෙරෙහි භය ඇත්තන්ට අනුකම්පා කරන සේක'' (ගීතාවලිය 103:13).

ඔබගේ සාකච්ඡාවට ස්වර්ගයේ හිරු එළිය ගෙන එන්න. දිරිගන්වන සුළු සහ ප්‍රීතිවන ආකාරයේ වචන කථා කිරීමෙන් ඔබගේ ආත්මය තුළ ක්‍රිස්තුස්වහන්සේගේ ධර්මිෂ්ඨතාවයේ සූර්යාලෝකය තිබෙන බවට එළිදරව් වෙයි. දරුවන්ට අවශ්‍ය වන්නේ ප්‍රසන්න වචනයි. ඔවුන් තුළ විශ්වාසය තැබීම ඔවුන්ට සතුටක් වන්නේය. තද පරුෂ හැඟීම් ප්‍රකාශ කිරීමෙන් වළකින්න. සුමුදු කටහඬක් වර්ධනය කරන්න. දේව වචනයේ ගැබ්වී ඇති පාඩම් වල අලංකාරය වටහාගන්න. මෙය ප්‍රීතිය සඳහා ඉතා අවශ්‍ය බවත් ඔබගේ නිවසේ ජීවිතයේ සාර්ථකත්වයට අවශ්‍ය බැවින් එය හොඳින් රක්ෂා කරන්න. ප්‍රීතිමත් පරිසරයක් තුළ දරුවන් මිහිරි වූද, දීප්තිමත් වූද පුරුදු වර්ධනය කරගන්නෝය.

චරිතයේ අලංකාරය වන්නේ විශේෂ අවස්ථාවලදී පමණක් බැබලෙන්නාවූ දෙයක් නොවේ. ආත්මය තුළ වැඩසිටින ක්‍රිස්තුස්වහන්සේගේ මහිමය සියළුම අවස්ථාවලදී පිළිබිඹු වෙයි. මෙම මහිමය ජීවිතය තුළ වැඩසිටින බැවින් එය ඉතා ආදරයෙන් රක්ෂා කරන්නාගේ චරිතයේ අලංකාරය දුෂ්කර අවස්ථාවලදී මෙන්ම සතුටුදායක අවස්ථාවලදීද පිළිබිඹු කෙරේ. අපි නිවසේදී, ලෝකයේදී සහ දේවස්ථානයේදී ක්‍රිස්තුස්වහන්සේගේ ජීවිතය මෙන් ජීවත් විය යුතුය. සියළු දෙසින්ම හැරීම අවශ්‍යව සිටින ආත්ම බොහෝ ඇත. දෙවියන්වහන්සේගේ ආඥා හදවතේ ලියැවී ඇති බැවින් ශුද්ධ වූ චරිතයකින් සාක්ෂි දරන විටදී, ක්‍රිස්තුස්වහන්සේගේ මහිමයේ බලය නොදන්නාවූ අයට එය අත්කර ගැනීම සඳහා මගපෙන්වනු ලබන අතර ඔවුහු උන්වහන්සේ වෙතට හැරෙන්නෝය.

ස්වර්ගයේ රාජ සභාව තුළ අභිමානවත් සමාලෝචනයක් දැන් සිදුවෙමින් පවතී. දැන් ස්වර්ගයේදී ගන්නා තීරණ ගැන සිතා, දෙමවුපියන් කඩිසර වී තම දරුවන් දේව බිය සහ ප්‍රේමය තුළ පුහුණු කළ යුතුය. වැරදි ක්‍රියා ගැන තද වචන සහ දඬුවම් කිරීම මගින් එතරම් සාර්ථක ප්‍රතිඵල ලැබිය නොහැක. එහෙත් විමසිලිමත් වීමෙන් සහ යාච්ඤාවෙන් ඔවුන්ව සතුරාගේ උගුලෙන් ගලවා ගත යුතුය.

මේ කාලයේදී සත්‍යය ගැන දැනුමක් ඇති සියළුම පවුල් එය අන් අය සමග බෙදාගත යුතුය. ස්වාමීන් වහන්සේගේ මිනිස්සු විශේෂ කාර්යයක් සඳහා සූදානම් විය යුතුය. පවුලේ වැඩිහිටි අය සහ දරුවන්ද විනාශවෙමින් සිටින අය ගළවා ගැනීමට ක්‍රියා කළ යුතුය. ක්‍රිස්තුස්වහන්සේ තරුණවියේදී ඇසුරු කළ සියළුදෙනාම වඩා උසස් දේවල් කරා ගෙනයාමට උන්වහන්සේගේ බලපෑම හේතුවිය. එබැවින් අද තරුණයින්ගේ ආත්ම දෙවියන්වහන්සේ කරා යොමු කළ හැකි බලයකින් උත්සාහ දැරිය යුතුය.

# අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය

දෙමවුපියන් දෙවියන්වහන්සේ ඔවුන් වෙත පවරා ඇති වගකීම අගය කරමින් එයට ගරු කළ යුතුය. එසේ කිරීමෙන් ඔවුන් දරුවාට උන්වහන්සේගේ නියෝජිතයෙක් ලෙස පෙනී සිටිය යුතුය. දෛනික ජීවිතයේදී හමුවන්නාවූ අයට ඔබගේ චරිතය එළි දක්වන ආකාරය දරුවාට බලපාන්නේ යහපත් ලෙස හෝ කෲර අයුරිනි.  දෙවියන්වහන්සේගේ එම වචන .....

''පියෙක් තම දරුවන්ට අනුකම්පා කරන්නාක් මෙන් ස්වාමීන්වහන්සේ තමන් කෙරෙහි භය ඇත්තන්ට අනුකම්පා කරන සේක'' (ගීතාවලිය 103:13). ''මනුෂ්‍යයෙකු තමාගේ මව් විසින් සනසනු ලබන්නාක් මෙන් මම නුඹලා සනසන්නෙමි'' (යෙසායා 66:13).

## මෙනෙහි කිරීම

**ප්‍රධාන අදහස**

ප්‍රීතිමත් නිවසක් ප්‍රීතිමත් දරුවන් බිහි කරන්නේය. මෙය ක්‍රිස්තුස්වහන්සේ හදවත තුළ ජීවත්වීමේ ප්‍රතිඵලයකි. මිනිසුන් වෙනස් කිරීමට ඉතාම හොඳ සාක්ෂිය වන්නේ දෙවියන්වහන්සේගේ බලයයි. ක්‍රිස්තුස්වහන්සේගේ මහිමයේ බලවත්කම නොදන්නා අය එය ලැබීමේ ආශාවෙන් උන්වහන්සේ වෙත හැරෙන්නෝය.

**සාකච්ඡාව සඳහා මග පෙන්වන ප්‍රශ්න :**

1. ඔබව කෝපකර දෙවියන්වහන්සේව අමතක කිරීමට පොළඹවන්නේ කුමන අවස්ථාවන්ද?
2. ඔබගේ පවුලේ සාමාජිකයින් එනම් සහකාරයා හෝ සහකාරිය, දරුවන්, ඥාතීන්, දෙමවුපියන් සතුටු කරන ක්‍රියා මතක් කරගන්න.
3. අන් අයව දෙවියන්වහන්සේ කරා යොමු කරන ආකාරයේ යහපත්කමේ බලවේගයක් විය හැක්කේ කෙසේද?

# අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය

## 3 ඒදන් උයන පළමු නිවස

''.... ස්වාමි වූ දෙවියන්වහන්සේ .... ස්ත්‍රියක් සාදා ඈය මනුෂ්‍යයා වෙතට පැමිණ වූ සේක .... එබැවින් පුරුෂ තෙමේ තමාගේ පියාද, මවද අත්හැර තම භාර්යාවට ඇළුම් වන්නේය. ඔවුහු එක මාංශයක් වන්නෝය'' (උත්පත්ති 2:22-24).

දෙවියන්වහන්සේ මුල්ම විවාහ මංගල්‍යය සැමරූ සේක. ඒ ආකාරයෙන් බලන විට විවාහ ගිවිසුම ආරම්භ කළ තැනැත්තා වන්නේ විශ්වයේ මැවුම්කාරයාණන්ය. ''විවාහය ගෞරවාන්විතය'' (හෙබ්‍රෙව් 13:4). එය දෙවියන්වහන්සේ මිනිසාට දුන් පළමු ත්‍යාගයයි. ආදම්ගේ වැටීමෙන් පසු ආදම් පාරාදීසයේ දොරටුවෙන් එහාට ගෙන ගියාවූ සම්බන්ධතාවයන් දෙකෙන් එකක්ද වන්නේය. දේව ප්‍රතිපත්ති හඳුනාගෙන මෙම ඥාති සම්බන්ධතාවයට කීකරු වුවහොත් විවාහය ආශිර්වාදයක් වන්නේය. එමගින් ජාතියේ පවිත්‍රතාවය සහ ප්‍රීතිය රක්ෂා කරනු ලැබේ. එය මිනිසාගේ ශාරීරික අවශ්‍යතාවයන් සපයයි. එය ශාරීරික, බුද්ධිය සහ සදාචාරය ඔසවා තබයි.

අපගේ මුල් දෙමවුපියන්ගේ නිවස අනාගතයේ බිහිවන, මුළු පොළොවම අයත් කරගන්නා වූ ඔවුන්ගේ දරුවන්ගේ නිවසට සැලසුමකි. දේව හස්තයෙන්ම අලංකාර කරන ලද එම නිවස, අලංකාර මාලිගාවක් නොවීය. එහෙත් එය උයනකි. මෙය ඔහු පදිංචි වූ නිවසය. මෙම ශුද්ධ වූ දෙපළ වටා සෑම කාලයකටම සුදුසු පාඩමක් විය. එනම් සත්‍ය ප්‍රීතිය භුක්ති වින්දේ අහංකාරකමින් සහ සුඛෝපභෝගී ජීවිතයකින් නොව, දෙවියන්වහන්සේ මැවූ දේවල් තුළින් උන්වහන්සේ සමග සන්නිවේදනය තුළිනි. මිනිසුන් කෘත්‍රිම දේවල් වලට අවධානය යොමු නොකර, සරලත්වය මහත් සේ වගාකරන්නේ නම් දෙවියන්වහන්සේගේ මැවීමේ පරමාර්ථය කරා ඔවුන් වඩාත් ළඟා වන්නෝය. උඩඟුකම සහ උසස් බලාපොරොත්තු කිසි දිනක සෑහීමට පත් නොවේ. එහෙත් ඔවුන් ඇත්තෙන්ම ඥානවන්ත වී නම්, දෙවියන්වහන්සේ ඔවුන් අසලම තබා ඇති සම්පත් තුළින් ඔවුන්ගේ ප්‍රීතිය වර්ධනය කරගන්නෝය.

ඒදන් උයනෙහි පදිංචි අයට උද්‍යානය රක්ෂා කිරීමේ අයිතිය කැප කෙරිණි. ''එනම් අලංකාර කිරීම සහ රැක බලාගැනීමය'' ඔවුන්ගේ රැකියාව වෙහෙසවන්නක් නොවීය. එහෙත් එය ආනන්දනීය වින්දනයක් විය. එහෙත් දෙවියන්වහන්සේ කර්මාන්තයේ යෙදීම මිනිසාට භාර කළේ ඔහුගේ සිත කාර්යක්ෂම කිරීමටය. එපමණක් නොව, ඔහුගේ ශරීර වර්ධනය සහ නොයෙක් අංශවල වර්ධනය සඳහාය. ශාරීරික සහ මානසික ක්‍රියාකාරකම් තුළින් ආදම් තම ශුද්ධවන්ත පැවැත්මේ උසස්ම සතුට භුක්ති වින්දේය. මෙම ශුද්ධ වූ දෙපළ දෙවියන්වහන්සේගේ පිතෘ රැකවරණය යටතේ සිටි දරුවන් පමණක් නොව, සියළු ඥානයෙන් යුක්ත මැවුම්කාරයාණන්ගේ උපදෙස් ලැබූ ශිෂ්‍යයෝද වූහ. මැවීමේ ක්‍රමවත් බව සහ සමගිය තුළින් ඔවුන්ට අනන්තවූ ඥානය සහ බලය ගැන කථා කළේය. ඔවුන් නිතරම පිනවන චමත්කාර දේවල් සොයාගත් අතර ඔවුන්ගේ හදවත් ගැඹුරු ප්‍රේමයෙන් පුරවන අතර නැවුම් කෘතඥතාවයකින් සිත් පිරී යයි.

# අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය

ඔවුන් දිව්‍ය ආඥාවලට පක්ෂපාතීව සිටිනතාක් කල් අවබෝධ කරගැනීමේ, භුක්ති විඳීමේ සහ ප්‍රේම කිරීමට ඇති ඉඩකඩ වර්ධනය වේ. ඔවුහු නිරතුරුවම නව දේවල් ගැන අවබෝධයක් ලබති. ප්‍රීතියේ නව උල්පත් සොයා ගනිමින්, මෙතෙකැයි කිව නොහැකි වූ අපරාජිත දේව ප්‍රේමය ගැන වඩ වඩා පැහැදිලි සංකල්පයක් ලබති.

## මෙනෙහි කිරීම

### ප්‍රධාන අදහස

දෙවියන්වහන්සේ පුරුෂයා සහ ස්ත්‍රිය මැවුවේ ඥාති සම්බන්ධයක් සඳහාය. උන්වහන්සේ මුල්ම සරණ මංගල්‍යය සැමරූ සේක. එය දෙවියන්වහන්සේගෙන් මිනිසා ලැබූ තෑගි වලින් එකකි. අපගේ මුල් දෙමවුපියන් වන ආදම් සහ ඒවගේ නිවස අනෙක් නිවෙස් වල සැලසුම විය යුතුය. උද්‍යානය රක්ෂා කිරීමේ ආශිර්වාදය ඔවුන්ට දී තිබුණි. දෙවියන්වහන්සේ කර්මාන්තයේදීම මිනිසාට ආශිර්වාදයක් ලෙස දුන් සේක. එනම් ඔහුගේ මනස කාර්යක්ෂම කිරීමට, ශරීරය ශක්තිමත් කිරීමට සහ ඔහුගේ ශරීර ඉන්ද්‍රියයන් වර්ධනය කිරීම සඳහාය.

**සාකච්ඡාව සඳහා මග පෙන්වන ප්‍රශ්න :**

1. විවාහ වීමෙන් ලැබෙන ආශිර්වාද මොනවාද?
2. ශරීරය වෙහෙස වී කිරීම සහ නිවසේ කටයුතු කැමැත්තෙන්ම කිරීමෙන් ලැබෙන යහපත ලැයිස්තුගත කරන්න.
3. ඔබගේ පවුලේ වටිනාකම ඇගයීමට රුකුල් දෙන පවුලේ වැඩකටයුතු මොනවාද?

# අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය

## 4 ආබ්‍රහම් දෙවියන්වහන්සේගේ කටහඬට කීකරු වුණේය

''ආබ්‍රහම් මාගේ හඬට කීකරුව, මාගේ නියමයද, මාගේ ආඥාවද, මාගේ පනත්ද, මාගේ ව්‍යවස්ථාවද පැවැත්වූ හෙයින් ....''
(උත්පත්ති 26:4)

ආබ්‍රහම්ගේ ආදර්ශය, ඔහුගේ ජීවිතයට බලපෑ නිශ්ශබ්ද බලපෑම නිරතුරුවම පාඩමක් විය. නොවෙනස් වන අඛණ්ඩතාවය, කාරුණික බව සහ පරාර්ථකාමී ගුණ ධර්ම රජවරුන්ගේ අගය කිරීමට ලක් වූ අතර, ඒවා නිවසේදීද ප්‍රදර්ශනය කරනු ලැබීය. ජීවිතයේ සුවඳ, චරිතයේ උතුම් බව අලංකාරය මගින් ඔහු ස්වර්ගය හා සම්බන්ධතාවය  පෙන්නුම් කළේය. ඔහු ඉතාම යටහත් පහත් පුද්ගලයාගේ සේවකයාගේ ආත්මය ඉවත නොදැම්මේය. ඔහුගේ නිවසේ හාම්පුතාට එක නීතියකුත් සේවකයාට තවත් නීතියකුත් නොවීය. ධනවතාට රාජකීය සැලකිලිත්, දිළින්දාට ඊට වෙනස් වූ සැලකිලිත් නොවීය. සියළුදෙනාටම රාජකීයත්වයෙන් සහ සාධාරණ ලෙස සැලකීය. ඔහු සමග සිටි අය ජීවනයේ මහිමය උරුමක්කාරයින් ලෙස ඔහු අනුකම්පාවෙන් සැලකීය.

''ඔහු ඔහුගේ .... පවුලේ අයට අණ කරන්නේය. ඔහුගේ දරුවන්ගේ අයහපත් ක්‍රියාවලට නැඹුරුවීම් නොමැති වූ බැවින් ඒවා වැළැක්වීමට ඔහුට සිදු නොවන්නේය. විශේෂත්වයෙන් කිසිවෙකුට නොසැලකීය. ආබ්‍රහම් නිවැරදි උපදෙස් දුන්නා පමණක් නොව, ඔහු සාධාරණත්වයේ සහ ධර්මිෂ්ඨ පනත් වල බලයද පවත්වන්නේය.''

අපේ කාලයේ මෙම ආදර්ශය අනුගමනය කරන්නාවූ අය කොපමණ සිටිත්ද! බොහෝ දෙමවුපියෝ තම දරුවන්ට ඔවුන්ගේම කැමැත්තේ හැටියට, යහපත් විනිශ්චයෙන් සහ විනීත බවෙන් තොරව කටයුතු කිරීමට ඉඩ හැරීමට තරම් අන්ධ වූද ආත්මාර්ථකාමී වූද ප්‍රේමයකින් කටයුතු කරති. මෙම තරුණ පරපුරට කරන්නාවූ අති කෲර වූ වරදක් වනවා පමණක් නොව ලෝකයට කරන්නාවූ විශාල වරදකි. දෙමවුපියන්ගේ වැරදි ක්‍රියා නිසා පවුල් ව්‍යාකූල වන අතර එය සමාජයටද බලපායි. එමගින් තරුණයින්ට දිව්‍ය උපදෙස් වලට යටත් වෙනවා වෙනුවට තමාගේම කැමැත්ත සහ ආශාවට අනුව ක්‍රියා කිරීමට පොළඹවයි. ඒ අනුව ඔවුහු දේව කැමැත්තට විරුද්ධ හදවතක් සහිතව වැඩෙන අතර, ඔවුහු ඔවුන්ගේ දරුවන්ටත්, දරුවන්ගේ දරුවන්ටත් ආගම ධර්මයට විරුද්ධව, එයට අකීකරුවූ ස්වභාවයක් දායාද කරති. ආබ්‍රහම් මෙන් දෙමවුපියෝ තම පවුලේ අයට යහපත්වූ ආඥා වලට අනුව අණ කළ යුතුය. දේව බලයට කීකරු වීමේ මුල් පියවර ලෙස දෙමවුපියන්ගේ බලයට යටත්වීම සහ එසේ කිරීමට උනන්දු කරත්වා.

දෙවියන්වහන්සේගේ ශුද්ධ වූ පනත් වලට කීකරු වීම සුළුකොට සලකන අය කෙලින්ම පවුලේ සහ ජාතියේ පාලනයට පහර දෙති. ආගමට ලැදි, එහෙත් උන්වහන්සේගේ මාර්ගයේ ඇවිදීමට අසමත් වන

# අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය

දෙමවුපියෝ තම පවුලේ අයට ස්වාමීන්වහන්සේගේ මාර්ගයේ යන ලෙස ඔවුන්ට අණ නොකරති. දේව පනත් ජීවිතයේ නීති බවට නොසලකයි. එම දරුවන් ඔවුන්ගේ නිවස තනන විටදී, ඔවුන්ට කිසි දිනක ඉගැන්වූ නැති දේවල් තම දරුවන්ට ඉගැන්වීමට යුතු බව ඔවුහු නොසලකති. දේව භක්තියෙන් තොර බොහෝ පවුල් සිටින්නේ මේ හේතුව නිසාය.

දෙමවුපියන් ස්වාමීන්වහන්සේගේ පනත්වලට අනුකූලව අංග සම්පූර්ණ හදවතකින් කටයුතු නොකළේ නම් ඔවුන්ගේ දරුවන්ට අණ කිරීමට ඔවුහු සුදුසු නොවෙති. මෙම අංශයේ පුනරුත්ථාපනයක් අවශ්‍ය වේ. එනම්, ඉතා ගැඹුරු සහ පුළුල් වූ පුනරුත්ථාපනයකි.

## මෙනෙහි කිරීම

**ප්‍රධාන අදහස**

ආබ්‍රහම් යහපත් පියෙකි. මක්නිසාද, ඔහු තම පවුල සැලසුම් කළේ ස්වර්ගීය පියාණන්ට කීකරුවය. අද බොහෝ දෙමවුපියෝ වැරදි විනිශ්චයට අනුව, යහපත් වියකින් තොර වූ, තමාගේ කැමැත්තේ ආකාරයටම ජීවත් වන දරුවන් සමාජයට හිමි කරති. විනයට අනුකූලව දෙමවුපියන් දරුවන් පාලනය නොකිරීම නිසා එය පවුල්වල සහ සමාජයේ වියවුල් බවට දායක වෙයි. මෙම කරුණ පිළිබඳව පුනරුත්ථාපනයක් අවශ්‍යවේ.

**සාකච්ඡාව සඳහා මග පෙන්වන ප්‍රශ්න :**

1. ඔබගේ දරුවන්ට කුමන පවුල් ගුණාංගයන් භාර දීමට ඔබ කැමතිද?
2. ඔබට ප්‍රතික්ෂේප නොකළ නොහැකි ඉල්ලීම් ඔබගේ දරුවන් තුළ ඇත්ද? ඒවා ලැයිස්තුවක් සාදා විස්තර කරන්න. මෙම ඉල්ලීම් වලට ඔබ ප්‍රතිචාර දැක්වූයේ කෙසේද?
3. දේව අණ පනත් නොපිළිපදින සමහර දෙමවුපියන් සහ දරුවන් වෙත ළඟාවීමට පවුල් වශයෙන් කළ හැක්කේ මොනවාද?

# අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය

## 5 දුෂ්කර කාලයේ සිටි දිරිමත් කාන්තාවෝ

''මක්නිසාද මේ ප්‍රස්තාවේදී නුඹ නිශ්ශබ්දව සිටියොත් වෙන තැනකින් යුදෙව්වරුන්ට නිදහසත් ගැළවීමත් පැමිණෙනවා ඇත. නුමුත් නුඹ සහ නුඹේ පිය වංශය නැතිවන්නේය. නුඹ රාජ්‍යයට පැමුණුනේ මෙවැනි ප්‍රස්තාවක් නිසාම නොවේද කියා දන්නේ කවුදැයි කියා කියන්ට අණකළේය.'' (එස්තර් 4:14)

අද පාඩමෙන් අර්බුදකාරී කාලයකදී කාන්තාවකගේ කාර්යය ඉතා උසස් ලෙස වර්ණනා කරයි. හාමන්ගේ සතුරුකම නිසා ඉශ්‍රායල්වරුන් විනාශ මුඛයට ආසන්නව සිටියහ. එයට කිසිම විසඳුමක් පෙනෙන තෙක් මානයක නොවීය. එහෙත් දේව දරුවන්ගේ මෙම දුක්ඛර අවස්ථාවට මැදිහත්වී, රජතුමා ඉදිරියේ පෙනී සිටීමට තරම් හැඟීම්බර, ඥානවන්ත එස්තර් නමැති කාන්තාවක් දෙවියන්වහන්සේ නගා සිටවූ සේක. එස්තර් රැජිණ, දේව දරුවන් වෙනුවෙන් මැදිහත්කාරකම් කළාවූ යේසුස්වහන්සේගේ ආදර්ශයක් වූවාය.

විනිශ්චයකාරයන්ගේ පොතෙහි, දුෂ්කර කාලවලදී මිනිසුන්ට වඩා ශක්තිමත් බව එළිදරවු කළාවූ කාන්තාවන් අපට හමුවේ. ඉන් පළමු කාන්තාව වන්නේ දෙබෝරාය. ඇය ඉශ්‍රායලයේ විනිසුරුවරියක්ව සිටියාය. කැපවූ භාර්යාවක් සහ මවක්ව සිටි ඇය දේව දරුවන්ව විනිශ්චය කළාවූ පුතුන්ද බිහි කළාය.

මේ කාලයේදී කානාන්හි රජවූ යාබින් තෝරාගත් මිනිසුන්ට විරුද්ධව සටන් කිරීම සඳහා සිසෙරා යැවීය එවිට ඉශ්‍රායල් ඉතිහාසයේ අභිමානවත් චරිතයක් වූයේ දෙබෝරාය. ඇය බාරක්ට කථා කළාය. ඔහු දෙවියන්වහන්සේගේ හමුදාවේ හමුදාපති වූ අතර, ඇය ඔහුව සටනට යැවුවාය. එහෙත් බාරක් බියපත්ව විනිසුරුවරියට මෙසේ කීවේය. ''නුඹ මා සමග යනවා නම් මම යන්නෙමි. නුඹ මා සමග නොයනවා නම් මමත් නොයන්නෙමි'' (විනිශ්චයකාරයන්ගේ පොත 4:8). එවිට දෙබෝරා මෙසේ පැවසුවාය. ''සැබවින් මම නුඹ සමග යන්නෙමි. එසේවී නුමුත් නුඹ යන ගමන නුඹේ ගෞරවය පිණිස නොවන්නේය. මක්නිසාද, ස්වාමීන්වහන්සේ ස්ත්‍රියක් අතට සිසෙරා පාවා දෙනවා ඇත'' (විනිශ්චයකාරයන්ගේ පොත 4:9).

සටනෙන් ජය ඉශ්‍රායල්වරුන්ට අත් විය. එහෙත් බාරක් ශ්‍රේෂ්ඨ ජයග්‍රාහකයා නොවීය. ඇත්තවශයෙන්ම සතුරු හමුදාපති සිසෙරා පලා ගියේය. එහෙත් ඔහු යායෙල් නම් වූ කාන්තාවගේ අතට පත්වූයේය. මෙවැනි දුෂ්කර කාලයකදී ඉශ්‍රායල්වරුන් මුදා ගැනීමට යායෙල් ඥානවන්ත තීරණයක් ගත්තාය.

ක්‍රිස්තුස්වහන්සේගේ අවසාන මොහොතේදී, අර්බුදයයකට නිර්භීතව මුහුණ දුන් මරියා නම් ස්ත්‍රිය පෙනී සිටින්නීය. යේසුස්වහන්සේගේ කමාවීමේ අනුග්‍රහය ලැබූ ඒ අසරණ පව්කාර කාන්තාව, එනම් මරියා, කල්වාරි කන්දේ සිට අවසානයට ගියාවූද, සොහොන වෙත පළමුවෙන්ම ගිය කාන්තාවද වූවාය.

අර්බුදකාරී අවස්ථාවලට මුහුණ දීමට මෙම කාන්තාවන්ට ධෛර්යය සහ ඥානය ලැබුණේ කොහෙන්ද? අපි මග්දලායේ මරියාගෙන් අසමු. තමා යේසුස්වහන්සේගෙන් දුරස්ව සිටි බවත්, ඇගේ ජීවිතය

# අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය

පරාජයෙන් සහ කළකිරීමෙන් පිරී තිබූ බවත් ඇය පවසනු ඇත. එහෙත් ඇය එක් දිනක යේසුස්වහන්සේගේ පතුල් අසලදී ජයග්‍රහණයේ අභිරහස සොයා ගත්තාය. තම සහෝදරිය, මාර්තා කලබලයෙන් එහා මෙහා දුවමින් සිටියදී මරියා යේසුස්වහන්සේගේ පාමුල වැටී සිටින අයුරු ඔබට එහිදී දැකගත හැකිය. අන් සියළුදෙනාම උත්සවයකදී භුක්ති විඳිමින් සිටින විට, නැවතත් ඇය ඇදුරුතුමාණන්ගේ පාද තම කඳුලින් පිස දමනු ඔබට පෙනේ. යේසුස්වහන්සේගේ කුරුසිය වෙතින් සියළු දෙනාම පලා යද්දී මරියා කුරුසිය පාමුල සිටිනු ඔබට දැකිය හැකිය. මරියා, දෙබෝරා, එස්තර් සහ අනෙකුත් කාන්තාවන් දුෂ්කරතාවලට මුහුණ දීමට ශක්තිය ලබා ගත්තේ යේසුස්වහන්සේගෙන් සහ කුරුසියෙන්ය. අදත් ස්ත්‍රී, පුරුෂ සියළුදෙනාම පැමිණීමට ඇති කුණාටු සහිත කාලයකට මුහුණ දීමට බලය ලබා ගත්තේද මෙම ස්ථානයෙන්ය.

## මෙනෙහි කිරීම

### ප්‍රධාන අදහස

1. මෙම පාඩම මගින් එස්තර්, දෙබෝරා, යායෙල්, මග්දලායේ මරියා සහ එවැනි අන් කාන්තාවන්ගේ ජීවිතවල තිබූ ධෛර්යය සහ ඇදහිල්ල අතර ඇති සම්බන්ධතාවය පෙන්නුම් කෙරේ.
2. කැපවූ මිනිසුන් තුළ දෙවියන්වහන්සේගේ වැඩසිටීමේ බලය තුළින් මහත් වූ ප්‍රතිඵල ළඟා කරගත හැක.
3. මෙවැනි කාන්තාවන්ට, ඔවුන්ගේ මිනිසුන් ගළවා ගැනීම සඳහා ඔවුන්ගේ ජීවිත අවදානමේ තබා ඉදිරියට යාමට උන්වහන්සේ කැඳවූ ආකාරයෙන්ම මෙවැනි කාලයකදී බලපෑම් කිරීමට අපව කැඳවා ඇත. එනම්, අන් අය ගළවා ගැනීමට අවශ්‍ය වූ විට අවදානමක් ගැනීමයි.

**සාකච්ඡාව සඳහා මග පෙන්වන ප්‍රශ්න :**

1. අර්බුදකාරී කාලයකදී ශක්තිමත් කළාවූ මෙම කාන්තාවන්ගේ පොදු ගුණාංග මොනවාද?
2. වියහැකි බරපතල විපාක හේතුකොටගෙන භාරදූර තීරණයක් ගැනීමට ඇතිවූ බිය නිසා ඔබ යම් දිනක දුබලවී ඇත්ද? ඔබගේ අත්දැකීම් බෙදාගන්න.
3. ඔබ යම් කෙනෙකුට කථා කොට විමසිලිවන්තව හිංසාකාරී සෘණාත්මක ප්‍රතිඵල උදාකරවිය හැකි තෝරාගැනීමක් ගැන පෙන්වාදී ඇති අවසාන අවස්ථාව කුමක්ද? එය කිරීමට ඔබව ස්වාමීන්වහන්සේ දැන් කැඳවන සේක්ද? ඔබගේ ප්‍රතිචාරය කුමක්ද?

# 6 ඔබගේ විවාහය වර්ධනය කරගන්නේ කෙසේද?

''සිතින් උනන්දු ලෙස එකිනෙකාට ප්‍රේම කරපල්ලා'' (1 පේත්‍රුස් 1:22)

යුවළක් ඔවුන්ගේ 50 වැනි විවාහ සංවත්සරය සමරමින් සිටියහ. ප්‍රාදේශීය පුවත්පතක් ඔවුන් සමග සම්මුඛ සාකච්ඡාවක් මෙහෙයවීම සඳහා වාර්තාකරුවෙක් යැවීය. ඒ වනවිට ස්වාමි පුරුෂයා නිවසේ තනිවම සිටි අතර වාර්තාකරුවා ඔහුගෙන් මෙසේ ඇසීය. ''ප්‍රීතිමත් එමෙන්ම අවසානය දක්වා පවතින විවාහයක වට්ටෝරුව කුමක්ද? මහළු ස්වාමි පුරුෂයා, ''හොඳයි, තරුණය මම ඔබට කියන්නම්''යි මෘදු කටහඬකින් පැවසුවේය. ''මම පළමුවැනි එමෙන්ම එකම සහකාර මිතුරිය වූයේ සාරා. අපි විවාහවිය යුතු යයි ඇය පැවසූ විටදී මම වෙවුලා ගියෙමි. ඉන්පසු, විවාහය අවසන් වූ පසු ඇගේ පියා මා සමග පුද්ගලිකව කථා කිරීමට අවශ්‍ය බව පැවසුවේය. මට ඔහු කුඩා පාර්සලයක් දී මෙසේ කීවේය. ''ඔබට ප්‍රීතිමත් විවාහයක් පවත්වා ගැනීමට අවශ්‍ය සියළු දේ මෙහි ඇත.'' ඔහු එම ඔරලෝසුව ඔසවා වාර්තාකරුට පෙන්වීය. පසුව ඔහු එහි මුහුණතෙහි ලියා තිබූ දේ මිනිසාට කියවීමට හැකිවන පරිදි එය මුහුණ දෙසට එසවීය. එහි ලියා තිබුණේ ''අද සාරාට කරුණාවන්ත යමක් පවසන්න!'' මහළු මිනිසා සිනාසී මෙසේ කීවේය. ''එය ඉතා සරල දෙයක් විය. එහෙත් එය සාර්ථක විය.''

ඔබගේ විවාහයේ වර්ධනයට අවශ්‍ය තවත් කරුණු කිහිපයක් මෙන්න. ඔබ මේවා කියවන අතරතුරේදී, කිසිම නිවසක් අංග සම්පූර්ණ නොවන බවත්, කිසිම විවාහයක් වැරදි වලින් තොර නොවන බවත් මතක තබාගන්න. සෑම යුවළකටම ඔවුන්ටම විශේෂ වූ අභියෝග ඇත. ඉතාම වැදගත් වන්නේ එකිනෙකා සතුටු කිරීමට අරමුණු කරගැනීමයි.

- ඔබගේ විවාහය අන් අයගේ විවාහය සමග සංසන්දනය නොකරන්න. ඔබගේ විවාහය විශේෂිතවූ ඥාති සම්බන්ධයක් ලෙස සලකන්න. සෑම විවාහයකටම අභියෝග ඇත. ඔබගේ මිම්ම ලෙස යේසුස්වහන්සේ තබාගන්න.

- නොකඩවාම ඔබගේ විවාහයේ අරමුණු නැවත මතක් කරගන්න. ඔබට වරදින්නේ කුමන අවස්ථාවලදීද? ඔබ මෙසේ අවුරුද්දකට වරක් හෝ දෙවරක් කළ යුතුය. කුමන අංශයන්ගෙන් ඔබ වර්ධනය විය යුතුද? ඔබට ගැටුම් ඇතිවන්නේ කොහේදීද? ඔබ එක්ව කොපමණ කාලයක් ගත කරන්නේද?

- එකිනෙකා කථා බහේ යෙදෙන්න. එක්ව ජීවත්වීම පමණක් නොසෑහේ. වරෙක යමෙක් මෙසේ පවසා ඇත. ''රූපවාහිනියේ වෙළඳ දැන්වීම් නැතිනම් මිනිස්සු එකිනෙකා සමග කථා නොකරන්නේය.'' වරක් බිරිඳක් පැවසුවේ රූපවාහිනියේ වෙළඳ දැන්වීම් ඉතා කෙටි නිසා ඇයට ඇගේ ස්වාමි පුරුෂයා සමග ප්‍රශ්න විසඳා ගත නොහැකි බවයි!

# අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය

- ඔබ එක්ව මූල්‍ය කළමනාකරණය කරන්න. විවාහයකට බලපාන ප්‍රධානම ගැටළුව වන්නේ මුදල්, ලිංගික සේවනය සහ ඥාති සම්බන්ධතාවයන්ය. (එනම් නැන්දම්මා, මාමණ්ඩි) අන් ගැටළුවලට වඩා මූල්‍ය ගැටළුව බොහෝ සෙයින් මහත් බව ඔබ සිතනවා ඇති. අයවැයකට අනුව කටයුතු කිරීම ඉතා වැදගත්ය. බොහෝ විවාහ සම්බන්ධතාවල හැඟීම් බර ගැටුම් ඇතිවන කාරණයක් ලෙස මූල්‍යමය ගැටළු නම් කළ හැකිය.

- එකිනෙකා සමග ප්‍රේමවන්ත වචන හුවමාරු කරගන්න. ඔබ මුල් කාලයේදී මුණගැසුණු අවස්ථාවලදී ලියන ලද කරුණාවන්ත සටහන් සහ කාඩ්පත් මතකද? ඔබගේ සහකාරියට/සහකරුවාට ප්‍රේමවන්ත වචන නිතරම කථා කරන්න. ඇගේ කොණ්ඩා මෝස්තරය, ඔහුගේ ටයි එක, ආහාර, වැඩ කටයුතු වැනි දේවල් ගැන වර්ණනා කරන්න. අප දෙදෙනා අතර පවිත්‍ර ප්‍රේමයක් ඇත්නම් අපගේ වචන වලින් සහ ක්‍රියාවෙන් එය පෙන්වයි. මෘදු වචන දිගටම කථා කිරීම මගින් ආදරයට ජීවමාන කරයි. ''මම ඔබට ආදරෙයි'' යනුවෙන් බොහෝ විට පවසා හාදුවකින් එය තහවුරු කරන්න.

අපගේ බයිබල් පාඨයේ වචන මතක් කරගන්න. ''සිතින් උනන්දු ලෙස එකිනෙකාට ප්‍රේම කරපල්ලා.''

## මෙනෙහි කිරීම

**ප්‍රධාන අදහස**

සහකරුවාට ඔබ බෙහෙවින් ප්‍රේම කරන බවත්, සලකන බවත් හැඟෙන ආකාරයේ, ඉතා සරල විශේෂිත වූ ක්‍රියා කිරීම ප්‍රීතිමත් විවාහයකට දායක වේ. එවැනි උදාහරණ වන්නේ, අත් අල්ලා ගැනීම, කටහඬින් පණිවිඩයක් යැවීම, දුරකථනයෙන් පණිවිඩයක් යැවීම, උරහිසට තට්ටු කිරීම, කරුණාවන්ත යමක් පැවසීම වැනි ඒවාය. කෙසේ වෙතත් එයට යම්දෙයක් කිරීම, යාච්ඤාව, කැපවීම සහ එය සාර්ථක වීම සඳහා දෙවියන්වහන්සේට අනුකූලව ජීවත්වීමට ඇති කැමැත්ත උවමනා වේ.

**සාකච්ඡාව සඳහා මග පෙන්වන ප්‍රශ්න :**

1. මනුෂ්‍ය විවාහය අන් විවාහ වලට වඩා විශේෂ වන්නේ කුමකින්ද?
2. ඔබගේ සහකරුවාගේ සිත් ඇදගැනීම සඳහා ඔබ කුමක් කළ යුතුද?
3. වසර පහක් තුළදී ඔබගේ විවාහය තුළින් ඔබ කුමක් දැකීමට කැමතිද? අවුරුදු දහයකින්? අවුරුදු 20කින්

# අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය

## 7 දෙමවුපියන්ට ගෞරව කිරීම වෙනුවෙන් දුන් පොරොන්දුව, දීර්ඝායුෂ

''තාගේ දෙවිවූ ස්වාමීන්වහන්සේ තට දෙන දේශයෙහි තාගේ දවස් බොහෝ වන පිණිස තාගේ පියාටත් තාගේ මවුටත් ගෞරව කරව.''
(නික්මයාම 20:12)

ක්‍රිස්තුස්වහන්සේ සත්‍ය වශයෙන්ම අනුගමනය කරන තැනැත්තා උන්වහන්සේ හදවතේ වැඩසිටීමට ඉඩහැර විශිෂ්ටවූ ආකාරයෙන් සිංහාසනාරූඪ කළ යුතුය. ඔවුහු තම නිවස තුළ උන්වහන්සේගේ ආත්මය සහ චරිතය නියෝජනය කළ යුතුය. ඒ අනුව ඔවුන් ඇසුරු කරන අයට ගුණවත් බව සහ කරුණාව පෙන්විය යුතුය. සත්‍යය හොඳින් උගත් බොහෝ දරුවන් සිටිතත්, ඔවුහු ඔවුන්ගේ දෙමවුපියන්ට ලැබිය යුතු ගෞරවය සහ ආදරය නොදක්වති. මවට සහ පියාට සුළු ලෙස ප්‍රේම කරන ඔවුහු, ඔවුන් බලාපොරොත්තු වන ගෞරවය දීමට අසමත් වන අතර, ඔවුන්ගේ ආශාවන් සපුරා ගැනීමට මාර්ග සොයති.

බොහෝ උගත් කිතුනුවෝ මවට සහ පියාට ගෞරව කිරීමේ අර්ථය පවා නොදනිති. එහි විපාකයක් ලෙස, ''තාගේ දෙවිවූ ස්වාමීන්වහන්සේ තට දෙන දේශයෙහි තාගේ දවස් බොහෝ වන පිණිස....'' (නික්මයාම 20:12) පාඨයේ අර්ථයවත් නොදනිති. හදවත් පරීක්ෂා කරන්නා ඔබගේ දෙමවුපියන් පිළිබඳ ඔබගේ ආකල්පය දන්නා සේක. මක්නිසාද උන්වහන්සේ ස්වර්ගීය ශුද්ධස්ථානයේ රන්වන් තරාදියෙන් ඔබගේ චරිත ගුණාංගය කිරා බලන සේක. අහෝ, දෙමවුපියන් පිළිබඳ ඔබ දක්වන නොසැලකිල්ල ගැන පසුතැවිලි වන්න. ඔබ ඔවුන්ට දක්වන වෙනස ගැන සහ ශුද්ධ වූ දේව ආඥාව ගැන දක්වන අපහාසය ගැන පසුතැවෙන්න.

දෙමවුපියෝ වෙන කිසිවෙකුට නොදක්වන ආකාරයේ ප්‍රේමයකට හිමිකම් කියති. ආත්මවල වගකීම කැප කළාවූ දෙවියන්වහන්සේම දරුවන්ගේ කුඩා වියේදී දෙමවුපියන් ඔවුන්ට දෙවියන්වහන්සේ මෙන් පෙනී සිටිය යුතු බවට ඔවුන්ව කැප කළ සේක. දෙමවුපියන් සතු එම බලය ප්‍රතික්ෂේප කරන අය දෙවියන්වහන්සේගේ බලයද ප්‍රතික්ෂේප කරති. පස්වෙනි පනත මගින් බලාපොරොත්තු වන්නේ දරුවන් ඔවුන්ගේ දෙමවුපියන්ට ගෞරවය, යටත්වීම සහ කීකරුවීම පමණක් නොව ඔවුන්ට ආදරය සහ මෘදු ලෙස සලකා ඔවුන්ගේ බර අඩු කර, ඔවුන්ගේ නාමය ආරක්ෂා කරගෙන, ඔවුන් මහළු වූ විටදී ඔවුන්ව රැක බලාගැනීම සහ සැනසීම ලබාදිය යුතුය. පස්වෙනි පනත දරුවන්ට බැඳෙන්නේ ඔවුන්ගේ ජීවිතයේ ආයුෂ සහ ඔවුන්ගේ දෙමවුපියන්ගේ ආයුෂ රක්ෂාවන තෙක්ය.

# අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය

## මෙනෙහි කිරීම

ප්‍රධාන අදහස

ඔබට බොහෝ කල් ජීවත් වීමට සහ ප්‍රීතියෙන් ජීවත් වීමට අවශ්‍ය නම් ඔබගේ දෙමවුපියන්ට ගෞරව කරන්න.

**සාකච්ඡාව සඳහා මග පෙන්වන ප්‍රශ්න :**

1. ඔබගේ දෙමවුපියන්ට ගෞරව කරන්නේ කෙසේද? මෙය එතරම් වැදගත් වන්නේ ඇයි?
2. ඔබ දෙමවුපියන්ගෙන් ඈත්වී ජීවත් වුවත්, ඔබ ඔවුන්ට ගෞරවය දැක්විය හැක්කේ කෙසේද?
3. විවිධ ආගමික මත, අගය කිරීමේ ක්‍රම සහ වෙනත් අවස්ථාවන් නිසා ඔබ දෙමවුපියන් සමග ඇති ඥාති සම්බන්ධතාවයේ පොර බදින්නේ නම්, ඔබට කළ හැක්කේ කුමක්ද?

# අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය

## 8 ප්‍රීතිමත් ජීවිතයකට යේසුස්වහන්සේගේ වට්ටෝරුව

''..... ගල් භාජන හයක් තබා තිබුණේය. භාජනවල වතුර පුරවාපල්ලා යයි යේසුස්වහන්සේ ඔවුන්ට කීසේක. ඔවුහු ඒවා කට දක්වා පිරෙවුවෝය.'' (යොහන් 2:6,7)

යේසුස්වහන්සේ සහභාගි වූ සරණ මංගල්‍යයේදී යම් දුෂ්කරතාවයක් පැන නැගුණි. චාරිත්‍රානුකූලව පළමුවෙන්ම හොඳම මිදියුෂද, ඉන්පසු ඊට බාල වූ මිදියුෂ වලින් සංග්‍රහ කිරීම ඒ කාලයේදී සිදුවිණි. යේසුස්වහන්සේ එම භාජන හයේ තිබූ ජලය මින් පෙර කිසිවෙකු පානය නොකළාවූ ආකාරයේ හොඳම මිදියුෂ බවට පත් කළවිට එම මංගල උත්සවයම පුදුමයට පත්විය. මෙය අසාමාන්‍ය දෙයකි. එය විවාහ ගිවිසගත් නව යුවළට සහ අද ජීවත්වන අපටද හොඳ පාඩමකි. නව යුවළක් එම හොඳම මිදියුෂ මෙන් ඔවුන්ගේ හොඳම දෙයම කරති. එහෙත් කල්යත්ම ඔවුන්ගේ උත්සාහයන් ගැටළු ඇතිවෙයි. ඔවුන්ගේ උත්සාහයන්ද මුල් මිදියුෂ මෙන් දුර්වල බවට පත්වෙයි. ක්‍රිස්තුස්වහන්සේට පෙන්වාදීමට අවශ්‍ය වූයේ උන්වහන්සේ සමග විවාහයක් මුලදී යහපත්ව පවතින බවත් කල්යත්ම එය වඩා හොඳ තත්වයට පත්වන බවත්ය. මෙම බයිබල් කථාන්තරය පදනම් කරගෙන, මෙන්න ප්‍රීතිමත් ජීවිතයකට සැලැස්මක්.

විවාහයකදී පිරවිය යුතු භාජනය නම් ප්‍රේමයේ භාජනයයි. ප්‍රීතිමත් විවාහයකට පවිත්‍ර ආදරයක් අවශ්‍ය වේ. ශාරීරික ආකර්ශනය තාවකාලිකය. පෙනුම සහ ලස්සන ප්‍රීතිමත් විවාහයක පදනම නොවේ. ප්‍රේමය රඳා පවතින්නේ සුහද අවබෝධය, මිත්‍ර සම්බන්ධතාවය සහ ආත්මික බලය මතය. ප්‍රේමය රඳා පවතින්නේ ඔබගේ සහකරුවාට ඇති ගෞරවය සහ විශිෂ්ටත්වය මතය. දෙදෙනාම ඔවුන්ට ගෞරවය දැක්වූ විට එය විවාහයකට හොඳ අත්තිවාරමක් වන්නේය.

අපි දෙවියන්වහන්සේට ළංවූ විට බියක් නොව ප්‍රේමයක් ඇතිවේ. දෙවියන්වහන්සේ අපට ප්‍රේම කිරීමට හැකියාව ලබාදෙන සේක. අපි ක්‍රිස්තුස්වහන්සේගෙන් ඈතට ගියවිට දෙදෙනෙකු අතර දිව්‍යමය, ගැඹුරු සහ සත්‍ය ප්‍රේමයක් ඇති නොවේ. ඔව්, අපි එකිනෙකාට ප්‍රේම කළ හැකිය. එහෙත්, අපි අපගේ ජීවිත ක්‍රිස්තුස්වහන්සේට භාර දුන්විට දෙවියන්වහන්සේ අපගේ හදවත් තුළට ප්‍රේම කිරීමේ වැඩි හැකියාවක් පත් කරන අතර එය නොදන්නාවූ වඩා ගැඹුරු මානයකින් දෙන සේක.

රොබට් බර්න්ස් නමැත්තා 1 කොරින්ති 13 නැවත ලිවුවේය. ඔහු වෙනත් වචන වලින් ලියූ එය මෙසේය: ''මගේ නිවස ලෞකික වස්තුවලින් පිරී තිබිය හැකිය. එහෙත් එහි ප්‍රේමය නැති බැවින් එය හිස් කාමරයක් වන්නේය. මගේ නිවස බුද්ධිමත් මිනිසුන් මුණගැසෙන ස්ථානයක් විය හැකිය. එහෙත් එහි ප්‍රේමය නැත. එය නිකම්ම ඝෝෂා සහිත නිවසක් වන්නේය. මගේ නිවසෙන් වැදගත් රාජ්‍ය නායකයින්ට යැවුවත්, එය මනුෂ්‍යත්වයේ ශුභ සාධනය උදෙසා කටයුතු කළත්, එහි ප්‍රේමය නැතිනම් එහි බලපෑම ක්ෂණයකින් අතුරුදන් වනු ඇත. සත්‍ය නිවසක ආත්මය වන්නේ ඉවසිලිවන්ත සහ කරුණාවන්ත බවයි. එය ඊර්ෂ්‍යා නොවන්නේය. එය පෙළපාලි නොයයි. එය පාරට්ටු නොකරයි. එය සිත් රිදවන සුළු හෝ ආත්මාර්ථකාමී

# අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය

හෝ කෝප නොවෙයි. එය අමනාප නොවෙයි. වෙනත් නිවසක ඇති දුක ගැන ඇසීමෙන් ප්‍රේමවන්ත නිවසක් කිසිවිටක ප්‍රීති නොවෙයි. එය අන් නිවාසවල ඇති පෞද්ගලික ගැටළු ගැන සඳහන් නොකිරීමට නිතරම වගබලා ගනියි. එය නිතරම හොඳම දෙය විශ්වාස කිරීමටත්, බලාපොරොත්තු සහිත වීමටත්, ඉවසිලිවන්ත වීමටත් ක්‍රියාකරයි! නිවස කිසිවිටක අතුරුදහන් නොවේ. ශිෂ්ටාචාර අතුරුදහන් වෙයි. ඥානය යල් පැන ගිය ඒවා බවට පත්වෙයි. ආයතන වසා දැමෙයි. මක්නිසාද අපි දන්නේ ස්වල්පයකි. අපි දකින්නේ බැබළෙන අනාගතයක් පමණි. එහෙත් සත්‍ය නිවසක ආත්මය ලෝකයේ කටයුතු වලට මග පෙන්වන විටදී, එවිට දෙවියන්වහන්සේගේ අංග සම්පූර්ණ රාජ්‍යය පිහිටුවනු ලබන්නේය. දැන් මෙම කරුණු තුන අපගේ නිවසේ සදාකාලයටම දිගටම පවතීවා! ඇදහිල්ල, බලාපොරොත්තුව සහ ප්‍රේමය. මේ සියල්ලෙන්ම අති උතුම් වන්නේ ප්‍රේමයයි!''

සෑම දිනකම අපි අපගේ භාජන කට දක්වාම ස්වර්ගීය ප්‍රේමයෙන් පිරවිය යුතුය. අපි එසේ කළහොත් අපගේ විවාහ කිසිවිටක වියළී නොයයි.

''දේව ප්‍රේමය ගැන සත්‍යයෙන්ම ප්‍රීති වන අයට ප්‍රීතිය හා සමාදානය අයත් වන්නේය.'' (Ellen G. White, The Faith I Live By, p. 237).

## මෙනෙහි කිරීම

### ප්‍රධාන අදහස

සෑම දිනකම, ඔබගේ විවාහය නමැති භාජනය ස්වර්ගීය ප්‍රේමයෙන් පුරවන්න. එවිට එය කිසිවිටක වියළී නොයයි.

**සාකච්ඡාව සඳහා මග පෙන්වන ප්‍රශ්න :**

1. ක්‍රිස්තුස්වහන්සේ මධ්‍යස්ථානය කරගත් විවාහයකින් කුමක් අදහස් කරන්නේද?
2. ඔබගේ ඥාති සම්බන්ධතාවය යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි ඇති ඔබගේ ඇදහිල්ල යටතේ පැවතිය යුත්තේ ඇයි?
3. ඔබගේ සහකරුවාගේ පුද්ගලික සහ ආත්මික වර්ධනය සඳහා ඔබ ඔහුව / ඇයව දිරි ගන්වන්නේ කෙසේද?

# අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය

## 9 දේව තෝරාගැනීම: රෙබෙකා

''මාගේම දේශයටද මාගේම නෑයන් වෙතටද ගොස් මාගේ පුත්‍ර වූ ඊසාක්ට භාර්යාවක් ගන්නා .... ''
(උත්පත්ති 24:4)

ලොව වටා දික්කසාද විශාල වශයෙන් සිදුවෙමින් පවතින විටදී ස්ත්‍රී පුරුෂ සියළුදෙනාම ජීවිතය එක්ව ගත කිරීමට සහකරුවෙකු සොයමින් සිටිති. ඔවුහු තරුණ වියේදී ඔවුන්ට ප්‍රීතිය ගෙන දෙන යමෙක් සොයති. අපි සහකරුවෙකු සොයන විටදී ආදර්ශයට ගතයුතු වන්නේ ආබ්‍රහම් තම පුත්‍රයාවූ ඊසාක්ට සහකාරියක් සෙවීමට ගත් උත්සාහයයි.

ඒ දවස්වලදී විවාහය තීරණය කරන්නේ දෙමවුපියන්ය. එයට උදාහරණයක් වශයෙන් මට මතක් වන්නේ දිනක් මම ටැන්සානියාහි 'පැරනේ' දේශයේ පාසැලකට ගිය අවස්ථාවයි. එක් ඉරිදා දිනක, තරුණයින් දේවස්ථානයේ උත්සවයක විනෝදවෙමින් සිටියදී ගුරුවරයා මට තරුණ යුවළක් පෙන්වීය. ''දේවගැතිතුමනි, ඒ දෙදෙනා විවාහ ගිවිස ගැනීමට සූදානම්ව සිටී. ඔවුන්ගේ අධ්‍යාපනය අවසන් කළ විගසම ඔවුන් විවාහ විය යුතු බව දෙමවුපියෝ එකඟවී ඇත.'' මෙම යුවළ මෙන්ම, ආබ්‍රහම්ටත් අවශ්‍ය වූයේ ඔහුගේ පුතුට සත්‍ය සහකාරියක් ඔහුගේ නෑදෑයින් අතරින්ම සොයා ගැනීමටය. ඔහු තම සේවකයා වූ එලියේසර්ට ඊසාක්ට සහකාරියක් සෙවීමේ කාර්යය භාර දුන්නේය. එලියේසර් පිටත්ව ගියේය දේවදූතයෙක් ඊසාක්ගේ අනාගත සහකාරිය වෙතට තමාට මගපෙන්වන බව එලියේසර් දැන සිටියේය. දෙවියන්වහන්සේ තම දේව දූතයෙක් එලියේසර්ට ඉදිරියෙන් යවන බව ආබ්‍රහම් ඔහුට පැවසුවේය.

ඉතා දිග  ගමනකින් පසු මෙම මගියා තරුණියන් දිය උල්පතට පැමිණෙන තෙක් නාහෝර්ගේ ප්‍රදේශයේ බලා සිටියේය. එහිදී එලියේසර් ඉතා අලංකාර යාච්ඤාවක් මගින් ස්වාමීන්වහන්සේගෙන් දේව සලකුණක් පෙන්වන මෙන් ඉල්ලා සිටියේය.  ඔහු වතුර ඉල්ලූ විටදී එයට ප්‍රතිචාර දක්වන කාන්තාව ඊසාක් දෙවියන්වහන්සේ තෝරන සහකාරිය වේවායි ඉල්ලා සිටියේය.

මෙම කථාන්තරය ඉතාම සිත් ඇදගන්නා සුළු එකකි! බයිබලයේ, ''ඉතාම ලස්සන'' යයි වර්ණනා කරන රෙබෙකා ඇගේ උරහිසේ වතුර භාජනය තබාගෙන දිය උල්පත වෙත පැමිණෙයි. ඇය තම භාජනය පිරෙවූ පසු එලියේසර් ඈ වෙත ගොස් මෙසේ ඉල්ලීය. ''නුඹේ කලයෙන් වතුර ටිකක් දියන්න....'' (උත්පත්ති24:17). රෙබෙකා මෙසේ පිළිතුරු දෙයි. ''මාගේ ස්වාමීනි, බීව මැනව ....'' (උත්පත්ති 24:18). ඉන්පසු ඇය එලියේසර්ට සහ ඇගේ ඔටුවන්ටද බීමට ජලය දුන්නාය.

රෙබෙකා කැපවූ, විනීත සහ ආගන්තුක සත්කාරයේ දක්ෂ වූ තරුණියෙකි. එලියේසර්ගේ කාර්යය කුමක්දැයි දැනගත් ඇය තම පියාණන්ගේ නිවසෙහි නැවතීමට එන ලෙස ඔහුට ආරාධනා කළාය. මේ

# අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය

පිළිබඳ යාච්ඤා කළේ ආබ්‍රහම් සහ එලියේසර් පමණක් නොව, ඊසාක්ද යාච්ඤා කරමින් භාවනා කරමින්ද සිටි බව මතක තබාගැනීම වැදගත්ය (63 වැනි පාඨය). ජීවිතයේ සහකාරයා තේරීමේදී යාච්ඤාව අධික ලෙස අවශ්‍ය වේ. දරුවන් පමණක් නොව දෙමවුපියන්ද ස්වාමීන්වහන්සේට කැපවූ සහකාර ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් තෝරා ගැනීමේදී දෙවියන්වහන්සේගේ පිහිට ඉල්ලා යාච්ඤා කළ යුතුය.

එලියේසර්ගේ මෙහෙය රෙබෙකා වටහා ගත්තාය. ඇයටත් අවශ්‍ය වූයේ දෙවියන්වහන්සේට ප්‍රේම කරන අයෙකු සමග විවාහ වීමටය! ඇගේ සහෝදරයා වූ ලාබන් ඇයට මෙසේ කීවේය. ''නුඹ මේ මනුෂ්‍යයා කැටුව යන්නෙහිද?'' ඇය මෙසේ පිළිතුරු දුන්නාය ''යන්නෙමි....'' (උත්පත්ති 24:58). ඉන්පසු මෙසේ සඳහන් වේ. ඊසාක් එලියේසර්ගේ දෑතින් ලබාගත් රෙබෙකාට ප්‍රේම කළේය.''

''සත්‍ය ප්‍රේමය ඉතා උසස් ශුද්ධ වූ ප්‍රතිපත්තියකි. එය හැඟීම්වලට අනුව පිබිදෙන්නාවූද, පරීක්ෂාවකට පත්වූ විගසම මිය යන්නාවූද ප්‍රේමයට වඩා සම්පූර්ණයෙන්ම වෙනස් වූ චරිතයකි. (Ellen G. White, Patriarchs and Prophets, p. 176)

## මෙනෙහි කිරීම

### ප්‍රධාන අදහස

ජීවිතයට අනාගත සහකාරයෙක් සෙවීමේදී දෙමවුපියන්ගේ මගපෙන්වීම අවශ්‍ය වේ. ස්වාමීන්වහන්සේ තුළ කැපවූ සහකාරයෙක් තේරීම සඳහා බොහෝ සෙයින් පවුලේ සාමාජිකයින්ගේ යාච්ඤාව අවශ්‍ය වේ.

**සාකච්ඡාව සඳහා මග පෙන්වන ප්‍රශ්න :**

1. ඔබගේ ජීවිතයේ සහකාරයා තේරීමේදී දෙමවුපියන්ගේ තෝරාගැනීම සැමවිටම සාර්ථකද? ඔව් නම් ඒ ඇයි? නැහැ නම් ඒ ඇයි?
2. ඔබගේ අනාගත සහකාරයා දෙවියන්වහන්සේගේ තෝරාගැනීමක් බව ඔබ දන්නේ කෙසේද?
3. සහකාරයෙක් තේරීමේදී මගපෙන්වන බයිබලයේ ප්‍රතිපත්ති මොනවාද?

# අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය

## 10 යෝබ් ඔහුගේ දරුවන් වෙනුවෙන් පූජා ඔප්පු කළේය

"ඔවුන්ගේ මංගල්‍ය දවස් හත වූ පසු යෝබ් පණිවිඩ යවා ඔවුන් පිරිසිදු කරවා, පසුවදා අළුයම නැගිට ඔවුන් සියල්ලන්ගේ ගණන ලෙස දවන පූජා ඔප්පු කළේය. මක්නිසාද සමහරවිට මාගේ පුත්‍රයන් පව්කොට, තමුන්ගේ සිත්වලින් දෙවියන්වහන්සේට දොස් කීවා වෙන්ට පුළුවනැයි යෝබ් කීවේය. යෝබ් සැමවිටම මෙසේ කළේය. " (යෝබ් 1:5)

දරුවන් සමග කටයුතු කිරීමේ ක්‍රම දෙකක් වේ. ප්‍රතිපත්තිවලින් සහ ප්‍රතිඵල අනුව බොහෝ සෙයින් වෙනස් ක්‍රම දෙකකි. දේව වචනයේ ඉගැන්වීම් වලට අනුව මේ ජීවිතයටත් ඊළඟ ජීවිතයටත් ප්‍රීතියක් ගෙන දෙන්නේය. කළයුතු දෙය නොසලකා හැරීම, අවිචාරී හැසිරීම, තරුණ වියේදී සිදුවන අනුවණ ක්‍රියා නිවැරදි කිරීමට අසමත් වීම මගින් දරුවන්ගේ කණගාටුව සහ අවසාන විනාශය සිදුවේ. එමෙන්ම දෙමවුපියන්ට බලාපොරොත්තු සුන්වීම් සහ කටුක වේදනාවක්ද ගෙනදේ.

දෙමවුපියන් ඌශ් දේශයේ මිනිසාගෙන් ස්ථිර බව සහ කැපවීම ගැන පාඩමක් ඉගෙනීම යහපති. යෝබ් තම නිවසින් බැහැරව සිටි අයට යුතුකම් නොසලකා නොහැරීය. ඔහු අන් අයගේ යහපත සඳහා ගුණවත්, කරුණාවන්ත සහ කල්පනාකාරීව කටයුතු කළේය. ඒ සමගම ඔහු තමාගේම පවුලේ ගැළවීමට මහත් උනන්දුවකින් කටයුතු කළේය. ඔහුගේ දූවරුන්ගේ (දූවරුන්ගේ සහ පුතුන්ගේ) ප්‍රියසාදයන් අතරතුරේදී ඔවුන්ගේ දෙවියන්වහන්සේ අසතුටු ආකාරයෙන් හැසිරේවියි ඔහු බිය විය. පවුලේ ඇදහිලිවන්ත පූජකවරයෙකු මෙන් ඔහු තම දරුවන් වෙනුවෙන් පූජා කළේය. පාපයේ වැරදිසහගත බව ඔහු දැන සිටියේය. එම දිව්‍ය පොරොන්දු තම දරුවන්ට අමතක වෙතැයි සිතීම හේතුකොටගෙන දෙවියන්වහන්සේ ඉදිරියේ ඔවුන් වෙනුවෙන් පෙනී සිටින මැදිහත්කාරයෙකු මෙන් ඔහු පෙනී සිටියේය.

අපගේ නිවසේවලින් විශාල තරුණ කැළක් පිටතට පැමිණ, ඔවුන්ගේ පවුල්වල දේවත්වයේ බලපෑම නිසා තම හදවත් ස්වාමීන්වහන්සේට යටත් කොට ඔවුන්ගේ ජීවිතයෙන් දිය හැකි උසස්ම සේවය උන්වහන්සේට දීමට ඉදිරිපත් වන අය දැකීමට ඔහු ආශාවනු ඇත. නිවසේදී දේව උපදෙස් අනුව මගපෙන්වනු ලැබූ සහ පුහුණු කරනු ලැබූද, උදෑසන සහ සවස් කාලයේ යාච්ඤාවත්, දේව බිය ඇති, උන්වහන්සේට ප්‍රේම කරන දෙමවුපියන්ගේ නිරන්තර ආදර්ශයත් නිසා ඔවුහු දෙවියන්වහන්සේට තම ගුරුතුමා ලෙස යටත් වීමට සහ උන්වහන්සේට සේවය කිරීමට සූදානම්ව සිටිති. ඔවුන් පක්ෂපාතී සහ දූ පුතුන් මෙන් උන්වහන්සේට පිළිගත හැකි සේවයක් පුදන්නෝය. එබඳු තරුණයෝ දෙවියන්වහන්සේගේ බලය සහ මහිමය ලොවට නියෝජනය කිරීමට සූදානම්ව සිටිති.

# අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය

## මෙනෙහි කිරීම

ප්‍රධාන අදහස

සෑම නිවසකම පවුලේ යාච්ඤාවට මුල්තැන දිය යුතුය. පියා, නිවසේ පූජකයා වීම මගින් දරුවන්ගේ ජීවිතවල ආත්මික වර්ධනය සඳහා විශාල කාර්යයක් කරයි. නමස්කාරය, යාච්ඤාව සහ ශුද්ධ ලියවිල්ල කියවීම පරීක්ෂාවට විරුද්ධව නැගී සිටින ආයුධ වේ. එමෙන්ම අපගේ දරුවන්ගේ දෙවියන්වහන්සේ සමග පවතින ඥාති සම්බන්ධතාවයට ශක්තිමත් ආරක්ෂාවක්ද වන්නේය.

**සාකච්ඡාව සඳහා මග පෙන්වන ප්‍රශ්න :**

1. පවුලේ නමස්කාරයට මුල්තැන දිය හැකි ක්‍රම ලැයිස්තුවක් සාදන්න.
2. අපගේ පවුලේ නමස්කාරය විනෝද ලෙසත් සිත් ඇදගන්නා ආකාරයේ දෙයක් බවට පත් කරන්නේ කෙසේද?
3. ඔබ පවුලේ නමස්කාරයට සහභාගි වීමේදී ඔබට ලැබෙන ප්‍රයෝජන මොනවාද?
4. පවුලේ නමස්කාරය මගින් තරුණ ජීවිතයට කුමන බලපෑමක් කෙරේද?

# 11 නිවසේ ප්‍රේමය

''පුරුෂයෙනි, ක්‍රිස්තුස්වහන්සේ සභාවට ප්‍රේමකොට
ඈ උදෙසා තමන්ම පාවාදුන්නාක් මෙන්ම, නුඹලාත්,
නුඹලාගේ භාර්යාවන්ට ප්‍රේම කරපල්ලා.''
(එපීස 5:25)

එපීස 5:22 පාඨයේ සඳහන් වන කාරණයට පමණක් තම විවාහය සීමාකරන ස්වාමි පුරුෂයෝ සිටිති. ''භාර්යාවෙනි, ස්වාමීන් වහන්සේට මෙන් නුඹලාගේ පුරුෂයන්ට යටත්ව සිටපල්ලා'' (එපීස 5:22). ශුද්ධ ලියවිල්ලේ එක් පාඨයක් ඒ හා සම්බන්ධ වෙනත් පාඨයකින් වෙන් නොකළ යුතු බව ඔවුහු අමතක කරති. එනම් ප්‍රීතිමත් ක්‍රිස්තියානි විවාහයකට දායක වන ප්‍රතිපත්තිවල සුම්හිරි දර්ශනයක් 22-23 පාඨ තුළ අඩංගු සම්පූර්ණ කොටස තුළ ගැබ්වී ඇති බව අපි සැලකිලිමත් වූ විටය.

ස්වාමි පුරුෂයන් තම භාර්යාවට ප්‍රේම කරන්නේ නම් තම ස්වාමි පුරුෂයන්ට යටත්ව සිටීමට භාර්යාවන්ට කිසිම ගැටළු නැති වන්නේය. ''ක්‍රිස්තුස්වහන්සේ සභාවට ප්‍රේම කොට ඈ උදෙසා තමන්ම පාවා දුන්නාක් මෙන්ම ....'' කිතුනු නිවසක ස්වාමි පුරුෂයාගේ පිතෘත්වය බලෙන් කළ යුතු දෙයක් නොවේ. එහෙත් ඔහුට එය ලැබෙන්නේ ප්‍රේමය, එනම් ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමය මෙන්, උසස්ම පූජාව කිරීමට කැපවීම සමගය.

බොහෝ නිවෙස්වල ගැටළුව වන්නේ ප්‍රේමය හිඟකම නිසා නොවේ. එහෙත් කරුණාවන්ත වචන වලින් සහ අංග චලනයන් තුළින් ප්‍රේමවන්ත හැඟීම් ප්‍රකාශ කිරීම හිඟබව නිසාය. විවාහවී වසර 50කට පසුව තම භාර්යාව අහිමි වූ ස්වාමි පුරුෂයෙක් මෙය ඉතා හොඳින් ප්‍රකාශ කරයි. අවමංගල්‍ය උත්සවයට පසුව දේවගැති තුමා මෙම මිනිසා සමග කථා කිරීමට වාඩි විය.

''ජෝන්, මේරි ඉතා හොඳ භාර්යාවක්ව සිටියා නේද?''යි දේවගැතිතුමා ඇසීය.

''ඔව්,'' ජෝන් පිළිතුරු දුන්නේය.

''ජෝන් ඔබ ඇයට ප්‍රේම කළා. එය සත්‍යයක් නොවේද?''

''ඔව්, දේවගැතිතුමනි. මේරි ඉතාම පුදුමාකාර කාන්තාවක්. මම ඇයට ප්‍රේම කළා. මම ඒ බව ඇයට වක්‍රාකාරයෙන් කීවා.''

අවාසනාවකට මෙන් මෙම කථාන්තරය මගින් බොහෝ නිවෙස්වල සිදුවන දෙය පෙන්නුම් කරයි. අපගේ සහකාරියන් අපි ඔවුන්ට කොතරම් ප්‍රේම කරනවාදැයි ඔවුන් දන්නා බව වරදවා ගනිති. එහෙත් ඒ

# අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය

සම්බන්ධයෙන් කිසිවක් ප්‍රකාශ නොකරයි. බොහෝ නිවෙස්වල පවතින වරදවා තේරුම් ගැනීම නැති කිරීමට ප්‍රේමවන්ත වචන හෝ සලකුණක් ප්‍රමාණවත් වේ. හැඟීම් ප්‍රකාශ කිරීමෙන් තොරව ප්‍රේමය වහා බිඳෙන පැළයක් මෙන් වන අතර එය ඉතා දුර්වල ලෙස වැඩේ. ඔබගේ සහකාරිය ඔබගේ ප්‍රේමය ප්‍රකාශ කිරීමට අදම කරන්න. හෙට එය ප්‍රමාද වැඩිවිය හැකිය. මෙම වටිනා අවවාදයට සවන් දෙන්න. ''ඔබගේ නිවස බෙතෙල් මෙන් ශුද්ධවූද කැප කළාවූ ස්ථානයක්ද බවට පත්කරන්න. හදවතේ පස් ප්‍රේමය සහ ආදරය ප්‍රකාශ කිරීමෙන් සෞම්‍ය බවට පත් කරන්න'' (Ellen G. White, Counsels to Parents, Teachers, and Students, p. 114).

## මෙනෙහි කිරීම

**ප්‍රධාන අදහස**

ප්‍රේමය යනු ප්‍රේමවන්ත හැඟීම් තුළින්, කරුණාවන්ත වචන තුළින් සහ අංග චලනයෙන් ප්‍රකාශ කළයුතු දෙයකි. ස්වාමියා සහ භාර්යාව අතර ප්‍රේමය ප්‍රකාශ කිරීම අඩුවූ විට එහි ප්‍රතිඵලය වන්නේ ''ක්‍රියාශීලී නොවන සම්බන්ධයකි''. ඔබගේ නිවස දේව ප්‍රේමය ප්‍රකාශ කරන ස්ථානයක් කරන්න.

**සාකච්ඡාව සඳහා මග පෙන්වන ප්‍රශ්න :**

1. ඔබ එකිනෙකාට ප්‍රේමය ප්‍රකාශ කළාවූ අවසාන මොහොත කවදාද? (ඔබගේ සහකාරයා, දරුවන්, ඥාතීන්) එමෙන්ම ඔවුන් ඔබට එසේ කළාවූ අවසාන මොහොත කවදාද?
2. ඔබ එකිනෙකාට ප්‍රේම සම්බන්ධතා පවත්වාගෙන යන්නේ කෙසේද?

# 12 දරුවන්ට අධ්‍යාපන ලබාදීම

''නුඹේ භාර්යාව නුඹේ ගෙය ඇතුළෙහි ඵලදෙන මිදිවැලක් මෙන් වන්නීය. නුඹේ දරුවෝ නුඹේ මේසේ අවට ඔලීව පැළ මෙන් වන්නෝය.''
(ගීතාවලිය 128:3)

සැමුවෙල් ටේලර් කෝලරජ්, දරුවන්ට ආගමික අධ්‍යාපනයක් අවශ්‍ය නැති බවට තදින්ම අදහස් ප්‍රකාශ කළා වූ කාන්තාවකට කථා කරමින් සිටියේය. ඔවුන්ට ස්වභාවිකව වැඩෙන්නට ඉඩහැරිය යුතුය. එවිට ඔවුහු මුහුකුරා යති; නිවැරදි තීරණ ගනිති. මක්නිසාද ඔවුන් කරන්නේ කුමක්දැයි ඔවුන් දන්නා බැවිනි. මෙම දර්ශනය පැසසිය යුතු බව පෙනේ. එහෙත් සමහර කරුණු පැසසිය යුතු බව පෙනී යයි. එසේ වුවත් එය සාක්ෂි රහිත පදනම් වූ සංකල්පයක් බවට පත්වේ.

කෝලරිජ් එම කාන්තාව කථා කළ දෙයට හොඳින් සවන් දුන්නත් කිසිවක් ප්‍රකාශ නොකළේය. ඉන්පසු ඔහු ඇයට උයන වටේ ඇවිදීමට එන ලෙස ආරාධනා කළේය. එහි වල්පැල වැවී ඇත. ''ඔබ මගේ උයන ගැන කුමක් සිතන්නේද?'' කවියා ඇසීය. ''එය අලංකාරයි නේද?''

''උයනක්? ඔබ මෙය උයනක් ලෙස හඳුන්වනවාද? මම නම් කියන්නේ මෙය වල් පැල, හැදෙන තැනක් කියාය''. ඇය පිළිතුරු දුන්නාය.

''හොඳයි,'' කෝලරිජ් මෙසේ විස්තර කළේය. ''මාස කිහිපයකට පෙර මම ඒවා මුහුකුරා යන තෙක් ඒවාට කැමති ආකාරයෙන් වැඩෙන්නට ඉඩ දුන්නේය. ක්ෂණයකින් ඔහුගේ ආගන්තුකයා එහි අර්ථය වටහා ගත්තාය.

මෙම තද නැති (ස්වතන්ත්‍ර) දර්ශනය අනුව දෙමවුපිය රැකවරණයට කැමැත්ත දක්වන ඥාතීන් මට සිටියහ. ඔවුන්ගේ දරුවන් වැඩිවියට පත්වූ විට කිසිම ආගමක් විශ්වාස නොකිරීම පුදුමයක් නොවීය. මෙම දර්ශනය තරයේ විශ්වාස කරමින් ඒ අනුව දරුවන් හදාගත් බව දෙමවුපියන්ට අමතක වී ඇත. අද ඔවුන්ගේ දරුවන් ආගම ගැන උසුළු විසුළු කරන අතර ඔවුන් තුළ කිසිම සදාචාර හැඟීමක් නැතිවීම ගැන දෙමවුපියෝ කනගාටු වෙති. ඔවුහු සියළු පාලනයන්ට විරුද්ධව කැරළි ගසති.

අපගේ දරුවන්ට ක්‍රිස්තියානි ප්‍රතිපත්ති ඉගැන්වීමෙන්ම ඔවුන් ඒවා පිළිපදීවි යන්න සහතික කළ නොහැකිය. ඒ කෙසේ වුවත් මනුෂ්‍යයා මවන ලද්දේ තෝරාගැනීමේ අයිතිය සතුවය. සමහරු අවාසනාවකට මෙන් වැරදිදේ තෝරා ගනිති (යොහන් 24:15 සහ රෝම 14:12) පාඨ කියවා බලන්න. උනන්දුවෙන්, හිතාමතාම ඉගැන්වීම තුළින් හැකියාවන් වර්ධනය වේ. ක්‍රිස්තියානි මගපෙන්වීමක් නිවසේ තිබියදීත් දරුවෝ වැරදි මාර්ගය තෝරාගනිති. අඩුතරමින් දෙමවුපියෝ ඔවුන්ට හැකි උපරිමයෙන් මගපෙන්වූ බව දනිති.

# අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය

## මෙනෙහි කිරීම

**ප්‍රධාන අදහස**

දෙමවුපියන් සතු වගකීම් වලින් ඉතාමත් අභියෝගාත්මක කාර්යය වන්නේ දරුවන් රැකබලා ගැනීමය. පවුලේ සහ ජීවිතයේ වටිනාකම ඔවුන්ට කියාදීම ඉතාම අපහසු කාර්යයක් වන්නේය. ආත්මික වටිනාකම දරුවන්ට ඉගැන්විය යුත්තේ ජීවිතයේ මුල් අවධියේදීය. මෙය නොසලකා හැරීම මගින් දරුවන්ගේ ජීවිතයට සෘණාත්මක බලපෑම් ඇති කෙරේ.

**සාකච්ඡාව සඳහා මග පෙන්වන ප්‍රශ්න :**

1. අපගේ පවුලේ කුමන වටිනාකම් පුහුණුවීමට අවශ්‍යද?
2. එම වටිනාකම් අපගේ දෛනික ජීවිතයේ සත්‍ය බවට පත් කළ හැක්කේ කෙසේද?
3. තම දරුවන් වැරදි මාර්ගයේ ගිය දෙමවුපියන්ගේ බලාපොරොත්තුව කුමක්ද?

# අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය

## 13 නිවසේ දේවස්ථානය

''ඔවුන්ගේ ගෙදර තිබෙන සභාවටත් ආචාර කරපල්ලා....'' (රෝම 16:5)

පෙරදිග රටක ක්‍රිස්තියානි කාන්තාවකගේ නිවසේ නිවාඩුව ගත කිරීමට ජපානයේ කාන්තාවකට ඇරයුම් ලැබිණි. නිවාඩුව අවසානයේ, බටහිර රටවල මිනිසුන් ජීවත්වන ආකාරය ගැන අමුත්තිය ප්‍රීතිවූයේදැයි ඇයගෙන් එම කාන්තාව ඇසුවාය. ''අනේ ඔව්, මම ඉතා හොඳින් විනෝද වුණා! ඔබගේ නිවස ඉතාම අලංකාරයි,'' එහෙත්, ඇගේ දෑස් ඈතට යොමු කරමින් මෙසේ කීවාය. ''ඔබගේ නිවසේ යම්කිසි වෙනසක් ඇතිකරන යමක් මට අතපසු වුණා. මම ඔබගේ සභාවට ගොස් ඔබ ඔබගේ දෙවියන්වහන්සේට නමස්කාර කරන අයුරු බලා සිටියා. මගේ රටේ සෑම නිවසකම අපගේ දෙවියන්වහන්සේට වැඩ සිටීමට ස්ථානයක් ඇත. අපගේ දෙවිවරු නිතරම අප සමග සිටිති. ඔබගේ නිවසේදී ඔබ දෙවියන්වහන්සේට නමස්කාර කරන්නේද?

අද කිතුනු ගෙවල් දෙවියන්වහන්සේගෙන් තොර බොහෝ ලෞකිකව පවතී.  මිනිස්සු නොමැරී ජීවත්වීමට උත්සාහ දරමින් සිටිති. ඔවුන්ගේ පීඩාකාරී වැඩ නිසා මිනිසුන්ට නමස්කාරය පැවැත්වීමේ පුරුදු පවා අමතක වී ඇත. රූපවාහිනියේ වැඩසටහන් සහ වෙනත් විනෝදජනක වැඩසටහන් ඉතා ආශාවෙන් නරඹති. උත්සව හෝ සාදයන් නිසා දෙවියන්වහන්සේ සමග කාලය ගතකිරීම සමග තරඟකාරී වෙයි. තවදුරටත් පවුලේ සභාව නොවේ. ''මට ඔබගේ නිවසේදී දෙවියන්වහන්සේ අතපසු වුණා.'' මෙම ජපන් කාන්තාවගේ වචන තුළින්, එම කිතුනු නිවසේදී දෙවියන්වහන්සේගේ වැඩසිටීම නොහැඟුණු බව පෙන්නුම් කළේය.

දෙමවුපියන් හැටියට අපගේ යුතුකම සහ අයිතිවාසිකම වන්නේ දරුවන්ට යේසුස්වහන්සේ තුළ ජීවිතය ඉගැන්වීමයි.  ''ඔවුන්ව ක්‍රිස්තුස්වහන්සේගේ මෙහෙය සඳහා සැලකිලිමත් ලෙස, ඥානවන්ත ලෙස, මෘදු ලෙස එම මාර්ගයට යොමු කළ යුතුය.  අපි අපගේ දරුවන්ව උන්වහන්සේගේ මෙහෙය සඳහා ඇති දැඩි කිරීමට පූජනීය ගිවිසුමකට යටත් වෙමු. ඔවුන්ට සේවය කිරීමේ ජීවිතයක් තෝරාගැනීමට මගපෙන්වන ආකාරයේ බලපෑමක් ඔවුන් වටා ඇති කිරීම සහ ඔවුන්ට ඒ සඳහා අවශ්‍ය පුහුණුව ලබා දීමත් අපගේ වගකීමය.'' (The Adventist Home, p. 484).

දෙවියන්වහන්සේට ගෞරවය ලබා දුන්නාවූ නිවසකින් පැමිණි තිමෝති තුළින් පාවුළු තුමා හොඳම සහකාර සේවකයෙකු දුටුවේය. ඔහු මෙසේ ලීවේය. ''ඒ ඇදහිල්ල පළමුකොට නුඹේ ආච්චි වූ ලොයිස්

# අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය

තුළද, නුඹේ මෑණියන් වූ එවුනික් තුළද වාසය කළාය. නුඹ තුළත් එය වාසය කරන බව විශ්වාස කරගෙන සිටිමි'' (2 තිමෝති 1:5). අපරාධකරුවන්, මිනීමරුවන් සහ කිසිම වටිනාකමකින් තොර මිනිසුන් බිහිකරන නිවෙස් ඇත. සමාජයට වටිනාකමක් ඇති දූ පුතුන් බිහිකරන තවත් නිවෙස්ද ඇත. ඔවුහු තිමෝති මෙන් ඇදහිල්ලේ යෝධයෝ වෙති. මව්වරු සහ පියවරු දරුවන්ගේ චරිත හැඩගස්වන ඒජන්තවරුන් මෙන් දෙවියන්වහන්සේ පත්කරන ඒජන්තවරුන් වෙති. ඔබගේ නිවසෙහි දෙවියන්වහන්සේ වැඩවසන සේක්ද?

## මෙනෙහි කිරීම

### ප්‍රධාන අදහස

නියම වශයෙන් නිවසක් එහි සාමාජිකයින් දේවදූතයින් සහ දෙවියන්වහන්සේ සමග ජීවත්වන ස්ථානයක් විය යුතුය. ක්‍රිස්තියානි සංගීතය නාද වන්නේය. ප්‍රේමවන්ත බස් ඇසෙන්නේය. කරුණාවන්ත ක්‍රියා දැකීමට ලැබෙන්නේය. අපගේ දිනපතා ජීවිත තුළින් මැවුම්කාරයාණන්ගේ චරිතය පෙන්නුම් කරන්නේය.

**සාකච්ඡාව සඳහා මග පෙන්වන ප්‍රශ්න :**

1. අපගේ නිවස යේසුස්වහන්සේ ජීවත්වීමට කැමති ස්ථානයක් බව පෙන්නුම් කරන්නේ කෙසේද?
2. අපි අපගේ ඇදහිල්ලෙන් ශක්තිමත් වන්නේ කෙසේද?
3. යේසුස්වහන්සේ සමග ඇති සම්බන්ධතාවයේදී ඔබට කුමන අංශයෙන් වර්ධනය වීමට අවශ්‍යද?

## 14 විවාහ අසාර්ථක වන්නේ ඇයි?

''එබැවින් දෙවියන්වහන්සේ එක් කළ දෙය මනුෂ්‍යයා නොකෙරේවා.'' (මාර්ක් 10:9)

අපි අඳුනන අයෙක් ඔහුගේ/ඇයගේ සහකාරයාගෙන් වෙන්වීම ගැන දැනගත්විට අපි දුකට පත්වෙමු. කනගාටු වෙමු. අපගේ සිතිවිලි වලට එම යුවළගේ මංගල්‍ය උත්සවය සහ දුන් පොරොන්දු මතක් වේ. මතක සටහන් අතරට, මල් පොකුරු, මංගල ඉදිරියට ඇවිදීම, මංගල සාදය. මනාලියගේ පැමිණීම වැනි අවස්ථා එක්වෙයි. එය ප්‍රීතිමත්, සතුටුදායක අවස්ථාවක් වෙයි. යුවළ විවාහ අල්තාරය ඉදිරිපිට සිටගෙන සිටිද්දී දේවගැතිතුමා අවවාදාත්මක වචන ප්‍රකාශ කරයි. අපි සමහරු දේවගැතිතුමාගේ අවවාද වලට අපගේ අවවාද ද එක් කිරීමට කැමති වෙමු. එනම් වසර 15, 20, 40ක් පමණ කාලයක් විවාහවී සිටින අපි ඔවුන්ට උපකාර කරමු. මක්නිසාද, ඔවුන් අනාගතයේදී මුහුණ දෙන නාට්‍ය සහ සටන්වලට සම්පූර්ණයෙන්ම නුපුරුදුය.

නිවසක් සාමාන්‍යයෙන් එක්වරම නොව යම්කිසි කාලයක් තුළදී සකස් වන්නේය. එය සෑහීමට පත් නොවීම, වරදවා තේරුම් ගැනීම සහ කුඩා සිත් රිදීම වැනි වර්ධනය වීමේ දේවල්වල එකතුවකි. එවිට ක්ෂණයකින්ම එක් අයෙක් තමාට තවදුරටත් ඉවසිය නොහැකි බව තීරණය කරයි. ඔවුහු එකිනෙකාට ඇති සියළු ගෞරවය නැතිවී ගොස්ය. කෙතරම් ඛේදජනකද! එය වඩා මහත්වූ ඛේදජනක අවස්ථාවක් බවට පත්වන්නේ විවාහය ක්‍රමයෙන් ගිලිහී යන බවට එක් සහකාරයෙකුට නොහැඟී යාමයි. විවාහය අපගේ සෞඛ්‍යය හා සමාන බව යමෙක් පවසා ඇත. ඔබට එය අහිමිවන්නේ එය නැතිවී ගිය පසුය. බොහෝ අය, ''අපගේ විවාහය අසාර්ථක වුණා යැයි කියනු අප බොහෝ විට අසා ඇත. අසාර්ථක වන්නේ විවාහ මංගල්‍යය නොවෙයි. එහෙත් විවාහ මංගල්‍යයෙන් පසු සහකාරයින් අසාර්ථක වෙයි.

දික්කසාදය මුළු ලොව වටාම සිදුවන යථාර්ථයකි. සංඛ්‍යා ලේඛනවලට අනුව ඒවා සීග්‍රයෙන් වැඩිවන අතර ගණන් ගනු නොලබන එම පවුල්වල දරුවන් පිළිබඳ ඇතිවන්නේ හදවත් කම්පනයකි. ඒවාට හසුවන සත්‍ය ගොදුරු වන්නේ ඔවුන්ය. මාගේ බිරිඳවන ලුසියා, ගුරුවරියකි. ඇය කටයුතු කරන්නේ 'dyslexia' (එනම් වචන අන්ධතාවය) රෝගයට ගොදුරු වූ දරුවන් සමගය. ඇය දකින්නේ දෙමවුපියන් දික්කසාදය මෙයට බලපාන බවයි. ඇය එම දරුවන් සමග කටයුතු කිරීමේදී ඇයට ඒ බව හැඟී යයි. ඔවුන්ගේ ලකුණු මට්ටම් ඉතා පහත්ය. මෙම දරුවෝ ඉගෙනීමට ආශාවක් නොදක්වති. ඔවුහු පාසැලේ අනෙක් ක්‍රියාකාරකම්වලට සහභාගි වීමට අකමැති වෙති. ඔවුහු කෝප වෙති. දුක් වෙති. මනස අවුල් ස්වභාවයක් දරති. කොලොම්බියා විශ්ව විද්‍යාලයේ, කෙනත් ජොන්සන් නමැත්තා මෙසේ පැවසුවේය.'' (300,000) ලක්ෂ තුනක් වූ දරුවන් (අද මිලියනයකට අධික සංඛ්‍යාවක්) ප්‍රමාණයක් වසරකට මාරාන්තික ලෙඩ රෝගවලට ගොදුරුවීම ගැන සිතා බලන්න. දික්කසාදයේ ප්‍රතිඵල වන එම දරුවෝ මානසික

වශයෙන් ආබාධිතව, කම්පනයට පත්වූ අය වෙති. දික්කසාදයේ ප්‍රතිඵල සමග සංසන්දනය කර බලන විට ශාරීරික ආබාධිතකම බොහෝ සුළු දෙයකි.''

දික්කසාදයේ ප්‍රතිඵල වන දරුවන් ගැන කථා කරද්දී ලොස් ඇන්ජිලොස්, Times සඟරාවේ ලිපියක් මෙසේ සඳහන් කළේය. ''ප්‍රේමයෙන් බැඳීම නම් ලියාපදිංචි කිරීම සහ විවාහවීම යන කරුණු ඉතා බරපතල තීරණවේ. එහෙත් සමහර තරුණයෝ විවාහ ජීවිතයට ඇතුල් වන්නේ, පොප්කෝන් විකුණන්නාවූ කරත්තයකට සහායකයෙකු තෝරන ආකාරයෙනි. සෑම සිවුපාවෙකුටම පොදු වූ දෙයක් වන ලිංගික ආශාව මගින් ප්‍රේමය සහ ආදරයේ ස්ථානයට පත්වෙයි.''

නිවසක ඇතිවිය හැකි විනාශකාරී මූලාරම්භ ක්‍රම සතරක් තිබෙන බව යම් පුද්ගලයෙක් පැවසීය. කාලය පිළිබඳ ගැටළු, එනම් එම යුවළ නමස්කාරය සඳහා කාලය නොයෙදීමය. මූල්‍ය ගැටළුඃ සත්‍ය ක්‍රිස්තියානි භාරකාරත්වයෙන් එය කළමනාකරණය නොකිරීමය. නිවසින් පිට සමාජ ජීවිතය පිළිබඳ ගැටළු සහකාරයින් දෙදෙනාම මිතුරන් සමග වැඩිපුර කාලයක් ගත කරමින් ඔවුන්ගේ සහකාරයාව අන් අය ඉදිරියේ විවේචනය කිරීමය. නිවසක සම්බන්ධතාවය තුළ ඇති විය හැකි අවසාන ගැටළුව වන්නේ කුඩා අවධානයක් යොමු කර ප්‍රේමය වර්ධනය කිරීම නොසලකා හැරීමය. හොඳින් වර්ධනය වී, ක්‍රිස්තුස්වහන්සේ වැඩසිටින එම නිවසේ සතුට සහ සුවඳ එළිදරව් කළ හැකි ඉතා අලංකාර ප්‍රේමය නමැති එම පැළය ආරක්ෂා කිරීමට අසමත් වීම නිසාය.

''උන්වහන්සේ මහිමයට මහිමය දෙනසේක. එවිට සැපයුමේ කිසිම හිඟයක් නොවන්නේය'' (The Desire of Ages, p. 148).

## මෙනෙහි කිරීම

### ප්‍රධාන අදහස

විවාහය බරපතල ලෙස පිළිගත යුතුය. එය දෙවියන්වහන්සේ ආශිර්වාද කළාවූ පුැෂයා සහ ස්ත්‍රිය අතර පවතින ඉතා පුදුමාකාර ඥාති සම්බන්ධයකි. විවාහය, ඉතා ලස්සන මලක් මෙන් වර්ධනය වී දෙවියන්වහන්සේගේ ප්‍රීතිය සහ සුවඳ විහිදුවන ආකාරයට වගා කළ යුතුය.

**සාකච්ඡාව සඳහා මග පෙන්වන ප්‍රශ්න :**

1. විවාහය ජීවිතය පුරා පවත්වා ගැනීමට අපට කළ හැක්කේ කුමක්ද?
2. අපගේ දරුවන්ට මානසිකව, ආත්මිකව, ශාරීරිකව සහ හැඟීම්බරව වර්ධනය වීමට අපි ඔවුන්ට උපකාර කළ හැක්කේ කෙසේද?
3. අපි අපගේ පවුල සමග වැඩි කාලයක් ගත කළ යුත්තේ ඇයි?

# අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය

## 15 පවුලේ නමස්කාරය අතපසු නොකළ යුතුය.

''..... සියල්ල භුක්ති විඳින පිණිස අපට බහුල ලෙස දෙන්නාවූ දෙවියන්වහන්සේ කෙරෙහි බලාපොරොත්තුව සිටින්ටත්....'' (1 තිමෝති 6:17)

අපගේ නිවසේ ජීවිතය සහ සමාජය හා ඇති සම්බන්ධය කිතුනු ආගමේ ප්‍රතිපත්ති මගින් පාලනය කෙරෙන්නේ නම් සහ ක්‍රිස්තුස්වහන්සේගේ යටහත් පහත් බව සහ සරල බව විදහා දක්වන්නේ නම් අපි බොහෝ සෙයින් ප්‍රීතිමත් වන අතර වඩ වඩා සඵලදායි වේ. අපගේ ප්‍රියජනකභාවය, අනුකම්පාසහගත බව සහ ප්‍රේමය මගින් අපි අප වටා සිටින අය සතුටු කිරීමට උත්සාහ දරන බව ආගන්තුකයෝ දකිත්වා.

අපි අපගේ අමුත්තන්ගේ සුවපහසුතාවය සහ ප්‍රීතිය රක්ෂා කිරීමට තැත් කරන අතරම, දෙවියන්වහන්සේට අප සතු වගකීම් අතපසු නොකිරීමට වගබලා ගනිමු. කිසිම හේතුවක් නිසාවත් යාච්ඤාවේ පැය අතපසු නොකළ යුතුය. සවස් මුල් භාගයේ පැයක් තුළදී, ඔබට කලබලයෙන් තොරව සහ අවබෝධයෙන් යුක්තව යාච්ඤා කිරීමට හැකිනම්, ඔබගේ ඉල්ලීම් ඉදිරිපත් කොට, ඔබගේ කටහඬ ප්‍රීතිමත් සහ කෘතඥතාවය ඔසවා තබන්න. ක්‍රිස්තියානි නිවසකට බැහැදැකීමට පැමිණෙන සියළුදෙනාම, යාච්ඤා පැය ඉතාම පූජනීය, ඉතාම වටිනා සහ දිනයෙන් ඉතාම ප්‍රීතිමත් පැය බව දකිත්වා! එවැනි ආදර්ශයක් අසාර්ථක නොවේවා.

මෙම නමස්කාරය කාල පරිච්ඡේදයට සහභාගි වන සියළුදෙනා තුළ ශුද්ධ භාවයත්, ඔසවා තැබීමත් සිදුවේ. බොහෝ නොසැලකිලිමත් පුද්ගලයින් තුළ නිවැරදි සිතුවිලි සහ නව එමෙන්ම වඩා යහපත් ආශාවන් පිබිදේ. යාච්ඤා පැය මගින් වෙහෙස වූ ආත්මයට සාමයත්, විවේකයත් ගෙන ඒ. මක්නිසාද කිතුනු නිවසක වාතාවරණය සාමයේ සහ විවේකයෙන් පිරී පවතින බැවිනි.

කිතුනුවෙකුගේ සෑම ක්‍රියාවක්ම මගින් තම ස්වාමීන්වහන්සේව නියෝජනය කිරීමට සහ උන්වහන්සේගේ මෙහෙය ආකර්ශනශීලීවීමට සැලැස්විය යුතුය.

මිනිසුන්ගේ පරීක්ෂාවන් සහ සංකීර්ණතාවයන්ගෙන් දහයකින් නවයක්ම තමාගේම වැරදි ක්‍රියා නිසා තමා මතට ගෙන ආ හෝ සිතින් මවා ගත් ගැටළු වේ. ඔවුන් මෙම පරීක්ෂාවන් ගැන කථා කිරීමට සහ විශාල කොට දැක්වීම නතර කළ යුතුය. කිතුනුවා සෑම කරදරයක්ම සහ බාධා කරන සියළුදේම දෙවියන් වහන්සේට භාර දිය යුතුය. අපගේ අනුකම්පා සහගත ගැළවුම්කාරයාණෝ හට කිසිම දෙයක් නොදැක සිටීමට තරම් කුඩා නොවේ. උන්වහන්සේට දැරිය නොහැකි ප්‍රමාණයට වඩා මහත් වූ කිසිම දෙයක් නැත.

එසේ නම් අපගේ හදවත් සහ නිවාස ක්‍රමවත්ව තබා ගනිමු. ස්වාමීන්වහන්සේට බිය වීම ඥානයේ ආරම්භය වන බව අපි දරුවන්ට උගන්වමු. අපි සතුටු සිතින්, ප්‍රීතිමත්, ක්‍රමවත්, යහපත් ජීවිතයක් මගින්

# අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය

අපි උන්වහන්සේට කෘතඥවී ප්‍රේම කරමු. ''සියල්ල භුක්ති විඳින පිණිස අපට බහුල ලෙස දෙන්නාවූ ....'' (1 තිමෝති 6:17) මේ සියල්ලම අභිබවා අපි, පව්කාර මිනිසා නිසා දුක්වින්දා වූද, ඒ අනුව අපට ස්වර්ගය විවෘත කර දුන්නාවූද අපගේ ප්‍රේමණීය ගැළවුම්කාරයාණන්වහන්සේ කෙරෙහි අපගේ සිතිවිලි සහ අපගේ හදවතේ ප්‍රේමය රඳවා ගනිමු.

යේසුස්වහන්සේ කෙරෙහි ඇති ප්‍රේමය සැඟවිය නොහැක. එහෙත් දර්ශනය වන අතර හැඟෙන දෙයකි. ඉන් පුදුමාකාර බලයක් විහිදෙයි. එමගින් අහිංසක අය නිර්භීත බවටත්, කම්මැලි අය උනන්දුවටත්, අඥානවන්තයින් ඥානවන්ත බවටත් පත් කරන්නේය. එමගින් ගොත ගසන දිව චතුර බවටත්, නිහඬව සිටින අයට නව ජීවනයක් සහ ප්‍රාණවත්කමත් ලබාදෙන්නේය. එමගින් බලාපොරොත්තු සුන් වූ අයට බලාපොරොත්තුවත්, කනගාටුවෙන් සිටින අය ප්‍රීතියටත් පත් කරන්නේය. ක්‍රිස්තුස්වහන්සේට ප්‍රේමය දක්වන තැනැත්තාට වගකීම් සහ ගැටළු උන්වහන්සේ වෙනුවෙන් දැරීමට සිදුවන අතර, එසේ කළ යුත්තේ උන්වහන්සේගේ ශක්තිය තුළිනි.

## මෙනෙහි කිරීම

### ප්‍රධාන අදහස

අපගේ මැවුම්කාරයාණන් සමග සම්බන්ධ විය හැකි එක් ක්‍රමයක් වන්නේ පවුලේ යාච්ඤාව මගිනි. බයිබලය හැදෑරීම මගින් අපට උන්වහන්සේගේ කැමැත්ත අවබෝධ කරගත හැක. අපි පවුලේ යාච්ඤාව නොසලකා හැරිවිට, දෙවියන් වහන්සේ සමග ඇති සම්බන්ධය අපට අහිමි වේ.

**සාකච්ඡාව සඳහා මග පෙන්වන ප්‍රශ්න :**

1. අපට පවුලක් වශයෙන් පවුලේ නමස්කාරය වැදගත් වන්නේ ඇයි?
2. පවුලේ නමස්කාරය මගින් ඔබගේ ජීවිතයට ධනාත්මක වෙනස්කම් ඇති කළේ කෙසේද?
3. අපගේ පවුලේ යාච්ඤාව මීට වඩා සරල, ආකර්ශනීය සහ අර්ථවත් කිරීමට කළ හැක්කේ කුමක්ද?

# අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය

## 16 ප්‍රේමය, කළාවූ වැරදි ගණන් නොගනී

''ප්‍රේමය බොහෝ ඉවසිලිවන්තය. ගුණවත්ය. ප්‍රේමය ඊර්ෂ්‍යාවන්නේ නැත. ප්‍රේමය පාරට්ටු කරන්නේ නැත.'' (1 කොරින්ති 13:4)

අද අපි ඊර්ෂ්‍යාව ගැන කතා කරමු. ඊර්ෂ්‍යාව යනු කුමක්ද? එය හැගෙන අයගේ හදවත් රිදවන වේදනාකාරී හැඟීමකි. එය ඔවුන්ට හැඟීම් පාලනය කරගැනීමට නොහැකි අවස්ථාවකට ගෙන යයි. වෙනත් වචන වලින් විස්තර කරතොත්, ඔවුන් ප්‍රේම කරනවා යයි සිතන පුද්ගලයෙකු අයිති කරගැනීමට ඇති ආශාවයි. ඒ සමගම එම පුද්ගලයා ඔවුන්ට අහිමි වේ යයි බියක් ඇති වේ. එක්වරම බැලූ විට ඊර්ෂ්‍යාව ඉතා ලස්සන, ආලවන්ත හැඟීමක් ලෙස පෙනුනත්, එය ඇත්තෙන්ම සිතීමේ රෝගී අවස්ථාවකි. එය ඉතාම විනාශකාරීය. එමගින් සත්‍ය ප්‍රේමයේ සහ සාමයේ වර්ධනය වළකා දමයි.

(C. Diane) සී. ඩයේන් වරක් මෙසේ කීවේය. ''ඊර්ෂ්‍යාව ප්‍රේමයේ වෛරයේ පණුවාය. සමහරවිට එය මරාදමයි. එහෙත් නිතරම එය රිදවයි.'' මෙය ඉතා හොඳ අර්ථ කථනයකි. ඊර්ෂ්‍යාව නිවසක ජීවත්වන්නේ වෛරය නිසා පැළවුණු බැවිනි. ඊර්ෂ්‍යාව සහ වෙන් කරන්නාවූ දුර අදෘශ්‍යමානය. සාමාන්‍යයෙන්, ඊර්ෂ්‍යාවට තම ජීවිත පාලනය කිරීමට ඉඩ දෙන අයගේ හැඟීම් පාලනය කරගත නොහැකිය. ඔවුන්ව ඉතා පහසුවෙන් අති දරුණු හැසිරීමකට ගොදුරු වෙති. ඔවුන් කළ දෙය කුමක්දැයි ඔවුන්ට හැගෙන විට එය ප්‍රමාද වැඩිය.

ඉතාම සුදුසු වචන වලින් පාවුළුතුමා ''සත්‍ය ප්‍රේමය උඩඟු වන්නේ නැත. අශෝභන ලෙස හැසිරෙන්නේ නැත. තමාගේම කාරණා සොයන්නේ නැත. කෝපවන්නේ නැත. නපුර ගණන් ගන්නේ නැත'' (1 කොරින්ති 13:5) යැයි ලීවේය.

සත්‍ය ප්‍රේමය සහ ඊර්ෂ්‍යාවේ තියුණු නියපොතු වලින් වටකරගත් ප්‍රේමයේ ඇත්තේ කුමන වෙනසක්ද? ඊර්ෂ්‍යාව ආත්මාර්ථකාමී සහ අයිති කරගැනීමේ ආශාවෙන් යුක්තය. සත්‍ය ප්‍රේමය පරාර්ථකාමී වේ. එබැවින් තමාගේම ආශාවන් තෘප්තිමත් කිරීමට තැත් කරන්නේ ඊර්ෂ්‍යාවයි. සත්‍ය ලෙස ප්‍රේම කරන්නා අන් අය වෙනුවෙන් කැපවෙන අතර, විශේෂාකාරයෙන් තමා ප්‍රේම කරන අයගේ යහපත සඳහා කටයුතු කරයි. සත්‍ය ලෙස ප්‍රේම කරන්නා කිසිම හේතුවක් නිසා කෝපවන්නේ නැත. නපුර ගණන් ගන්නේද නැත.

අපට බොහෝ නපුරු ක්‍රියාවලින් වැළකී සිටිය හැකි වන්නේ අපගේ හදවත් තුළට ඊර්ෂ්‍යාවේ ගිනි දළු ඇතුළුවීමට ඉඩ නොහැරීම මගිනි. මක්නිසාද ඉතාම කුඩා ගිනි බුබුලක් මගින් මහත් වූ ගින්නක් ඇති විය

හැකි බැවිනි. එබැවින් කනගාටු වනවාට වඩා ආරක්ෂා වීම යහපති. අපගේ හදවත් තුළ සත්‍ය ප්‍රේමය ඔටුණු පැළඳවීම සඳහා අපට බොහෝ සෙයින් දිව්‍ය උපකාරය අවශ්‍ය වේ.

## මෙනෙහි කිරීම

**ප්‍රධාන අදහස**

ඊර්ෂ්‍යාව මගින් අපව විනාශ මුඛයට ඇද දැමිය හැකිය. අපි ස්වර්ගයේදී සිදුවූ දෙය දෙස බලමු නම්, සාතන්ව ස්වර්ගයෙන් පොළවට ඇද දමනු ලැබුවේ ඊර්ෂ්‍යාව නිසාය. අවසාන වශයෙන් මෙය මුළු මිනිස් සංහතියේම විනාශයට හේතු විය. අපි අපගේ නිවස තුළට ඊර්ෂ්‍යාව ඇතුළුවීමට ඉඩ හැරියොත්, එය පවුලේ ඥාති සම්බන්ධය බිඳ දමන්නේය.

**සාකච්ඡාව සඳහා මග පෙන්වන ප්‍රශ්න :**

1. ඊර්ෂ්‍යාවේ කෲර ප්‍රතිඵල ලැයිස්තුවක් සාදන්න.
2. ඊර්ෂ්‍යාව බිඳ දැමීමට මම කුමක් කරම්ද?
3. අපි එකිනෙකාට ප්‍රේමය සහ කරුණාව පෙන්වන්නේ කෙසේද?

# අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය

## 17 පවුලේ සමාදානය

''යෝසෙප් ඉශ්‍රායල්ගේ වෘද්ධ වයසේ පුත්‍රයා බැවින් ඔහු තමාගේ සියළු පුත්‍රයන්ට වඩා ඔහුට ආදරය වූයේ, අත් ඇති දිග වස්ත්‍රයක් ඔහුට සාදා දුන්නේය''
(උත්පත්ති 37:3)

අන් පවුල්වල මෙන්ම යාකොබ්ගේ පවුලේද ගැටළු පැවතිණි. යෝසෙප් බොහෝ සෙයින් ආදරය ලැබූ පුත්‍රයෙක් විය. එක් දිනක් ඔහුගේ පියා ඔහුට වර්ණවත් අත් දිග වස්ත්‍රයක් තෑගි කළේය. ඔහුගේ සහෝදරයින්ගේ ඊර්ෂ්‍යාව වර්ධනය වෙමින් පැවති අතර මෙය අවසාන අවස්ථාව විය.

ඔවුහු ඔවුන්ගේ පියාගේ රැළට තණ කවමින් සිටියදී තම පියා යෝසෙප්ට දක්වන වැඩි ආදරය අවසන් කිරීමට කුමන්ත්‍රණය කළෝය. යෝසෙප් තම සොහොයුරන් සුවෙන් සිටීද යන්න සොයා බැලීමට පියා යැවූ ආහාරත් රැගෙන පැමිණි විටදී ඔවුන්ගේ සැලැස්ම ක්‍රියාත්මක කළෝය. සියළුම සොහොයුරන්ගේ එකඟත්වයෙන් තොරව වුවද, යෝසෙප්ව වහල්කමට විකුණනු ලැබූ අතර, වයස අවුරුදු 17දී ඔහු මිසරයට ගියේය.

දෙමවුපියන්ට සෑම දරුවෙකුටම එක හා සමානව සැලකීම කළ හැකි කාර්යයක් නොවේ. සෑම දරුවෙකුම හෝ දැරියකට ආවේණික වූ චරිත ගුණාංග ඇත. ඒවා වයස, කැමති දේවල්, සෞඛ්‍යය සහ හැසිරීම අතින් වෙනස් වේ. මෙම කරුණු හේතුකොටගෙන ඔවුන්ගේ දරුවන් එකිනෙකා වෙනුවෙන් විවිධ තෝරාගැනීම් කිරීමට සිදුවේ. අපි එක් දරුවෙකුට ළංවන ක්‍රමය තවත් දරුවෙකුට ඒ ආකාරයෙන්ම හොඳින් සිදුවිය නොහැකිය.

දෙමවුපියෝ මෙවැනි අවස්ථාවක යහපත් සිහියෙන් කටයුතු කළ යුතුය. මේ සඳහා දිව්‍යමය මගපෙන්වීම තරම් කිසිම ක්‍රමයක් යහපත් නොවේ. ඒ අනුව දරුවන් සහ දෙමවුපියන් පිළිබඳ අවබෝධය ලබාගැනීමට සාකච්ඡා අරඹන්න. සැලකිල්ලෙන් කථා කිරීම මගින්, රෝගීව සිටින බාල සොහොයුරා / සොහොයුරියට වඩා මෘදු ලෙස ආදරයෙන් සැලකිය යුතු බව දරුවාට අවබෝධ කරදිය හැක. එසේ වුවත් දෙමවුපියන් එක් දරුවෙකුට විශේෂත්වයක් දැක්වීමෙන් වැළකිය යුතුය. මෙමගින් දරුවන්ගේ චරිත වර්ධනයට මහත් වූ තුවාල සිදුවිය හැක. මක්නිසාද ජීවිතයේ ගැටළු වලට මුහුණ දෙන විට දරුවෙකුට දිළිඳු බවක් සහ යමෙකුගේ උපකාරය අවශ්‍ය බවත් හැඟෙන බැවිනි. ඔවුන් ඊර්ෂ්‍යා කරන දරුවා නිතරම සියළුම දේ සහ සියළුදෙනා සමග සටන්වාදී වීමට පෙළඹෙයි.

දෙමවුපියන් ඔවුන්ගේ දරුවන්ට සමබර සහ සාධාරණ ප්‍රේමයක් පෙන්වූ විට, ඔවුහු සාමයෙන් සහ සමාදානයෙන් පිරි ප්‍රසන්න පරිසරයක් නිර්මාණය කරති. එවිට එම නිවස දේව දූතයින් වැඩ සිටීමට සතුටු වන ස්ථානයක් වන්නේය.

# අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය

## මෙනෙහි කිරීම

ප්‍රධාන අදහස

Every son and daughter has his/her own individual characteristics. Though not easy, parents should treat their children equally to promote an environment of peace and harmony.

**සාකච්ඡාව සඳහා මග පෙන්වන ප්‍රශ්න :**

1. පුතෙක් හෝ දුවෙක් හැටියට ඔබට ඊර්ෂ්‍යා වීමට හෝ කොන් කරන ලද බවක් හැඟීමට කුමන දෙයක් බලපාන්නේද?
2. දෙමවුපියන් නිවසේ වැඩි ඇල්මක් දැක්වීමෙන් වැළකීම සඳහා කුමක් කළ යුතුද?
3. පවුලේ සමාදානය ඇති කිරීමට දෙමවුපියන් සහ දරුවන් කෙසේ ක්‍රියා කළ යුතුද?

# අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය

## 18 නිවසෙහි කථා බහ

''වංචා මුඛය නුඹෙන් පහකොට, වංක තොල් නුඹෙන් දුරු කරපන්න'' (හිතෝපදේශ 4:24)

වසර ගණනාවකට පෙරදී ''සිලියෝ බොකැන්නෙරා'' නමැත්තෙක් විසින් ''විවාහයක ප්‍රීතිය'' යන මාතෘකාව යටතේ බ්‍රසීලයේ 'පෝටෝ වෙල්හෝ'හි පුවත් පතක පළ කළාවූ වැදගත් ලිපියක් මම කියෙව්වෙමි.... 'ඩෙන්වර්' විශ්ව විද්‍යාලයේ ''හෝවර්ඩ් මාර්ක්මන්'' නමැති මහාචාර්යතුමා ලන්ඩනයේ විවාහය පිළිබඳ විශේෂඥ මහා සමුළුවකදී ඉදිරිපත් කළාවූ කාර්යයක් ගැන ඔහු සඳහන් කළේය. ඔහු සඳහන් කළේ, ''යුවළක් තර්ක කරන ආකාරය අනුව විවාහය කොතරම් සාර්ථක වෙයිද යන්න තීරණය කළ හැකි බවය.'' එනම් ''ස්වාමි පුරුෂයා සහ භාර්යාව ඔවුන්ගේ තර්ක වලදී භාවිතා කරන උපක්‍රම, දික්කසාදයක් වේවිද යන්නට යහපත් ඉඟියක් වෙයි.''

එය වැදගත් වන්නේ මාර්ක්මන් මහාචාර්යවරයා නිතරම පාහේ තර්ක කරන්නාවූ යුවල දහසක් පිළිබඳ අධ්‍යයනය කිරීමයි. ඉන්පසු ඔහු අවසානයේදී කියා සිටියේ, සුළු වැරදිකරුවන් අතර මහා අරගල ඇතිවීමට ඉඩහැර තර්ක කිරීමෙන් පැන යන අය විශාල වශයෙන් අනතුරට ලක්වන යුවළයන් බවය. මෙය ඉතා පොදු කරුණක් බව අපි දනිමු. නාන කාමරයේ සබන් කොතැන තිබිය යුතුද, දන්තාලේප අසුරණය කුමන ආකාරයෙන් මිරිකිය යුතුද වැනි දේවල් ගැන එකඟ නොවන යුවළවල් සිටිති. ඔවුහු ජීවිතයේ වැඩි වැදගත්කමක් ඇති කරුණුවලට බලපාන ආකාරයේ සුළු තර්ක ඇතිවීමට ඉඩ හරිති. අවසානයේදී ඥාති සම්බන්ධය අවසන් වන්නේ වෙන්වීමෙන් හෝ දික්කසාදයෙනි. සමහර අවස්ථාවලදී මාරාන්තික වැරදි පවා කරනු ලැබේ.

බරපතල, එමෙන්ම ගැඹුරු අවධානය අවශ්‍ය වන යමක් මාක්මන් මහාචාර්යතුමා සඳහන් කරයි. ඔහු මෙසේ පවසයි. ''ඥාති සම්බන්ධයක අනෙක් පුද්ගලයාට කරන අපහාස මගින් කරුණාවන්ත ක්‍රියා 5ක් 10ක් හෝ සමහරවිට 20ක් මකා දමනු ලැබේ.''

යම් යුවළක් වෙන්වීමට අදහස් කරන්නේ නම්, ඔවුන් මොහොතකට නැවතී ඔවුන්ගේ දරුවන්ගේ හදවත්වල එම නිසා ඇතිවන තුවාල ගැන සිතිය යුතුය. මව හෝ පියා ඔවුන්ගේ දරුවන්ගෙන් වෙන්වීම ගැන, උදව්, අවවාද සහ මිත්‍ර සම්බන්ධතා දික්කසාදය නිසා ඇතිවීම ගැන සිතිය යුතුය. ඔවුන්ගේ තෝරාගැනීම් අන් අයට කෙසේ බලපාන්නේද යන්න ඔවුන් සිතිය යුතුය.

තාර්කික, බුද්ධිමත් මනුෂයයින් ලෙස අපි කුඩා දේවල් පිළිබඳ තර්ක කිරීමට සුළු කාලයක් යොදවා, සවන්දීමට වැඩි කාලයක් යොමු කරන්න. ඔබගේ සහකාරයාගේ මතය අවබෝධ කරගැනීමට තැත් කරන්න. ඔවුන්ගේ මතවාද දැක්ම ගැන ඔබ එකඟ නොවූවත්, ඔබගේ නිවස තුළ ප්‍රීතිය සහ සාමය

# අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය

ආරක්ෂා කිරීමට උත්සාහ ගන්න. ඔබගේ තත්වය අත්හැර දැමීමට කැමති වන්න. ඉවසීමට පුරුදු වන්න. එකඟවීමට උත්සාහ දරන්න.

අපගේ නිවස තුළ ජීවත්වන අයගේ හදවත්වලට දේව ප්‍රේමයෙන් පොළඹවනු ලැබූ කරුණාවන්ත වචන සහ ප්‍රේමවන්ත ක්‍රියා මගින් ඇති කරන්නාවූ ධනාත්මක ප්‍රතිඵල මෙන් වෙනත් ආදේශයක් නොමැත.

## මෙනෙහි කිරීම

**ප්‍රධාන අදහස**

නිවස තුළදී ධනාත්මක සහ නිරන්තර කථාබහ මගින් පවුලේ සාමාජිකයින්ට සාමයෙන් සහ සමාදානයෙන් එක්ව ජීවත් විය හැකිය.

**සාකච්ඡාව සඳහා මග පෙන්වන ප්‍රශ්න :**

1. දෙමවුපියන් සහ නැතිනම් දරුවන් එකිනෙකා තර්ක කරන විට ඔබට කුමක් හැඟෙන්නේද?
2. ඔබට අවස්ථාවක් ලැබුණොත්, ඔබගේ පවුල ගැන විස්තර කුමන වචනය ඉතාම හොඳ වචනය වන්නේද?
3. නිරතුරු පවුලේ කථාබහ වැදගත් වන්නේ ඇයි?

# 19 අතරමං වූ දරුවන්ද, අතරමංවූ දෙමවුපියන්ද

''ඔවුහු ළදරුවන් පිට උන්වහන්සේගේ අත තබවා ගන්න පිණිස ඔවුන් උන්වහන්සේ ළඟට ගෙනාවෝය. නුමුත් ගෝලයෝ ඔවුන්ට සැර කළෝය. යේසුස්වහන්සේ ඒ දැක ඉතා අමනාප වී ළදරුවන් මා ළඟට එන්ට හැරපල්ලා. ඔවුන් වළක්වන්ට එපා. මක්නිසාද දෙවියන්වහන්සේගේ රාජ්‍යය මෙබඳුවන්ගේය.'' (මාර්ක් 10:13,14)

එක්තරා සුපිරි වෙළඳ සැලක ශබ්ද විකාශනයෙන් මෙවැනි වැදගත් දෙයක් ප්‍රචාරය කළේය. ''අපගේ ඉදිරි මේසය ළඟ කුඩා දරුවෙක් සිටී. ඔහුගේ පියා නැතිවී ඇති අතර ඔහු සොයාගැනිමට ඔහුට නොහැකි බව ඔහු පැවසීය.''

දිනක් උදෑසන තම කුඩා දරුවා නිවසේ නොසිටි බව දැනගත් තවත් යුවළක් සම්බන්ධ කථාවක් ඇත. මවුපියෝ ඒ ගැන තැතිගෙන ඔහුව සෙව්වෝය. එම දරුවා සොයාගැනීමට උපකාර කරන මෙන් අසල්වැසියන්ගෙන් සහ පොලීසියෙන් ඉල්ලා සිටියෝය.

අසල්වැසි සෑම නිවසකම දරුවා සොයනු ලැබීය. කුඹුරුවල සහ වනයේද සෙව්වෝය. එම කුඩා දරුවාගේ සලකුණක්වත් සොයා ගැනීමට ඔවුන්ට නොහැකි විය. සාමාන්‍යයෙන් උදෑසන මෙම යුවළ සහ පවුලේ අය එක්ව ගොස් රැස්වීමකට සහභාගි වන ස්ථානයේ ඔහු සිටිත්දැයි බලන මෙන් එක් පුද්ගලයෙක් ඔවුන්ට කීවේය. ස්ථිරවම, එම කුඩා දරුවා නිවසින් ගෙන ආ කුඩා සෙල්ලම් බඩුවක් අත ඇතිව නිශ්ශබ්දව වාඩිවී සිටියේය. මෙම දෙමවුපියෝ ඔහුව වැළඳගෙන සැනසුම් සුසුම් හෙළුවෝය. මව තම දෑස්වල කඳුළු පිස දමමින් මෙසේ ප්‍රකාශ කළාය. ''මගේ වටිනා පුතා. ඔබ නැති විය. එහෙත් ඔබව සොයා ගත්තෙමු.''

කුඩා දරුවා ඔහුගේ මව දෙස බලා, ''අම්මා, මම නැති වුණේ නැහැ. මම හිටියේ දේවස්ථානයේ,''යි පැවසීය.

මෙම කථාන්තර දෙකෙන්ම ප්‍රකාශ කරන්නේ නැතිවූ දරුවන් ගැන නොව නැතිවූ දෙමවුපියන් ගැනය. සෑම දරුවෙක්ම ඔවුන්ගේ අහිංසක බව සහ පවිත්‍රතාවය තුළින් දෙවියන්වහන්සේ සමග සිටීමට ස්වභාවයෙන්ම ආශාවෙනි. යේසුස්වහන්සේ අනුගමනය කිරීමට දරුවන් තුළ ඇති ආශාව වර්ධනය වීමට අවසර නොදීම නිසා බොහෝ අවස්ථාවලදී දෙමවුපියන් සහ වැඩිහිටියෝ ඔවුන්ගේ ආත්මික වර්ධනයට බාධා කරති.

# අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය

සමහරවිට ගෝලයින් දරුවන්ව නැවැත්වූ විට යේසුස්වහන්සේ ශෝකවූයේ එම නිසා විය හැකිය. ''මෙය දුටු යේසුස්වහන්සේ තදින්ම අමනාපවී මෙසේ කී සේක. දරුවන් මා ළඟට එන්ට හැරපල්ලා.... මක්නිසාද දෙවියන්වහන්සේගේ රාජ්‍යය මෙබඳුවන්ගේය'' (මාර්ක් 10:4). මෙම අනතුරු ඇඟවීම ගැන අපි බැරෑරුම් ලෙස සිතමු!

## මෙනෙහි කිරීම

**ප්‍රධාන අදහස**

දෙවියන්වහන්සේ දරුවන් මත මහත්වූ වටිනාකමක් තබන සේක. මේ නිසාත් ඔවුන්ට අප තුළ ඇති ආදරය නිසාත් ඔවුන්ට හිංසාවක් පැමිණෙනු දැකීමට අපි අකමැති වෙමු. ඔවුන්ගේ සෘණාත්මක තේරීම් හේතුකොටගෙන සිදුවන හානිවලින් ආරක්ෂා කිරීමට ප්‍රේමවන්ත දෙමවුපියෝ ඔවුන්ගේ දරුවන්ට විනයානුකූල ක්‍රියා කරති.

**සාකච්ඡාව සඳහා මග පෙන්වන ප්‍රශ්න :**

1. ඔබ යම් දිනක නැතිවුණිද? ඔබට එවිට කුමන හැඟීමක් ඇතිවීද?
2. දරුවන් තවමත් තරුණ වියේ සිටියදී ඔවුන්ට අපි හරි වැරදි කියා දෙන්නේ ඇයි?
3. දෙමවුපියන් ඔවුන්ගේ දරුවන් තුළ ඇති යේසුස්වහන්සේ අනුගමනය කිරීමට ඇති ස්වභාවික ආශාවට බාධා කරන්නේ කුමන ආකාරයටද?

# අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය

## 20 ඔබගේ නිවසේ ඔවුන් දුටුවේ කුමක්ද?

''එවිට ඔහු (අනාගතවක්තෘවරයා) ඔවුහු නුඹේ ගෙයි මොනවා දුටුවෝදැයි ඇසීය. හෙසකියා උත්තර දෙමින්, මාගේ ගෙයි තිබෙන සියල්ල ඔහු දුටුවෝය. මාගේ වස්තු අතරේ මා ඔවුන්ට නොපෙන්වූ කිසිවක් නැතැයි කීවේය.'' (යෙසායා 39:4)

හෙසකියා බරපතල රෝගයකින් පෙළුණි. එහෙත් ඔහුගේ යාච්ඤාව ඇසූ ස්වාමීන්වහන්සේ ඔහුගේ සෞඛ්‍ය තත්වය නැවත යථා තත්වයට පත්කළ සේක. යෙසායා හෙසකියාට දිව්‍ය අනුග්‍රහය ලැබෙන බව පැවසූ විට, ඒ පිළිබඳ සලකුණක් ඔහු දුන්නේය. ඔහු කියා සිටියේ මාලිගාවේ පියගැට පෙළට වැටෙන සූර්යාලෝකයේ සෙවනැල්ල පඩි දහයකින් ඉහළට යන බවය. මෙම පුදුමාකාර සංසිද්ධිය දුරින් පිහිටි මෙසපොතේමියාවේදී දකිනු ලැබීය. බබිලෝනියේ රජතුමාව සිටි මාර්දුක් බාලදන් හෙසකියාගේ සුවවීම ගැන සුභ පැතීම සඳහා දූතයෙකු යැවීය. මාර්දුක් තුළ වෙනත් බලාපොරොත්තු තිබුණු බව අපි දනිමු. අසිරිය සමග සටන් කිරීමේදී හෙසකියාගේ සහාය ඔහුට අවශ්‍ය විය.

හෙසකියාගේ සැප දුක් සොයා බැලීමට සහ සුභ පැතීමට දූතයින් එවීම ඔහුට ගෞරවයක් ලෙස සැලකුවේය. ඔහු තම වස්තුව සහ ඔහුගේ යුද්ධායුධ ඔවුන්ට පෙන්වීමට ඔහු පසු නොබැස්සේය. තම යථා ස්වභාවය කුමක්ද යන්න ඔප්පු වී ඇති බව නොදත් හෙසකියා සම්පූර්ණයෙන් අසාර්ථක විය. ලේකම් පොතෙහි මෙසේ සඳහන් වේ. ''එසේ වුවත් දේශයෙක් සිද්ධ වුණු ආශ්චර්යය ගැන විභාග කරන්ට බබිලෝනියේ අධිපතීන් විසින් තානාපතියන් ඔහු ළඟට එවූ කල, ඔහුගේ සිතේ තිබුණ සියල්ල දැනගන්න පිණිස දෙවියන්වහන්සේ ඔහු සෝදිසි කිරීමට අත්හැරිය සේක'' (2 ලේකම් 32:31). මේ වන විට අනාගතවක්තෘවරයා රජතුමා වෙත පැමිණ අපගේ ආරම්භක පාඨයේ සඳහන් වන ආකාරයට, ''ඔවුහු නුඹේ ගෙයි මොනවා දුටුවේද?''යි ඇසීය.

අපගේ නිවසට බැහැ දැකීමට පැමිණි පසු මෙම ප්‍රශ්නයම දේවදූතයෝ අපගෙන් අසන්නෝය. ඔවුන්ද, ''ඔවුහු ඔබගේ නිවසේදී කුමක් දුටුවෝදැ''යි අසති. මිනිසුන් ඔබගේ නිවසේදී දකින දේවල් වර්ග තුනකට බෙදා දැක්විය හැකිය. පළමුව, සමහර මිනිසුන්ගේ නිවසෙහි ලෞකික වස්තූන් දකිති. වටිනා ගෘහ භාණ්ඩ, අලංකාර දොර, ජනෙල් ආවරණ සහ සිත් ඇදගන්නා සුළු රිදී භාණ්ඩ ඔවුහු දකිති. එවැනි නිවාස කෞතුකාගාර මෙන් වේ. දෙවනුව, නිවසෙහි ජීවත්වන මිනිසුන් ඔවුහු දකිති. සමහරවිට, ඔවුහු ඉතා මෘදු වූ ගෘහ මූලිකයා, දක්ෂ, උඩඟු බිරිඳක් සහ කාමරයට අධිපතිකම් කරන දඟකාර කුඩා දරුවන් දකිති. අවසානයේදී අමුත්තන් බොහෝ සේ පැහැදීමට පත්වන, එනම් නිවසේ ජීවත් වන මිනිසුන් සහ දේවල් නිසා නොව එහි ඇති වාතාවරණය හේතුකොටගෙන තවත් නිවෙස් ඇත. සමහරවිට එය සාමයෙන් සහ නමස්කාරයෙන් පූර්ණ වී ඇති නිසා විය හැක. මිනිසුන් මෙවැනි නිවසකින් පිටවී යන්නේ දෙවියන්වහන්සේ කෙරෙහි ඔවුන් තුළ පවතින ඇදහිල්ල මගින් ධෛර්යයට පත්වීමෙනි. ඔවුහු එවැනි නිවෙස් තුළ දේව දූතයින්ගේ වැඩ සිටීම අත් විඳිති.

# අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය

එක් අවස්ථාවකදී යෙරුසලම බැහැ දැකීමට ගියාවූ ගීකවරු ඉතා හදිසි ඉල්ලීමක් සමග එක් ගෝලයෙකු වෙත ගියහ. ඔවුහු මෙසේ කීහ. ''මහත්මයාණෙනි, අපි යේසුස්වහන්සේ දකින්නට කැමැත්තෙමු'' (යොහන් 12:21). අපි ඔවුන්ගේ බලාපොරොත්තු සුන්කර දැමිය යුතුද?

දෙවියන්වහන්සේ වෙනුවෙන් සහ උන්වහන්සේගෙන් ලද මහත්වූ ආශිර්වාද ගැන සාක්ෂි දැරීමට තිබූ විශිෂ්ට අවස්ථාවක් හෙසකියා අහිමි කර ගත්තේය. අපිද එම වැරැද්දම කිරීමට සැරසෙන්නෙමු. ''ඔවුහු මගේ නිවසේදී දුටුවේ කුමක්ද?'' යන ප්‍රශ්නය අපි අසමු.

## මෙනෙහි කිරීම

### ප්‍රධාන අදහස

පවුලක් අන් අය වෙනුවෙන් දෙවියන්වහන්සේගේ යහපත් භාවය පිළිබිඹු වන සාක්ෂියක් මෙන් ජීවත් විය යුතුය. උන්වහන්සේ තුළ බැබළෙන, වර්ධනය වන්නාවූ ඥාති සම්බන්ධයක් පිළිබිඹු වන ආකාරයෙන් සෑම සාමාජිකයෙක්ම උන්වහන්සේගේ චරිතය මෙන් චරිතයක් පිළිබිඹු කරත්වා.

**සාකච්ඡාව සඳහා මග පෙන්වන ප්‍රශ්න :**

1. ඔබ ක්‍රිස්තුස්වහන්සේගේ තානාපතිවරයෙක් ලෙස ඔබව දකින්නේද? ඒ ඇයි?
2. ඔබගේ නිවසේදී අන් අය කුමක් දකිනවාට ඔබ කැමතිද?
3. ඔබගේ නිවස ලෝකයේ ආලෝකයක් බවට පත්කළ හැක්කේ කෙසේද?

# අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය

## 21 දරුවන් වෙනුවෙන් කාලය

''පියවරුනි, නුඹලාගේ දරුවන් කලනොකිරෙන පිණිස ඔවුන් කෝප නො කරල්ලා.''
(කොලොස්සි 3:21)

දරුවෙකුට තම ජීවත් වන පියාගෙන් වෙන්වී අනාථයෙකු ලෙස ජිවත් වීම තරම් කෝපකරවන තවත් යමක් නැත යයි මම විශ්වාස කරමි. ඔව්, මේ කියමන ගැන පුදුම නොවන්න! මේ කථාන්තරයට සවන් දෙන්නඃ

කාර්යාලයේ කාර්ය බහුල දිනයක් ගත කළාවූ පියෙකු විවේක ගනිමින් සිටියේය. ඔහු සාලයේ පුටුවක සුවපහසු ලෙස වාඩිවී පුවත්පතක් කියවමින් සිටියේය. ඒ අවස්ථාවේදී ඔහුගේ කුඩා පුතු එම ස්ථානයට පැමිණියේය. ඔහු පියාගේ උරහිස් අල්ලාගෙන මෙසේ කීවේය. ''තාත්තෙ, තාත්තෙ!''

පුවත්පතෙන් තම දෑස් වෙන් කිරීමට අකමැති වූ පියා මෙසේ කීවේය. ''පුතා ඔබට ඕනෑ මොනවාද? ඔබට කොපමණ මුදලක් ඕනෑද?'' දරුවා මෙසේ පිළිතුරු දුන්නේය. ''තාත්තෙ, මට මුදල් අවශ්‍ය නැහැ. මට ඕනෑ ඔබයි.''

මෙවැනිම කථාන්තර බොහොමයක් අපට කිව හැකිය. එහෙත් මේ සියල්ලේම එක් පොදු දෙයක් ඇත. බොහෝ එනම් ගණන් නොකළ හැකි නිවෙස් වල මව සහ පියා මූල්‍යමය සහ රැකියාව පිළිබඳ සාර්ථකත්වය පසුපස හඹා යමින් ඔවුන්ගේ දරුවන් වෙනුවෙන් කාලය වෙන් නොකරති. බොහෝ දෙමවුපියන් සිතන්නේ මූල්‍යමය සාර්ථකත්වය මගින් ඔවුන්ගේ ගැටළු විසඳෙන බවය. ''තාත්තේ මට මුදල් අවශ්‍ය නැහැ. මට ඕනෑ ඔබයි!''

බොහෝ දරුවන් හඬා වැළපෙන්නේ ඒ සඳහායි. මවක් සහ පියෙක් තම දරුවන් සමග ගත කරන කාලයට වඩා වටිනා කාලයක් තවත් නැති බව අපි අවබෝධ කරගත යුතුය. මෙම හැඬීමට පිළිතුරක් වශයෙන්, මවුපියන් තම දරුවන් බලාපොරොත්තු වන අවධානය ලබාදීමට කැමැත්ත ඇති කරගැනීමත්, එය මුල්ම කාර්යය බවට පත් කිරීමත් වෙනුවෙන් සැලසුම් කළ යුතුය.

මම සැලසුම් කිරීම යනුවෙන් අදහස් කළේ දෙමවුපියන් තම දින චර්යාවෙන් යම් කාලයක් දරුවන් වෙනුවෙන් වෙන් කළ යුතු බවය. මෙය තම රැකියාවට ඇති වගකීම සහ කැපවීම හා සමාන පූජනීය මෙන්ම වැදගත් කාලයක් විය යුතුය. එනම් ඔබ ඔවුන් සමග ගතකරන කාලයේ ප්‍රමාණය පමණක්ම නොවේ. ඔබ දරුවන් සමග වටිනා කාලයක් ගත කළ යුතුය.

තම දරුවන් වෙනුවෙන් කාලය වෙන් කිරීමට මුල්තැන දීමේදී නොපසුබට උත්සාහය අවශ්‍ය වේ. එහෙත් ඔබ මතක තබාගත යුතු කරුණක් ඇත. එනම්, ඔබගේ දරුවන් වෙනුවෙන් ප්‍රේමය, කාලය සහ කරුණාව

# අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය

වෙනුවෙන් ක්‍රියා කිරීමට කිසි දිනක ප්‍රමාද වැඩි නොවන්නේය. නියම කාලයේදී අපි ඔවුන් වෙනුවෙන් යෙදවූ සියළු දේ ඔවුහු අපට නැවත ආපසු ලබා දෙන්නෝය. ඔවුන් යම් දෙයක් පිළිගන්නෝය. එනම් අපි ඔවුන්ට මිලදී නොගත හැකි යමක්, එනම් ප්‍රේමය ඔවුන්ට ලබා දුන් බවය.

## මෙනෙහි කිරීම

### ප්‍රධාන අදහස

දරුවන්ට, 'ප්‍රේමය' යන්නට අකුරු සතරක වචනයකි. එනම් T - I - M - E (කාලය). සෑම දිනකම කාර්යයන් අතරට තම දරුවන් වෙනුවෙන් ප්‍රමාණවත් සහ සාරවත් කාලයක් දෙමවුපියන් වෙන් කළ යුතුය. එය ඔවුන්ගේ ඉතාම වැදගත් කාර්යයන් අතර මුල්ම කාර්යය විය යුතුය.

**සාකච්ඡාව සඳහා මග පෙන්වන ප්‍රශ්න :**

1. රැකියාවේ නියුක්ත මවක් හෝ පියෙක් ලෙස, ඔබගේ දරුවන් සමග සාරවත් කාලයක් ගත කිරීමට කාලය වෙන් කරන්නේ කෙසේද?

2. දෙමවුපියන්ට: ඔබගේ දරුවන් සමග අර්ථවත් කාලයක් ගත කළ හැකි ක්‍රම ලැයිස්තුවක් සාදන්න. දරුවන්ට : දෙමවුපියන් සමග අර්ථවත් කාලයක් ගතකළ හැකි ක්‍රම ලැයිස්තුවක් සාදන්න.

# අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය

## 22 ප්‍රේමයේ ගීතයක්

''බොහෝ වතුර වලින් ප්‍රේමය නිවන්ට බැරිය. ගංගාවලට එය යට කරන්ටත් බැරිය. මනුෂ්‍යයෙක් ප්‍රේමය දිනාගන්ට තමාගේ ගෙයි සියළු සම්පත දෙතත්, ඔහු සහමුලින්ම සුළු කරනු ලැබේ.''
(සාලමොන්ගේ ගීතිකාව 8:7)

මම මෙය ලියනවිටදී, 'වෙස්ටා' සහ මම විවාහ වී අවුරුදු 40ක් ගතවෙමින් පවතී. අපගේ එක්වීම සුවිශේෂී, ප්‍රීතිමත් සහ ස්වර්ගීය ආශිර්වාද ලද්දක් විය. එය අප කළ දෙයක් නොව ස්වාමීන්වහන්සේගේ කාර්යයක් බව මුලින්ම පිළිගත්තේ අපිය.

අපගේ ස්වර්ගීය පියාණන්ට පසුව මගේ මෙලොව පියාණන්ට අපගේ ප්‍රීතිය ගැන සම්මාන දිය යුතුය. මගේ පියාට ප්‍රීතිමත් නිවසක උපත ලැබීමේ වාසනාවක් නොතිබුණි. ඔහු මවගේ දැතේ ළදරුවෙක්ව සිටියදී ඔහුගේ මව සහ පියා දික්කසාද විය. එහෙත් එක් දිනක් මගේ පියා ඔහුගේ හදවත සම්පූර්ණයෙන්ම දෙවියන්වහන්සේට භාර දුන්නේය. ඔහු දෙවියන්වහන්සේට සේවය කිරීමට තීරණයක් ගත්තේය.... ඊට වඩා වැඩි කිසිවක්, අඩු කිසිවක් හෝ කිසිම දෙයක් නොවේ! එහි ප්‍රතිඵලයක් ලෙස මගේ පියාට දෙවියන්වහන්සේ මව වෙත යන මාර්ගය පෙන්වා දුන් සේක. ඇයද ඇගේ ජීවිතය සම්පූර්ණයෙන්ම දෙවියන්වහන්සේට කැපකර තිබුණාය. එබැවින් ස්වාමීන්වහන්සේ ඇය පියා වෙත යැවූ සේක. ඉන් පසු වසර ගණනාවකදී එක්වරක්වත් හෝ ඔවුන් තර්ක කරනු මම දැක නැත. මම වැඩිහිටියෙකු වූ විට මම පියාගෙන් මෙසේ ඇසුවෙමි. ''ඔබ අම්මා සමග කිසි දිනක තර්ක කර නැද්ද?'' ඔහුගේ පිළිතුර මා විශ්මයට පත් කළේය.

ඔව්, අපි තර්ක කර ඇත්තෙමු. එහෙත් දරුවන් ඉදිරියේ අපි කිසිවිටක තර්ක නොකළෙමු. අපට කුරුසිය පාමුල දණින් වැටී නිහතමානීව විසඳා ගත නොහැකි වූ කිසිම ගැටළුවක් නැත.''

අපි දරුවන් ලෙස නිවසෙහි වැඩුණු කාලයේදී මගේ දෙමවුපියෝ අප ඉදිරියේ ඔවුන් එකිනොකට දක්වන ඇල්ම සහ ප්‍රේමය විවෘතව ප්‍රකාශ කර ඇත. ඔවුන්ගේ මහළු වියේදී, අපි ඔවුන්ව අපගේ නිවසට කැඳවා ආපසු ද ඔවුන්ගේ ප්‍රේම සම්බන්ධතා දිගටම පැවතිණි. දරු මුණුපුරන් ද මෙම ප්‍රේමය දුටුවෝය. වෙස්ටා සහ මමද අපගේ මංගල දිනයේ සිටම එම ආදර්ශය අනුව ජීවත්වීමට උත්සාහ ගත්තෙමු. ජීවිතය ස්ථිර නොවන බව අපි දනිමු. අපට යම් දෙයක් සිදුවුවහොත් අන් අයට අපගේ අවසාන මතකය ප්‍රීතිමත් එකක් වීම දැකීමට අපි කැමැත්තෙමු.

පාපාකාරී ලෝකයක යම් යම් දේවල් එක රාත්‍රියකින් වෙනස් වන බව අපි දන්නෙමු. එබැවින් ජීවිතයේ අස්ථිරභාවය එය නම්, ''මාංශය තුළ විශ්වාසය නොතබන්න'' (පිලිප්පි 3:3). අපි මෙය දනිමු. ''ස්වාමීන් වහන්සේ ගෙය නොසාදන සේක් නම්, සාදන්නෝ නිෂ්ඵලයේ වෙහෙසෙති. ස්වාමීන්වහන්සේ නුවර ආරක්ෂා නොකරන සේක් නම්, රැකවලා නිශ්චලයේ අවදිව සිටියි'' (ගීතාවලිය 127:1). අපි අපගේ ජීවිත

# අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය

සම්පූර්ණයෙන්ම දෙවියන්වහන්සේට සෑම මොහොතකම කැප කළහොත් අපට ආරක්ෂාව ඇති බව අපි දනිමු. අපි තීරණය කර ඇත්තේ එසේ කිරීමටය. ඔබගේ තීරණයද මෙයම වේවා!

## මෙනෙහි කිරීම

### ප්‍රධාන අදහස

ඩොනල්ඩ් සහ වෙස්ටාගේ විවාහයේ සාර්ථකත්වයට විශේෂ වූයේ ඔවුන්ගේ ජීවිත තුළ සහ ඥාති සම්බන්ධය තුළ දෙවියන්වහන්සේට මුල් තැන දීමය. දෙවනුව, ඩොනල්ඩ්ගේ දෙමවුපියන් ඔවුන්ට හිමිකර දුන් ආදර්ශය ඔවුන්ගේ දරුවන්ට සහ මුණුබුරු මිණිබිරියන්ට හිමිකර දුන් ඉතාම හොඳ උරුමයද විය.

**සාකච්ඡාව සඳහා මග පෙන්වන ප්‍රශ්න :**

1. විවාහයේ සාර්ථක ප්‍රතිඵල ලැබීමට ක්‍රිස්තුස්වහන්සේගේ වැඩ සිටීම වැදගත් වන්නේ ඇයි?
2. ඔබගේ විවාහ සම්බන්ධය වර්ධනය කරගැනීමට සහ පවත්වාගෙන යාමට කළ හැකි දේවල් ලැයිස්තුවක් ලියන්න.
3. ඔබ විවාහ ගැටළු සාමකාමී ලෙස විසඳන්නේ කෙසේද?

# අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය

## 23 නිවස, ප්‍රේමය ඇති ස්ථානයක්

''යාකොබ් රාබෙල් උදෙසා සත් අවුරුද්දක් වැඩ කළේය. ඔහු ඈට ඇති ආදරය නිසා ඒ සත් අවුරුද්ද ස්වල්ප දවසක් මෙන් ඔහුට හැඟුණේය.''
(උත්පත්ති 29:20)

අහස්යානා දෙකක් හෝ තුනක් ගැටුණු විටකදී හෝ හිංසාකාරී පැහැර ගැනීම් සිදුවූ විටකදී වඩා ආරක්ෂිත ක්‍රම යොදවන මෙන් මාධ්‍යය මගින් ඉල්ලීම් කරනු ඔබ දැක ඇත්ද? දේශපාලනඥයෝ කලබල වෙති. රජය ආරක්ෂක කටයුතු තර කිරීමට උත්සාහ ගනිති. අපේ ලෝකයේ ඇති කැඩුණු බිඳුණු (පවුල්) නිවාස, දූකට පත්වූ සියළුම දරුවන්, පිළියම් නොකළ හැකි තුවාල වූ හදවත් වැනි දේවල් දකින ඔබට අපගේ සභාවට සහ පවුල්වලට මීට වඩා හොඳ ආරක්ෂක නීති අවශ්‍ය බව නොවැටහේද?

වරක් එක් මිනිසෙක් තම දරුවන් වෙනුවෙන් කළ හැකි හොඳම දෙය කුමක්දැයි සාකච්ඡා කිරීම සඳහා අනුශාසකවරයෙකු වෙත ගියේය. තම දරුවන් කුමන අධ්‍යාපනයක් ලැබිය යුතුද, ඔවුන් කුමන පාසැලේ ඉගෙනුම ලැබිය යුතුද, ඔහු ඔවුන්ට කුමන සංස්කෘතික අගයන් ලබා දිය යුතුද යන්න දැනගැනීමට ඔහුට අවශ්‍ය විය. කෙසේවෙතත්, අනුශාසකයාගේ ප්‍රතිචාරයෙන් ඔහු පුදුමයට පත්විය. ඔහු මෙසේ කීවේය. ''පියෙකු තම දරුවන් වෙනුවෙන් කළ හැකි හොඳම දෙය වන්නේ ඔවුන්ගේ මවට ප්‍රේම කිරීමය පියා සත්‍යයෙන්ම මවට ප්‍රේමකරන නිවසක ජීවත්වන දරුවා ආශිර්වාද ලත් දරුවෙකි. එය විශාල චෙක්පතක් ලියන්නාවූ පියෙකුට වඩා බොහෝ සෙයින් වටිනේය.''

ප්‍රීතිමත් විවාහයක සිට දේවගැතිවරයෙකු ඉදිරිපිටට හෝ උසාවියේ විනිශ්චයකාරවරයෙක් ඉදිරිපිටට මගපෙන්වීම, මනුෂ්‍යයෙක් ගමන් කළ යුතු පාරවල් වලින් ඉතාම ඛේදජනක මාවතකි.

''පවුලක බැඳීම මෙලොව ඇති බැඳීම් අතරින් ඉතාම කිට්ටු මෘදු සහ පූජනීය බැඳීමක් වන්නේය. එය සැලසුම් කරන ලද්දේ මිනිස් ජාතියට ආශිර්වාදයක් ලෙසය. එය ආශිර්වාදයක් වන්නේ විවාහ ගිවිසුමට බුද්ධිමත් ලෙස පිවිසෙන විටය. එපමණක් නොව එසේ කළ යුත්තේ දේව බිය ඇතිව, එහි වගකීම් පිළිබඳ තමා ඉතා සැලකිලිමත් වීමෙනි.'' (Ellen G. White, The Ministry of Healing, pp. 356, 357).

අපගේ නිවස ප්‍රේමය සහ සාමයෙන් පිරි ස්ථානයක් කරමු. අන් අයගේ ප්‍රේමය බලෙන් ඉල්ලනවා වෙනුවට අපි අපගේ ප්‍රේමය දක්වමු. එවිට ප්‍රීතිමත් ස්ථානයක ජීවත් වීම කොතරම් යහපත්ද යන්න අපට එවිට හැඟෙන්නේය.

# අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය

## මෙනෙහි කිරීම

ප්‍රධාන අදහස

ක්‍රිස්තුස්වහන්සේ මධ්‍යස්ථානය කරගත් නිවස ලෝකයේ ඇති ඉතාම අලංකාර දේවල් වලින් එකකි. විවාහ ගිවිසුම බිඳ වැටුණු විට බොහෝ සෙයින් ඉන් දුක් විඳින්නේ දරුවන්ය.

**සාකච්ඡාව සඳහා මග පෙන්වන ප්‍රශ්න :**

1. දරුවන් තම දෙමවුපියන් වෙන්වූ විට ශෝකයට සහ දුකට පත් වන්නේ ඇයි?
2. ස්වාමි පුරුෂයෙක්, භාර්යාවක් සහ ඔවුන්ගේ දරුවන් ඔවුන්ගේ නිවස ප්‍රේමයෙන් සහ සාමයෙන් පිරි ස්ථානයක් කරන්නේ කෙසේද?

''මක්නිසාද, උසස් වූ, උත්කෘෂ්ට වූ සදාකාලයෙහි වසන්නාවූ ශුද්ධය යන නාමය ඇති තැනැන්වහන්සේ මෙසේ කියන සේක. මම උසස්වූ ශුද්ධ වූ, ස්ථානයෙහිද යටහතුන්ගේ ආත්මය ප්‍රාණවත් කරන්ටත්, පොඩිවී සිටින්නන්ගේ සිත ප්‍රාණවත් කරන්ටත් තැළුණාවූ යටහත් ආත්මයක් ඇත්තා සමග වාසය කරමි.''

(යෙසායා 57:15)

# 24 දෙවියන්වහන්සේගේ නිවස

1791දී ජෝන් හාවර්ඩ් පේයිනි නිව්යෝර්ක්හි උපත ලැබුවේය. ඔහු ඇමරිකා එක්සත් ජනපදයේ පමණක් නොව එංගලන්තයේ සහ ප්‍රංශයේද ඉතා ප්‍රසිද්ධ රංගන ශිල්පියෙක් බවට පත්විය. 1842 සිට 1845 දක්වාද, නැවතත් 1851 සිට 1852 දක්වාද ඔහු උතුරු අප්‍රිකාවේ ටියුනීෂියාවේ ඇමෙරිකානු කොන්සල් වරයෙකුව සිටියේය. ඔහු එහි සේවය කරමින් සිටියදී මියගිය අතර ඔහුව භූමදාන කරනු ලැබුවේද එම ස්ථානයේදීමය. එහෙත් 1882 වර්ෂයේදී ඔහුගේ මෘත දේහය ඇමරිකාවට ගෙන යනු ලැබූ අතර එම රටෙහි අගනුවර පිහිටි ඩම්බාර්ටන් ඕක්ස් සුසාන භූමියේ ප්‍රසිද්ධ පුද්ගලයින් අතර භූමදාන කරනු ලැබීය.

ඔහුගේ භූමදානය සිදුකළ දිනයේදී එම අවස්ථාවට ගෞරව කිරීම සඳහා වොෂින්ටන් ඩී.සී. හි පිහිටි කොන්ග්‍රසය සහ ශ්‍රේෂ්ඨාධිකරණය ඔවුන්ගේ කාර්යයන් නවතා දැමූහ. එමෙන්ම ජනාධිපති තුමා, උප ජනාධිපතිතුමා සහ කැබිනට් මණ්ඩලයේ සාමාජිකයන්ද පෙන්සිල්වේනියාවේ අවමංගල්‍ය පෙළහරට සහභාගි වූහ. ඔහුට මෙවැනි මහත්වූ ගෞරවයක් අත්වීමට හේතුව කුමක්දැයි ඔබට සිතාග හැකිද? එය එසේ වූයේ ඔහු ප්‍රසිද්ධ පුද්ගලයෙක් නිසාද? අහෝ නැත! එසේත් නැත්නම් ඔහු ගෞරවණීය කොන්සල්වරයෙකුව සිටි නිසාද? අහෝ නැත! ඔබට අනුමාන කළ නොහැකිය. එයට හේතුව වූයේ, බොහෝ අය ප්‍රේම කළාවූ ඉතා අලංකාර "Home, Sweet Home!" නමැති ගීතයේ නිර්මාතෘවරයා ඔහු වූ බැවිනි. ඔහුගේ සොහොන ළඟ දහසක් කටහඬවලින් යුක්ත වූ ගීතිකා කණ්ඩායමක් විසින් එම ගීය ගයනු ලැබීය.

එහි පාඨ කිහිපයක් මෙසේ පවසයි. ''අපි ප්‍රීතිමත් දේවල් සහ මාළිගා පසුකර යතත්, ඉතාම නිහතමානී අපගේ නිවස තරම් වෙනත් ස්ථානයක් නැත. ආකාශයේ වශීකරවන සුළු භාවය මගින් එහිදී අපව පවිත්‍රත්වයට පත්කරනු ලැබේ. මුළු ලොව පුරාම සෙව්වත් එවැනි ස්ථානයක් වෙන කිසිම තැනක නැත.

'house' නමැති වචනයට සෑම භාෂාවකම වචනයක් ඇත. එහෙත් කිහුනු ජාතීන්ගේ භාෂාවට පමණක් 'home' නමැති වචනයට විශේෂ වූ වචනයක් ඇත. නිවස 'home' යනු, එකිනෙකාට ප්‍රේමකරන එමෙන්ම දෙවියන්වහන්සේට ප්‍රේමකරන මිනිසුන් ජීවත්වන ('house' ගෙයක්ය). සාලමොන් තුළ ''ස්වාමීන්වහන්සේ වෙනුවෙන් 'house' ගෙයක් ගොඩනැගීමේ'' ආශාව තිබුණි. ස්වාමීන්වහන්සේගේ වැඩසිටීම සහිත එම ගෙයට ආශිර්වාද කිරීමට දෙවියන්වහන්සේ නිසැකවම ප්‍රිය කළසේක. එහෙත්,

# අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය

''දෙවියන්වහන්සේ සිත් තැවුල් ඇති වූ, දිළිඳු ආත්මයකින් යුක්ත පුද්ගලයා සමගද ජීවත් වන බව'' යෙසායා අපට පවසයි. කෙබඳු අති උදාර සිතිවිල්ලක්ද! අපගේ හදවත, දෙවියන්වහන්සේ වැඩ සිටීමට සතුටු වන ආකාරයේ ඉතා අලංකාර නිවසක් බවට පත් කළ හැකිය! ඔබගේ සිත තැළුණු එකක්ද? පසුතැවිලි වන සිතක්ද? ඔබ ඔබගේ වැරදි හඳුනාගෙන එම පාපවලට කමාව අයදින්නේද? ඔබ නිහතමානීද? එය එසේ නම් දෙවියන්වහන්සේගේ මහත් වූ ප්‍රීතිය ඔබ හඳුනන්නෙහිය.

## මෙනෙහි කිරීම

### ප්‍රධාන අදහස

''ස්වාමීන්වහන්සේගේ නාමයෙන් ගෙයක් තැනීමට'' සාලමොන් ආශා විය. එම නිවසෙහි දෙවියන්වහන්සේ වැඩ සිටීමට කැමති වීමෙන් උන්වහන්සේ එයට ආශිර්වාද කළ සේක. එහෙත් නිහතමානී හදවතක් ඇති පුද්ගලයෙකු තුළද දෙවියන් වහන්සේ වැඩසිටින බව යෙසායා පවසයි.

**සාකච්ඡාව සඳහා මග පෙන්වන ප්‍රශ්න :**

1. යෙසායාගේ මතයට අනුව, දෙවියන්වහන්සේ වැඩ සිටීමට කැමති වන්නේ කුමන ආකාරයේ නිවසක් තුළද?
2. අපි, අපගේ හදවත් ''දෙවියන්වහන්සේ වැඩ සිටීමට ප්‍රිය කරන නිවසක් බවට පත් කරන්නේ කෙසේද?

# අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය

## 25 කිතුනු නිවසක බලපෑම

''..... මා අනුව එන්නා අන්ධකාරයෙහි නොහැසිර ජීවනයේ ආලෝකය ලබන්නේය...''
(යොහන් 8:12)

අපගේ කාලය, අපගේ ශක්තිය සහ අපගේ බලශක්ති යන සියල්ලම දෙවියන්වහන්සේ සතුය. අපි ඒවා දෙවියන්වහන්සේ වෙනුවෙන් කැප කළහොත් අපගේ ආලෝකය බබළන්නේය. එය පළමුවෙන්ම සහ වඩා තදින් බලපාන්නේ අපගේ නිවසෙහි ජීවත්වන අයටය. අප සමග ඉතා කිට්ටුව ආශ්‍රය කරන අයටය. එහෙත් එය අපගේ නිවසෙන් පිට 'ලෝකය' වෙතද පැතිරී යයි. බොහෝ අයට එය ජීවිතය සුවඳවත් කරන ජීවිතයක් වන්නේය. එහෙත් ආලෝකය දැකීමට ප්‍රතික්ෂේප කරන සමහර අය සිටිති. ඔවුහු එම ආලෝකය තුළින් ගමන් කිරීමටද අකැමති වෙති. අපගේ ගැළවුම්කාරයාණන් පැවසූ අන්දමට ඔවුහු මෙවැනි අය වෙති. ''විනිශ්චය නම් මේය. ලෝකයට ආලෝකය පැමිණ තිබෙන නුමුත් මනුෂ්‍යයන්ගේ ක්‍රියා නපුරු බැවින් ඔවුන් ආලෝකයට වඩා අන්ධකාරයට ඇලුම් වූ බවය'' (යොහන් 3:19). එබඳු අය සිටින්නේ ඉතාම අනතුරුදායක තත්වයකය.  එහෙත් ඔවුන්ගේ එම තෝරාගැනීම අපගේ ආලෝකය බැබළවීම නතර කිරීමට සමාවට කරුණක් නොවේ.

නැවක් අනතුරු ඇඟවීම නොසලකා ඉදිරියට යාත්‍රා කරද්දී පර්වතයක හැපී කැබලි වලට කැඩී ගියේ යයි අපි සිතමු. ප්‍රදීපාගාරයේ රැකවළා ඔහුගේ ආලෝකය නිවා දමා, මම මින්පසු ප්‍රදීපාගාරය ගැන කිසිම අවධානයක් යොමු නොකරමියි පැවසුවහොත් එහි විපාකය කුමක් වේද? එහෙත් ඔහු එසේ නොකරයි. ඔහු තම ආලෝකය මුළු රාත්‍රිය පුරාම බබළවයි. එහු එමගින් එහි ආලෝක ධාරා අන්ධකාරය වෙත විහිදවයි. මක්නිසාද ඔහු එම ආලෝකය අන්ධකාරය තෙක් දල්වන්නේ නැව් පර්වත සහ මත්ස්‍ය රළකට අනතුරුදායක ළඟාවීමේදී ඔවුන්ට යහපතක් වන අයුරිනි. ආලෝකය නිවා තිබියදී යම් නැවක් කැඩී බිඳී ගියහොත්, එය මුළු ලෝකය පුරා ප්‍රචාරය කරනු ලැබේ. එනම් මෙම රාත්‍රියේදී, මෙම ස්ථානයේදී ප්‍රදීපාගාරයේ කුළුණෙහි ආලෝකය නිවා දමා තිබූ බැවින් නැවක් කැබලි වලට කැඩී සුණු විසුණු වී ගිය බවට ප්‍රචාරය කරනු ලැබේ.

එහෙත් යම් නැවක් මුහුදේදී ප්‍රදීපාගාරයෙන් විහිදෙන ආලෝකය ගැන නොතකා ඉදිරියට යාමෙන් විනාශ වුවහොත් ප්‍රදීපාගාරයේ රැකවළා නිදොස්ය. ඔවුන්ට අනතුරු ඇඟවීය. එහෙත් ඔවුහු එය නොසලකා හැරියෝය.

නිවසේ ආලෝකය නිවී ගියහොත් කුමක් වේද? එවිට එම නිවස තුළ සිටින සියළුදෙනාම අන්ධකාරයේය. එවිට එහි ප්‍රතිඵලය ප්‍රදීපාගාර කුළුණේ ආලෝකය නිවී ගියවිට සිදුවන්නාක් මෙන්ම විනාශකාරී වන්නේය. කිතුනු අනුගාමිකයෙනි, ආත්ම ඔබ දෙස බලා සිටිති. එසේ කරන්නේ ඔබ ජීවිතයේ ගැටළු

# අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය

නිසා වෙහෙසව සිටීද, නැතිනම් අනාගතයේ අමරණීය ජීවිතයක් වෙනුවෙන් සූදානම් වෙමින් සිටීදැයි බැලීමටය. ඔබගේ ජීවිතයේ බලපෑම කෙසේදැයි බැලීමට ඔවුහු විමසිලිමත් වෙති. ඔබ ඔබගේ දරුවන් ස්වර්ගයට සුදුස්සන් කිරීමට ඔවුන් පුහුණු කරන සත්‍ය මිෂනාරිවරුන්දැයි ඔවුහු සොයති.

කිතුනුවන්ගේ පළමු කාර්යය නිවසේදී සිදුකළ යුතුය. පියවරුනි, මව්වරුනි, ඔබ සතුව ඇත්තේ මහත්වූ වගකීමකි. ඔබ ඔබගෙන් දරුවන් ජීවනය සඳහා හෝ මරණය සඳහා පුහුණු කරමින් සිටී. ඔබ ඔවුන්ව ආත්මාර්ථකාමීත්වයෙන් පිරි මෙලොව ජීවිතයකට පුහුණු කරන්නේද? නැතහොත් දෙවියන්වහන්සේට සදාකල් ප්‍රශංසා කරන්නාවූ අමරණීය ජීවිතයකට මග පෙන්වන්නේද? එය කුමක් වුවද, ඔබගේ විශ්වාසයට දෙවියන්වහන්සේ විසින් කැපකරනු ලැබූ සෑම දරුවෙකුටම දිව්‍ය හැඩගැස්වීමක් ලබා දීම ඔබගේ ජීවිතයේ ඇති මහත් වූ බරකි. (Signs of the Times, Nov.14, 1886).

## මෙනෙහි කිරීම

### ප්‍රධාන අදහස

කිතුනු නිවසක බලපෑම බැබළෙන ආලෝකය හා සමානය. එය පවුලේ අයටත් පවුලෙන් පිටත සිටින අයටත් බලපායි. මෙම බලපෑම කොතරම් දුරට බලපාවිද යන්න අපට කිව නොහැක. එහෙත් ඉන් වෙනත් පුද්ගලයින් එක්කෙනෙකුට යහපත් ලෙස බලපාන්නේ නම්, දෙවියන්වහන්සේ මහිමයට පත්කරනු ලැබේ.

**සාකච්ඡාව සඳහා මග පෙන්වන ප්‍රශ්න :**

1. කිතුනු නිවසක් ගොඩ නැගීමේදී දෙමවුපියන් කළ යුත්තේ කුමක්ද?
2. යේසුස්වහන්සේ අපගේ ජීවිතයේ මධ්‍යස්ථානය කර ගන්නේ කෙසේද?
3. පවුලේ සාමාජිකයින් අන් අයට ආලෝකයක් විය හැක්කේ කෙසේදැයි ලැයිස්තුවක් සාදන්න.

# අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය

## 26 පවුල්වලට දෙවියන්වහන්සේගේ කටහඬ වන්නේ බයිබලයයි

''..... දරුවෝ ස්වාමීන්වහන්සේ දෙන උරුමයක්ය.''
(ගීතාවලිය 127:3)

දෙමවුපියන් ප්‍රතිසංස්කරණය විය යුතුය. දේවගැතිවරුන් ප්‍රතිසංස්කරණය විය යුතුය. ඔවුන්ගේ නිවෙස්වල දෙවියන්වහන්සේගේ වැඩසිටීම අවශ්‍යයි. ඔවුන් යම් වෙනස් දෙයක් දුටුවොත්, ඔවුන්ගේ නිවසට උන්වහන්සේගේ වචනය ගෙනැවිත් එය ඔවුන්ගේ අනුශාසකයා බවට පත්කළ යුතුය. එය ඔවුන්ට කථා කරන දෙවියන්වහන්සේගේ කටහඬ බවත්, දරුවන් නිසැකවම එයට කීකරු බවත් ඔවුහු පහදා දිය යුතුය. ඔවුහු දරුවන්ට ඉවසිලිවන්තව අනුශාසනා කළ යුතුය. දෙවියන්වහන්සේ සතුටු කිරීම සඳහා කොයි ආකාරයෙන් ජීවත් විය යුතුද යන්න ඔවුන් කරුණාවන්තව වෙහෙස නොවී කියා දිය යුතුය. එබඳු නිවසක දරුවෝ අනාචාරය පිළිබඳ බොරු තර්කවලට නිර්භයව මුහුණ දීමට සුදානම් වී ඇත. ඔවුහු බයිබලය ඔවුන්ගේ ඇදහිල්ලේ අත්තිවාරම ලෙස පිළිගෙන ඇත. එපමණක් නොව සත්‍යය විශ්වාස නොකරන්නාවූ රළ පහරට ගසා නොයන අත්තිවාරමක් ඔවුන්ට ඇත.

බොහෝ නිවෙස්වල යාච්ඤාව අතපසු කර ඇත. දෙමවුපියන්ට උදෑසන සහ සවස නමස්කාරය සඳහා කාලයක් නොමැති බව ඔවුහු සිතති. දෙවියන්වහන්සේගෙන් ලද මහඟු ආශිර්වාද ගැන ස්තුති දීමනාවේ යෙදීමට ඔවුන්ට සුළු මොහොතක් වැය කළ නොහැකි වේ. වගාව සඵලවත් කරන්නාවූ ආශිර්වාද ලත් සූර්යා ලෝකය සහ වර්ෂාව ගැනත් ශුද්ධවූ දේව දූතයින්ගේ රැකවරණය ගැනත් ස්තුති කිරීමට සුළු මොහොතක් කැප කළ නොහැකිය. දිව්‍ය උපකාර සහ මගපෙන්වීම ගැනත් නිවසේ යේසුස්වහන්සේගේ වැඩ සිටීම ගැනත් ස්තුති කිරීමට කාලය වෙන් කළ නොහැක. ඔවුහු දවසේ රාජකාරි සඳහා පිටව යන්නේ දෙවියන්වහන්සේ හෝ ස්වර්ගය ගැන එක සිතිවිල්ලක්වත් නොමැතිවය. ඔවුන්ට වටිනා ආත්ම ඇත. ඒවා නැතිවීමට ඉඩ නොදී ඔවුන්ව රැකගැනීම සඳහා දේව පුත්‍රයාණන් උන්වහන්සේගේ ජීවිතය පූජා කළ සේක.

දෙවියන්වහන්සේට ප්‍රේම කළාවූ ආදි පිතෘවරුන් මෙන් ඔවුන්ගේ කූඩාරම් ගැසූ ස්ථානයේදී ස්වාමීන් වහන්සේට පූජාසනයක් ගොඩ නැගූ ආකාරයෙන්, උන්වහන්සේට ප්‍රේම කරන අයද කළ යුතුය. සෑම නිවසක්ම යාච්ඤා ගෘහයක් විය යුතු කාලයක් තිබුණේ නම් ඒ දැන්ය. පියවරුන් සහ මව්වරුන්, ඔවුන් වෙනුවෙන් සහ ඔවුන්ගේ දරුවන් වෙනුවෙන් ඔවුන්ගේ හදවත් නිහතමානී ආයාචනයෙන් දෙවියන්වහන්සේ වෙතට එසවිය යුතුය. පියා, නිවසේ දේවගැතිවරයා හැටියට උදෑසන සහ සවස පූජාව දෙවියන්වහන්සේගේ අල්තාරය මත තැබිය යුතුය. ඒ අතරතුරේදී භාර්යාව සහ දරුවන් යාච්ඤාවෙන් සහ ප්‍රශංසාවෙන් ඔහු සමග එක්සත් විය යුතුය. එබඳු නිවසක යේසුස්වහන්සේ වැඩ සිටීමට කැමති වන සේක.

# අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය

සෑම කිතුනු නිවසකින්ම ශුද්ධ වූ ආලෝකයක් බැබළිය යුතුය. ප්‍රේමය ක්‍රියාවෙන් ප්‍රකාශ කළ යුතුය. එය මුළු නිවස පුරාම සහ සියළු කාර්යයන් තුළදීම, කරුණාවන්තකම, මෘදු, පරාර්ථකාමී විනීත බව තුළින් පෙන්විය යුතුය. මෙම ප්‍රතිපත්ති අනුගමනය කරන නිවෙස් ඇත. එනම් දෙවියන්වහන්සේට නමස්කාර කරන සත්‍යවාදී ප්‍රේමය රජකරන නිවසකි. මෙවැනි නිවෙස්වල මිහිරි සුවඳ දුම් ලෙසින් උදෑසන සහ සවස යාච්ඤාව දෙවියන්වහන්සේ වෙත ඔසවනු ලැබේ. එපමණක් නොව උදෑසන පිණි මෙන් එම නිවසේ ජීවත්වන අයට උන්වහන්සේගේ අනුකම්පාවත් ආශිර්වාදත් ගලා එන්නේය. – Patriarchs and Prophets, pp. 143, 144.

නිවසේදී චරිතය ප්‍රේමවන්ත බවට පත්කරන්නා වූ අය මගින් ස්වර්ගයේ මාළිගා තුළදීද ප්‍රේමය විහිදුවනු ලැබේ. — Ellen G. White, Reflecting Christ, p. 182.

## මෙනෙහි කිරීම

### ප්‍රධාන අදහස

දෙමවුපියන් උන්වහන්සේගේ වචනය ඔවුන්ගේ පවුල් තුළට ගෙනැවිත්, එය පවුලේ මගපෙන්වන්නා බවට පත්කළ යුතුය. බයිබලය යනු ලේඛන ගත කළාවූ දෙවියන්වහන්සේගේ කටහඬයි. ඒ අනුව එයට ගෞරවයත් පක්ෂපාතිත්වයත් හිමිවිය යුතුය. සෑම නිවසකම පවුලේ පූජාසනයක් තිබිය යුතුය. එනම් පවුලේ හෝ පෞද්ගලික නමස්කාරය සඳහා විශේෂ ස්ථානයකි.

**සාකච්ඡාව සඳහා මග පෙන්වන ප්‍රශ්න :**

1. ''සෑම නිවසක්ම යාච්ඤාවේ නිවසක් (යාච්ඤා ගෘහයක්) විය යුතුය'' යන්නෙහි අර්ථය කුමක්ද?
2. නිවස යාච්ඤාවේ ගෘහයක් කිරීම සඳහා පවුලේ අය කළ යුතු දේවල් මොනවාදැයි විස්තර කරන්න.
3. බයිබලය, දෙවියන්වහන්සේගේ කටහඬ බවට පිළිගැනීම සඳහා දෙමවුපියන් දරුවන්ට කෙසේ උපකාර කළ යුතුද?

# අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය

## 27 ස්වර්ගයේ අති උත්තමයාණන් තුළ රඳා සිටීම

''..... අපේ දෙවිවූ ස්වාමීන්ගේ අලංකාරය අප කෙරෙහි වේවා. අපේ අත්වල වැඩ අප කෙරෙහි සථිර කළ මැනව. එසේය, අපේ අත්වල වැඩ ස්ථිර කළ මැනව ''
(ගීතාවලිය 90:17)

ඔබගේ දරුවන්ට කෝපය පාලනය කරගැනීමටත්, ප්‍රේමවන්ත ක්‍රිස්තුස්වහන්සේගේ මෙන් ආත්මයක් ගොඩ නගා ගැනීමට ඉගැන්විය යුතුය. ඒ අනුව ඔවුන් දෙවියන්වහන්සේට සේවය කිරීමට කැමති වන අතර, විනෝදවීම සඳහා ස්ථානවලට යාමට වඩා නමස්කාර ගෘහයට යාමෙන් ප්‍රීතියට පත් වනු ඇත. ආගම යනු ජීවමාන ප්‍රතිපත්තියක් බව ඔවුන්ට උගන්වන්න. ආගම යනු නිකම්ම හැඟීමක්ය යන අදහස මට උගන්වා තිබුණේ නම්, මගේ ජීවිතය ඵල රහිත එකක් වනු ඇත. එහෙත් මම ස්වර්ගය සහ මාගේ ආත්මය අතරට හැඟීම්වලට ඇතුල්වීමට කිසිදිනක ඉඩ නොදෙමි. මගේ හැඟීම් කුමක් වුවත්, දිනය ආරම්භයේදී සහ දවල් කාලයේදී සහ රාත්‍රියේදී මම දෙවියන්වහන්සේ සොයමි. ඒ අනුව ජීවමාන බලය තුළින් මට ශක්තිය ලබාගත හැකිවේ.

මව්වරුනි, ඔබගේ දරුවන්ගේ මනස අලංකාර කිරීමටත්, ඔවුන් තුළ පියකරු චරිතයක් ගොඩ නැගීමටත් කාලය ඔබට ලබාදී නැද්ද? එම කාලය ස්වර්ගයේ මහෝත්තමයාණන්ගේ අත් අල්ලාගෙන ඔබගේ දරුවන් ස්වර්ග රාජ්‍යය සඳහා පුහුණු කරවීමට අවශ්‍ය බලය සහ ඥානය ඉල්ලීමට භාවිතා නොකරන්නේද? ඒ අනුව ඔවුන්ට යෙහෝවඃවහන්සේගේ සිංහාසනය දක්වා ජීවිතයක් රක්ෂා කිරීමට උත්සාහ නොගන්නේද?

සමහරවිට තම දරුවන් යාච්ඤාවකින් තොරව, හාදුවක් නොදී නින්දට යන තෙක් අම්මා රාත්‍රියක් රාත්‍රියක් පාසා වැඩකරමින් සිටින්නීය. ඇය ඔවුන්ගේ මෘදු හදවත් ප්‍රේමයේ රැහැනින් ඇය හා බැඳ තබන්නේ නැත. මක්නිසාද ඇය කාර්යබහුලවීම නිසාය.

අපි නිවස, ආගම සහ දරුවන් ගැන බොහෝ විට කථා කරන්නේ මක්නිසාදැයි සමහරු සිතනවා විය හැක. එසේ කරන්නේ බොහෝ අය නිවසේ යුතුකම් භයානක ලෙස අතපසු කරන නිසාය. දේව සේවකයින් ලෙස දෙමවුපියෙනි, ඔබගේ රැකවරණයට කැප කරන ලද දරුවන් ගැන ඔබ වගකිව යුතුය. ඔවුන්ගෙන් බොහෝ අය ගෞරවයෙන් තොරව නොසැලකිලිමත්ව, ආගමකින් තොරව, ස්තුති පූර්වක නොවන සහ අශුද්ධ ලෙස වැඩෙති.

මෙම දරුවන් නියම ආකාරයෙන් පුහුණු කර, විනයානුකූලව ස්වාමීන්වහන්සේගේ අවවාද අනුශාසනා වලට අනුව පෝෂණය කළේ නම්, ඔබගේ නිවසෙහි ස්වර්ගීය දේවදූතයින් වැඩ සිටින්නෝය. ඔබ සත්‍ය

# අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය

මිෂනාරිවරු නම්, දේව සේවයේ දක්ෂ සේවකයින් ලෙස ඔබ අසල සිටගැනීමට ඔවුන් සුදුස්සන් කරනු ඇත.

ස්වාමීන්වහන්සේගේ සේවය සඳහා එක්ව වැඩෙහි යෙදී සිටින ඔබගේ පවුල දැකීමෙන් සමාජයට කුමන පැහැදීමක් ඇති කෙරේද? එබඳු පවුලක්, යථාර්ථයෙන්ම කිතුනු පවුලකට බලවත් එළිදරව්වකි. තවත් අය දකින්නේ පවුලේ වැඩකටයුතු දරුවන්ට සාර්ථක ලෙස බලපාන බවත්, ආබ්‍රහම්ගේ දෙවියන්වහන්සේ ඔවුන් සමග සිටින බවත්ය. එබඳු බලපෑමක් දරුවන්ට තිබෙන පවුලක බලපෑම පවුලෙන් පිටත සිටින අන් අයටද සාර්ථක බලපෑමක් ඇති කරයි. උගත් කිතුනු පවුල් තුළ නිවැරදි ආගමික මිශ්‍රනයක් තිබේ නම් ඔවුහු යහපත සඳහා විශාල බලපෑමක් කරන්නෝය. ඔවුන් ඇත්තෙන්ම ''ලෝකයේ ආලෝකය'' වන්නෝය. – Signs of the Times, Jan. 14, 1886.

## මෙනෙහි කිරීම

### ප්‍රධාන අදහස

ස්වාමීන්වහන්සේගේ වැඩ සහ සේවය සඳහා එක්සත්ව ක්‍රියා කරන පවුල් ක්‍රිස්තියානි ධර්මය ගැන බලවත් සාක්ෂියකි. පවුලට ඇති දෙවියන්වහන්සේගේ බලපෑම සහ එය දරුවන්ට බලපාන ආකාරය අනෙක් අය දකිති. එබඳු බලපෑමක බලය ඉතා මහත් බැවින් එය නිවසින් පිටතටද හැඟේ.

**සාකච්ඡාව සඳහා මග පෙන්වන ප්‍රශ්න :**

1. ජීවනයේ උල්පත සමග නිතරම සම්බන්ධවී සිටීමේ යහපත කුමක්ද?
2. නිවස තුළ ආගමික ජීවිතය දරුවන්ට බොහෝ වැදගත් වන්නේ ඇයි?
3. පවුලේ සාමාජිකයින්ට ලෝකයේ ආලෝකය බවට පත්විය හැක්කේ කෙසේද?

## 28 මිථ්‍යා දෘෂ්ටිකයින්ට ප්‍රතික්ෂේප කළ නොහැකි තර්කයක්

''..... නුඹලා ආලෝකයේ පුත්‍රයන් වන පිණිස ආලෝකය නුඹලාට තිබෙද්දී ආලෝකය කෙරෙහි අදහාගනිල්ලා.... ''

(යොහන් 12:36)

හොඳින් සැකසුණු ක්‍රිස්තියානි නිවසක් මිථ්‍යා දෘෂ්ටිකයින්ට ප්‍රතික්ෂේප කළ නොහැකි තර්කයක් වන්නේය. ඔහුට ඔහුගේ මිථ්‍යා චෝදනා නැගීමට අවස්ථාවක් නොලැබේ. එබඳු පවුලක දරුවන් මිථ්‍යා දෘෂ්ටිකයින්ගේ බොරු තර්ක වලට මුහුණ දීමට සූදානම්ව සිටිති. බයිබලය ඔවුන්ගේ ඇදහිල්ලේ පදනම ලෙස පිළිගෙන ඇත. අසත්‍ය මත නමැති රළ පහරින් ඔවුන්ගේ අත්තිවාරම ගසාගෙන නොයයි.

''නුඹලාගේ ලෝකය ආලෝකයයි'' (මතෙව් 5:14) යනුවෙන් ක්‍රිස්තුස්වහන්සේ වදාළ සේක. උන්වහන්සේ අපට තලෙන්ත භාර දී ඇත. උන්වහන්සේ අපව විශ්වාස කොට අපට භාරදී ඇති එම ත්‍යාග වලින් අපි කුමක් කරමුද? අපි ඒවා භාවිතා කරමින් අපගේ සහෝදර ජනතාවගේ ශුභ සිද්ධිය උදෙසා උන්වහන්සේගේ මහිමය උදෙසා අපගේ ආලෝකය විහිද වන්නෙමුද? එසේත් නැතිනම් අපි අපගේ ආත්මාර්ථකාමී ආශාවන් මුදුන් පත් කරගැනීම සඳහා ඒවා භාවිතා කරන්නෙමුද? බොහෝ අය එම තලෙන්ත ආත්මාර්ථකාමී ලෙස භාවිතා කරති. අපට විනිශ්චයට මුහුණ දීමට සිදුවන බවත්, අපට දෙවියන්වහන්සේ විසින් දෙන ලද අවස්ථාවන් යහපත උදෙසා භාවිතා කළ ආකාරය පිළිබඳ වාර්තාවක් දීමට සිදුවන බවත් බොහෝ අයට නොවැටහේ. ඒ ශ්‍රේෂ්ඨ දිනයේදී දෙවියන්වහන්සේ දුන් ත්‍යාග ඔවුන්ගේ දක්ෂතා, අධ්‍යාපනය, උපක්‍රම, අප්‍රතිහත ධෛර්යය සහ උද්‍යෝගයන් දේව සේවය සඳහා නොයෙදීම ගැන කුමන ආකාරයේ සමාවට කරුණු ලෙස ඔවුන් ඉදිරිපත් කරන්නෝද?

අපගේ ආලෝකය නිරතුරුවම බැබළවීමට අපට දේව උපකාරය අනවශ්‍ය වේ. එහෙත් එම උපකාරය ලබා දීම සඳහා යේසුස්වහන්සේ ජීවිතය පූජා කළසේක. උන්වහන්සේ මෙසේ ආරාධනාවක් කළසේක. ''නැතහොත් ඔහු මාගේ ශක්තිය අල්වාගෙන මා සමග සමාදාන වේවා. එසේය, ඔහු මා සමග සමාදාන වේවා'' (යෙසායා 27:5). අනන්ත වූ බලයේ දෑත් වල අල්වාගන්න. එවිට උන්වහන්සේ ඔබගේ ආත්මයට වටිනා වස්තුවක් බව හැඟෙන අතර, මුළු ස්වර්ගයම ඔබගේ අණට කීකරු වන්නේය. ''උන්වහන්සේ ආලෝකයෙහි සිටින්නාසේ අපිත් ආලෝකයෙහි හැසිරෙමු නම් ....'' (1 යොහන් 1:7). අපට ශුද්ධවූ දේව දූතයින්ගේ රැකවරණය ඇත්තේය. යෝෂුවාට මෙසේ කියන ලදී. ''සේනාවල ස්වාමීන්වහන්සේ මෙසේ කියන සේක .... නුඹ මාගේ මාර්ගවල හැසිර, මාගේ භාරය රක්ෂා කරන්නෙහි නම්. නුඹට මාගේ ගෘහය විනිශ්චය කරන්ටත්, මාගේ මණ්ඩප බලාගන්ටත් ලැබෙයි. මෙහි සිටින මොවුන් අතරේ ළඟාවිය හැකි ස්ථානයක් නුඹට දෙන්නෙමි'' (සෙකරියා 3:7). ''මෙහි සිටින මොවුන් අතරේ'' යන්නෙන් අදහස් කළේ කවුරුන්ද? ඔවුහු දෙවියන්වහන්සේගේ දේව දූතයින්ය. යෝෂුවා තුළ, දෙවියන්වහන්සේ තුළ ජීවමාන

# අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය

ස්ථිරසාර විශ්වාසයක් සෑම දිනකම තිබිය යුතුය. එවිට දේව දූතයෝ ඔහු සමග ඇවිදින්නෝය. ඔහුගේ සියළු වැඩ වලදී, ඔහු තුළ දේව බලය පවතින්නේය.

එසේ නම්, ක්‍රිස්තියානි මිතුරෙනි, පියවරුනි, මව්වරුනි, ඔබගේ ආලෝකය අඳුරු වීමට ඉඩ හරින්නේද? නැත. කිසිදිනක නැත. ඔබගේ හදවත ක්ලාන්ත වීමටත්, දෑත් වෙහෙසවීමටත් ඉඩ හරින්නේද? නැත. කිසිදිනක නැත. ක්‍රම ක්‍රමයෙන් ස්වර්ග රාජ්‍යයේ දොරටු විවෘත වන්නේය. ඔබත්, ඔබගේ දරුවන්වත් සිංහාසනය ඉදිරිපිටට පමුණුවන්නෝය. එවිට ඔබ මෙසේ පවසයි. ''බලව, මමද, ස්වාමීන්වහන්සේ මට දුන් දරුවෝද ....'' (යෙසායා 8:18). ඔබගේ දරුවන්ට දේව රාජ්‍යයේදී සදාකාල ජීවනයේ ඔටුණු පළඳවනු ලැබීම දැකීම ඇදහිල්ලේ කුමන භාග්‍යවන්ත අවස්ථාවක්ද! — Signs of the Times, Jan. 14, 1886.

## මෙනෙහි කිරීම

### ප්‍රධාන අදහස

අපගේ නිවසෙහි අපි ජීවත්වන ආකාරය සහ ප්‍රදර්ශනය කරන අගයන් මගින් අපගේ ක්‍රිස්තියානි සාක්ෂි දැරීම දුර්වල හෝ ශක්තිමත් කෙරේ. බයිබලය තම ඇදහිල්ලේ අත්තිවාරම ලෙස සත්‍යවශයෙන්ම පිළිගන්නා වූ සහ විශ්වාස කරන්නාවූ එක් අයෙක් වුවද මිථ්‍යා විශ්වාසවල එල්බගෙන සිටින්නෙකුට ප්‍රතික්ෂේප කළ නොහැකිය. කුමන ආකාරයේ බොරු තර්ක වලින්වත් සෙලවිය නොහැකි ස්ථිර අත්තිවාරමක් එම පවුල් තුළ ඇත.

**සාකච්ඡාව සඳහා මග පෙන්වන ප්‍රශ්න :**

1. ''හොඳින් සැකසුණු ක්‍රිස්තියානි පවුලක්'' යනු තර්ක වලින් සහ ගැටළුවලින් තොර එකක්ද? ඒ ඇයි?
2. පවුල හොඳින් සකසුරුවම් කිරීමට දෙමවුපියන් සහ දරුවන් කුමන ආකාරයෙන් දායක විය හැකිද?
3. ස්වාමීන්වහන්සේ උදෙසා පවුලක සාක්ෂි දැරීමක සත්‍ය මූලාශ්‍රය කුමක්ද?

# අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය

## 29 හදවත් එක්සත් කරන්නේ කෙසේද?

''..... ඔහු පියවරුන්ගේ සිත් දරුවන් වෙතටත් දරුවන්ගේ සිත් පියවරුන් වෙතටත් හරවන්නේය.''
(මලාකි 4:6)

ප්‍රේමයේ ප්‍රතිපත්තිය දෙවියන්වහන්සේ පාපය ඇතිවීමට පෙරදී පිහිටෙවූ සේක. මක්නිසාද ඒ අනුව ආදම්, ඒව සහ දරුවන්ට ප්‍රීතියෙන් ජීවත් විය හැකි නිසාය. ප්‍රේමය යන්නෙහි තේරුම, සාතන් ආශාවන්, නිදහස් ලිංගික ආශ්වාදය සහ මාංශමය ආශාවන් සමග මිශ්‍ර කර ඇති අයුරු අපි දැක ඇත්තෙමු. එබැවින් සත්‍ය ප්‍රේමය සහ මනුෂ්‍ය ප්‍රේමය අතර ඇති වෙනස නිර්මාණය කිරීමට දෙවියන්වහන්සේට අවශ්‍ය විය. දෙවියන්වහන්සේ ප්‍රේමය සදාකාලික හැසිරීමේ ප්‍රතිපත්තියක් ලෙස පිහිටෙවූ සේක. එසේ නැතිව, හැඟීමක් හෝ ශාරීරික සුවයක්වත්, සාමාන්‍ය අත්දැකීමක් නොවන බව උන්වහන්සේ පැහැදිලි කර දුන් සේක. කුමන අවස්ථාවකදී වුවද, පවිත්‍ර ප්‍රේමය යනු හදවතට සාමය උදාකර දෙන වැදගත් මූල ද්‍රව්‍යයක් වන අතර, ගැටළු නිරාකරණය කිරීමේදී නිවැරදි තීරණ ගැනීමට මනසට මග පෙන්වන්නක්ද වන්නේය.

මිනිසුන්ගේ මනස කෲර දේවල් අරමුණු කරගන්නා සංස්කෘතියක අපගේ හදවත් තුළ සත්‍ය ප්‍රේමයේ ප්‍රතිපත්ති විද්‍යමාන කරගැනීම සඳහා අපගේ පුද්ගලික අත්දැකීම් තුළ යමක් තිබීම අපට අවශ්‍ය වේ. මෙම 'යම් දෙයක්' නම් හැරීම හෝ ක්‍රිස්තුස්වහන්සේ තුළ ඇදහිල්ලෙන් ධර්මිෂ්ඨවීමයි. ඒදන් උයනේදී ස්වාමීන් වහන්සේ නියම කළාවූ දෙවන ප්‍රතිපත්තිය මෙයයි. ඒ අනුව (ආදම් සහ ඒවට) පාපය ඇතුල්වීමට පසුව වුවද ප්‍රේමයෙන් ජීවත් විය හැකි බවය. උත්පත්ති 3:15 සහ 21 වැනි පාඨ වලින් ප්‍රකාශ වන්නේ අපගේ මුල් දෙමවුපියන් වෙනුවෙන් බැටළු පැටවෙකු පූජා කරනු ලැබූ බවයි. රුධිරය වගුරුවනු ලැබුවේ සත්‍ය ප්‍රේමය ඇති විය හැක්කේ දෙවියන්වහන්සේගේ බැටළු පැටවාණන් තුළ ඇදහිල්ල මත පමණක් බව ලෝකයට ඉගැන්වීමටයි! වෙනත් වචන වලින් කිවහොත් අපට එබඳු ප්‍රේමයක් ලැබෙන්නේ දිනපතා ක්‍රිස්තුස් වහන්සේ සමග ඇවිදීම මගිනි.

පුතෙක් දිනක් තම පියා සමග බැරෑරුම් ලෙස තර්ක කළේය. මෙම උණුසුම් වචන හුවමාරුව දෙස මව නිශ්ශබ්ද බලා සිටියාය. පුතා නිවසින් පිටවී ගිය අවස්ථාවේදී මව පියාට මෙසේ කීවාය. ''අර්නස්ට්, ඔබ වැරදියි. ඔබ ඒ දරුවාට තදින් කථා කළේ ඇයි?''

ස්වාමි පුරුෂයා මෙසේ පිළිතුරු දුන්නේය. ''ඒ තද තරුණ කොල්ලා ඉදිරියේදී මම යටහත් පහත් විය යුතු බව ඔබ පවසන්නේද? ඔහු නිතරම සිතන්නේ ඔහු නිවැරදි කියාය!''

එයට පිළිතුරු වශයෙන් භාර්යාව මෙසේ පැවසුවාය. ''ඔබට වැරදිලා! අපි ක්‍රිස්තියානින් නොවෙමුද? අර්නස්ට්, මේ අහන්න. අපි ජීවත්වන්නේ දෙවියන්වහන්සේගේ සමාව දීම නිසා බව අපි අපේ දරුවන්ට

# අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය

පහදා දිය යුතුය. පවුලේ එක්සත්කම රඳා පවතින්නේ ඔබගේ බලය මත නොවේ. එහෙත් අපගේ ගැළවුම්කාරයාණන්ගේ අනුග්‍රහය සහ ඇදහිල්ල මතය.'' ස්වාමි පුරුෂයාට පිළිතුරක් දීමට නොහැකි විය.

පසුව, පුතා නිවසට පැමිණිවිට, පියා ඔහුට හඬ ගසා මෙසේ පැවසුවේය. ''මගේ පුතා, ඔබ හරි. මට එය අවබෝධ වීමට කල්ගතවීම ගැන මම කනගාටු වෙමි. කරුණාකර මට සමාවන්න!''

''මගේ තාත්තා'' උගුරේ යමක් හිරවී තිබූ ආකාරයෙන් පුතා පිළිතුරු දුන්නේය. ඉන්පසු ඔහු තම දෑසේ ස්තුති පූර්වක කඳුළු පියාට නොපෙනෙන සේ වෙනතකට හැරිණි - ''බලය සහ ආලෝකය.''

## මෙනෙහි කිරීම

### ප්‍රධාන අදහස

හදවතට සාමය ගෙන දෙන්නාවූද, ගැටළු නිරාකරණය කිරීම සඳහා නිවැරදි තීරණ ගැනීමට මග පෙන්වන්නාවූද වැදගත් මූල ද්‍රව්‍යය වන්නේ පවිත්‍ර ප්‍රේමයයි. කුමන හේතුවක් මත වුවද, පවුලේ එක්සත්කම දෙමවුපිය බලය මත රඳා නොපවතී. එහෙත් එය ඇතිවන්නේ අපගේ ගැලවුම්කාරයාණන්ගේ අනුග්‍රහය සහ ඇදහිල්ල මතය.

**සාකච්ඡාව සඳහා මග පෙන්වන ප්‍රශ්න :**

1. දෙමවුපියෙකු ලෙස, ඔබගේ වැරදි දරුවා / දරුවන් ඉදිරියේදී පිළිගත් අවස්ථාවක් සඳහන් කරන්න. එම අත්දැකීම පියෙකු හෝ මවෙකු ලෙස තම බලයට කුමන බලපෑමක් ඇති වූයේද?

2. දෙමවුපියන් සහ දරුවන් හැටියට නිවසේ එක්සත්කම පවත්වාගෙන යාමට විශේෂ ආකාරයකින් කෙසේ දායක විය හැකිද? ඒවා ලැයිස්තුවක් සාදන්න.

# අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය

## 30 ප්‍රීතිමත් නිවසක ප්‍රතිපත්ති

''..... යේසුස්වහන්සේත්, උන්වහන්සේගේ ගෝලයොත් සරණ මංගල්‍යයට කැඳවනු ලැබූවෝය.''
(යොහන් 2:2)

තම සරණ මංගල්‍යයට යේසුස්වහන්සේටත්, උන්වහන්සේගේ ගෝලයන්ටත් ආරාධනා කර තිබීම ගැන එම යුවල කොතරම් ප්‍රීතියට පත්වන්නට ඇත්ද? ස්වාමීන්වහන්සේගේ වැඩ සිටීමේ අර්ථය ඔවුහු අවබෝධ කරගත්තෝද? බොහෝ සරණ මංගල්‍ය වල සිදුවන ආකාරයට මෙහිදීද යම් ගැටළුවක් පැන නැගීම වැදගත් කරුණක් විය. එය එතරම් භාරදූර ගැටළුවක් නොවිණි. ඔවුන්ගේ මිදි යුෂ නිමා විය. බ්‍රසීලයේ එනම් මගේ රටේ එය සාදය නිමවීමට පෙර සියල්ල අවසන් වීමයි.

මීට වසර කිහිපයකට පෙරදී මට දේශනා කිරීමට ආරාධනය ලැබූ සරණ මංගල්‍යයක්, කල් දැමීමට සැලසුම් කළා වැනිය. මනාලයා සහ මනාලිය අතර වැරදි අවබෝධයක් පැවති අතර, එය අපි සියළුදෙනාට මහත් ගැටළුවක් විය. එහෙත් අද ඔවුන් විවාහ වී සිටින ප්‍රීතිමත් යුවලකි. ඒ ඇයි? ඔවුහු ඔවුන්ගේ සරණ මංගල්‍යයට යේසුස්වහන්සේට ආරාධනා කළහ. ඔවුහු ඔවුන්ගේ නිවසෙහි කොටස්කරුවෙකු වීමට ක්‍රිස්තුස්වහන්සේට ආරාධනා කළහ. ස්වාමීන්වහන්සේ ඔවුන්ගේ අවශ්‍යතාවයන් සියල්ල සපයා දුන් සේක.

සාර්ථක සරණ මංගල්‍යයක යේසුස්වහන්සේගේ වැඩ සිටීම ඉතාමත් වැදගත් වන්නේය. ක්‍රිස්තුස්වහන්සේ නොමැතිව සම්පූර්ණ ප්‍රීතිය භුක්ති විඳිය නොහැකිය. පවුලට අවශ්‍ය මගපෙන්වීම දෙමවුපියන්ට හා දරුවන්ට ලබාදෙමින් ස්වර්ගීය නිවසේ ජීවත්වීමට සූදානම් වීම සඳහා මෙලොවදී ජීවත් විය යුතු ආකාරය පෙන්වා දෙන්නේ ක්‍රිස්තුස්වහන්සේය.

කෙසේවෙතත්, යුවලක සම්බන්ධතාවයට ධනාත්මක ලෙස බලපාන සරල ප්‍රායෝගික කරුණු ද ඇත. මම ඒවාට කියන්නේ ''විශේෂ අවස්ථා'' යනුවෙනි. එහි පළමුවැන්න වන්නේ දෙවියන්වහන්සේ සමග ගතකරන මොහොතය. අපි සෑම දිනකම අපගේ පෞද්ගලික යාච්ඤාව සඳහා කාලය වැය කරමුද? අපි නිරාහාරව යාච්ඤා කරමුද? අපි අපගේ බයිබලය කියවමුද? අපි සෑම කෙනෙකුටම දෙවියන්වහන්සේ සමග නිශ්ශබ්දව කාලය ගත කිරීමට අවශ්‍ය වේ.

දෙවැන්න, සැලසුම් කිරීමට අපි කාලය වෙන් කළ යුතු වෙමු. අපි ජීවත්වන්නේ පියා සහ මව රැකියාවේ යෙදෙන කාර්යබහුල ලෝකයකය. භාර්යාව බොහෝ විට සහ සම්පූර්ණයෙන්ම නිවසෙහි නොසිටින්නීය. එහෙත් ඇය තම සහකාරයා සමග උරෙන් උර ගැටෙමින් පවුලට අවශ්‍ය ආහාර සපයන්නීය. ඔවුන් දෙදෙනාම රැකියාවේ ගැටළු සහ සටන්වලට මුහුණ දෙන අතර නිවසට පැමිණෙන්නේ බොහෝ සෙයින් වෙහෙස වීය! දරුවන් පාසැලේ සිට නිවසට පැමිණි විට ඔවුන්ට පාසැලෙන් නියම කළාවූ ගෙදර වැඩ සහ පොත්පත් කියවීමට අවශ්‍ය වේ. නිවසේ වගකීම භාරගන්නේ කවුද? ඒ භාර්යාව පමණක්ද? ස්වාමි

# අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය

පුරුෂයා රාත්‍රි ආහාරය බලාපොරොත්තු වන අතර සාමාන්‍යයෙන් ඔහු උදව් නොකරයි. පවුල් එක්වී වැඩ කිරීම සඳහා සැලසුම් කළ යුතුය. එසේ නොකළොත් නිවසේ ගැටුම් සහ පීඩාව රජකරන්නේය.

තුන්වැන්න වන්නේ පවුල එක්ව ගත කරන මොහොතයි. පවුලේ නමස්කාරය ඉතා වැදගත් වන අතර කථාබහ කිරීමට සහ අදහස් එකිනෙකා සමග බෙදාගැනීමටද කාලය අවශ්‍ය වේ. එකිනෙකාගේ දවස තුළ ලබාගත් කුඩා ජයග්‍රහණ සහ මුහුණ දුන් බලාපොරොත්තු සුන්වීම් ගැන පවුලේ සාමාජිකයෙක්ම සවන් දිය යුතුය. මෙබඳු මිත්‍ර සම්බන්ධතාවයක් මගින් පවුල තුළ ආදරය ගොඩ නගන අතර එය ඉතා අවශ්‍ය වන දෙයකි. විවාහයක් ගමනක් බව බොහෝ විට පැවසේ. එහෙත් අපි සියළුදෙනාම නැවතුම් පොලක් කරා යමු. එනම් ස්වර්ගයයි! අපට එහි ළඟා විය හැක්කේ ක්‍රිස්තුස්වහන්සේ තුළ දිනපතා වර්ධනය වීමෙන්ය. පවුල් ගැටුම් නිරාකරණය කරගැනීමට ඉගෙන ගත යුතුය. ඔවුන්, ''මට කනගාටුයි. මට කරුණාකර සමාවන්න. මම වැරදියි'' යනුවෙන් පැවසීමට ඉගෙනගත යුතුය.

විවාහවීමට බලාපොරොත්තුවෙන් සිටින අයට එලන් වයිට් මහත්මිය මෙසේ අවවාද කරන්නීය. ''ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයම දිනකට දෙවරක් යාච්ඤා කිරීමට පුරුදුව සිටියේ නම්, ඔවුන් විවාහය ගැන සැලසුම් කරද්දී, එබඳු ක්‍රියාවක් ක්‍රියාත්මක කිරීමට පෙරදී දිනකට සිවු වරක් යාච්ඤා කළ යුතුය. විවාහය යනු ඔබගේ ජීවිතයට මේ ලෝකයේදීත් පැමිණෙන්නට තිබෙන ලෝකයේදීත් ප්‍රතිඵල දෙන්නාවූත්, බලපාන්නාවූත් දෙයකි.'' –Messages to Young People, p. 460.

## මෙනෙහි කිරීම

### ප්‍රධාන අදහස

ස්වාමීන්වහන්සේ නිවස තැනීමෙන් තොරව, ''එය ගොඩනගන්නාගේ වෙහෙස නිෂ්ඵල වේ.'' අපගේ ජීවිතය, අපගේ පවුල සහ අපගේ ඥාති සම්බන්ධතා ගොඩ නැගිය යුතු අත්තිවාරම වන්නේ යේසුස්වහන්සේ පමණි. මෙය ස්ථිර අත්තිවාරමකි.

**සාකච්ඡාව සඳහා මග පෙන්වන ප්‍රශ්න :**

1. යුවලක් ස්වාමීන්වහන්සේ සමග සහ එකිනෙකා සමග සම්බන්ධතාවය ශක්තිමත් කරගත හැකි ප්‍රායෝගික ක්‍රම මොනවාද?
2. දරුවන් කීකරුවීමට කැමති වන ආකාරයේ මෙන්ම ඒ අතර ස්වාමීන් වහන්සේ තුළ ඔවුන්ව පෝෂණය කළ හැකිවන අයුරින් දෙමවුපියන් කුමන ආකාරයෙන් නීති රීති ක්‍රියාවේ යෙදිය යුතුද?
3. දෙවියන්වහන්සේ සමග සහ අන් අය සමග යහපත් සම්බන්ධතාවයක් අපි කෙසේ පවත්වා ගනිමුද?

# අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය

''යාකොබ් රාබෙල් උදෙසා සත් අවුරුද්දක්
වැඩ කෙළේය; ඔහු ඈට ඇති ආදරය
නිසා ඒ සත් අවුරුද්ද ස්වල්ප දවසක්
මෙන් ඔහුට හැඟුනේය.''
(උත්පත්ති 29:20)

## 31 ප්‍රේම කිරීම කුමන අවස්ථාවේදීද? කෙසේද?

''අපව ප්‍රීතියෙන් තබන්නේ ප්‍රේමයයි. මාර්ගය සුමුදු කරන්නේ ප්‍රේමයයි. එමගින් සෑම දිනකම අන් අය ගැන සිතන්ටත්, කරුණාවන්ත වීමට අපට උපකාර කරයි.'' – F. E. Belden.

අපට ලෝකයේ හමුවන ප්‍රථම ප්‍රේමය වන්නේ මවගේ සහ පියාගේ ප්‍රේමයයි. ඉන්පසු අපට අපගේ ඥාතීන්ගේ සහ මිතුරන්ගේ ආදරය ලැබේ. පසුව අපි වැඩිහිටි භාවයට ඇතුල් වන විට ආදරය, එනම්, ගැහැණු ළමයෙක් පිරිමි ළමයෙකු වෙතත්, පිරිමි ළමයෙක් ගැහැණු ළමයෙක් වෙතත් වශී වන්නාවූ ආදරය අත් දකිමු. තරුණ, තරුණියෝ අනාගත නිවසක් ගොඩ නැගීමට තදින්ම සැලසුම් කරති. තරුණයෙක් විශේෂ තරුණියක් වෙත සිත් ගත් බැවින් ඇය තෝරා ගනියි. ඔවුහු විද්‍යාලයක අධ්‍යාපනය ලබන්නේ නම් එය අවසන් වූ පසු විවාහය බොහෝවිට සිදුවේ. මේ සියළු වර්ගයේම ප්‍රේමය ඉන්පසු පැමිණෙන්නට තිබෙන ප්‍රේමයට බලපායි.

දෙමවුපියෝ සාමාන්‍යයෙන් තම දරුවන් වැළඳගෙන හාදු දීම මගින් විනෝද වෙති. තවත් සමහරු ඥාතීන්ද වැළඳ ගනිති. හාදු දෙති. එහෙත් මිතුරෝ එසේ නොකරති. ස්වාමි පුරුෂයින් සහ භාර්යාවන් එකිනෙකා උණුසුම් ලෙස වැළඳගෙන මෘදු ලෙස හාදුවක් දිය යුතුය. එහෙත් තරුණ යුවලක් විවාහයට පෙර ආදරය ප්‍රකාශ කිරීම සීමාරහිත විය යුතුය.

අපි සෑම අයෙක්ම අපගේ දේවල් අප සතු කරගැනීමට කැමති වෙමු. පාලනය කළ හැකි අවස්ථාවේදී, වැඩෙහි යෙදීම, මුදල් ඉතිරි කිරීම, මිලදී ගැනීම වැනි දේවල් කළ යුතුය. එහෙත් ලෞකික දේවල් ගැන අප තුළ ඇති ආශාව පාලනය කළ නොහැකිවූ විට මිනිස්සු කාලකණ්ණි වෙති. ඔවුහු සොරු බවට පත් වෙති.

ප්‍රේමය සම්බන්ධයෙන්ද එය එසේමයි. ආශා ඇතිවීම සහ ඒවා පාලනය කරගැනීම යහපත්ය. සෞඛ්‍ය සම්පන්න ප්‍රේමය ඉතා අලංකාර, කරුණාවන්ත සහ පවිත්‍ර වන්නේය. ප්‍රේමය පාලනය කරගත නොහැකි වූ විට, ආශාව රජකරන අතර, අපි පාපයට වැටී සහ බලාපොරොත්තු සුන් කරගනිමු. පිවිතුරු ප්‍රේමය ප්‍රකාශ නොකර, ප්‍රේමය කරා හඹා යාම නිසා අපගේ ඥාති සම්බන්ධතාවය මිය යාමත් වියළී යාමත් සිදුවේ. අපගේ දුක් බර දින බොහෝ අවුරුදු ගණනාවක් මෙන් හැගෙයි.

# අවසාන කාලයේ පවුල් සඳහා නමස්කාරය

## FOR REFLECTION

Main Thought:

•There is a time for every season," says a great wise king. The word •wait" is at times painful but in God there is no waiting period because He–s always on time. He–s not bound by space and time like we are. When Martha and Mary thought Jesus was four-days late for Lazarus, He was still on time. He raised Lazarus from the grave on God–s schedule.

GUIDE QUESTIONS FOR DISCUSSION:

1. What virtues can we get from this devotional for love, courtship, and marriage?
2. Is hoarding a sin? Why?
3. How do you overcome the temptation to desire material things in excess?